පරිසර අමාත්‍යාංශය

சுற்றாடல் அமைச்சு

# Ministry of Environment



# 2024 ප්‍රගති වාර්තාව සහ 2025 ක්‍රියාත්මක සැලැස්ම

# 2024 முன்னேற்ற அறிக்கை மற்றும் 2025 செயல் திட்டம்

# 2024 Progress Report and Action Plan 2025

# 2024 ප්‍රගති වාර්තාව සහ 2025 ක්‍රියාත්මක සැලැස්ම

පරිසර අමාත්‍යාංශය

## පරිසර අමාත්‍යාංශය

වෛද්‍ය දම්මික පටබැඳි මැතිතුමා

පරිසර අමාත්‍ය

ඇන්ටන් ජයකොඩි මැතිතුමා

පරිසර නියෝජ්‍ය අමාත්‍ය

## අමාත්‍යාංශයේ ප්‍රධාන නිලධාරීන්

කේ. ආර්. උඩුවාවල මහතා
ලේකම්

පී කේ එස් සුභෝධිනි මෙය
අතිරේක ලේකම් - පාලන

එච් එම් බී වී හේරත් මහතා
අතිරේක ලේකම් - පාලන

ආර් එච් එම් පී අබේකෝන් මිය
අතිරේක ලේකම් - පරිසර ප්‍රතිපත්ති

එස් රණසිංහ මිය
අතිරේක ලේකම්- සංවර්ධන

ඩබ් ඩී එස් සී වැලිවත්ත මහතා
අතිරේක ලේකම් - ස්වභාවික සම්පත්

වයි ඩී එස් එස් මල්සිංහ මිය
අතිරේක ලේකම්- ව්‍යාපෘති

ඩබ්.ජී. කුමාරගම මිය
අතිරේක ලේකම් - පරිසර ව්‍යාපෘති හා අධ්‍යාපන

ඩබ් ඒ එච් විජේරත්න මිය
අධ්‍යක්ෂ ජනරාල් - ක්‍රමසම්පාදන

ආර් ඩී එස් ජයතුංග මහතා
අතිරේක ලේකම් - පරිසර සංවර්ධන

යූ පී එල් ඩී පතිරණ මිය
අධ්‍යක්ෂ ජනරාල් - විමර්ශන

පී මුදලිගේ මහතා
අධ්‍යක්ෂ ජනරාල් - ක්‍රමසම්පාදන

ඒ කේ පෙරේරා මහතා
ප්‍රධාන මූල්‍ය නිලධාරී

සුනේත්‍රා පතිරත්න මිය
ප්‍රධාන මූල්‍ය නිලධාරී

# අමාත්‍යාංශයට අයත් රාජ්‍ය හා ව්‍යවස්ථාපිත ආයතන

**වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමණාකරණ දෙපාර්තමේන්තුව**

- ආර් ඒ එස් රණවක මහතා, අධ්‍යක්ෂ ජනරාල්

**වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව**

- ඊ ඒ පී එන් එදිරිසිංහ මහතා, වන සංරක්ෂක ජනරාල්

**වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව**

- එම් ජී සී සූරියබණ්ඩාර මහතා, අධ්‍යක්ෂ ජනරාල්

**ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව**

- එම් එස් එල් ආර් පී මාරසිංහ මහතා, අධ්‍යක්ෂ ජනරාල්

**ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව**

- එච් සී පී ජයවීර මිය, අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ)

**මධ්‍යම පරිසර අධිකාරිය**

- තිලක් හේවාවසම් මහතා, සභාපති
- පී බි හේමන්ත මහතා, අධ්‍යක්ෂ ජනරාල්

**භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය**

- ජේ එම් එස් එන් ජයසිංහ මහතා, සභාපති
- එච් එම් ආර් ප්‍රේමසිරි මහතා, අධ්‍යක්ෂ ජනරාල්

**සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය**

- ඒ ජේ එම් ගුණසේකර මහතා, සාමාන්‍යාධිකාරී (වැ.බ)

**රාජ්‍ය දැව සංස්ථාව**

කේ පී එල් නිශාන්ත පටබැඳි මහතා - සභාපති

- එන් ඩී රුවන්පතිරණ මහතා, සාමාන්‍යාධිකාරී

**ජල සම්පත් මණ්ඩලය**

- ආර් එම් එස් බණ්ඩාර මහතා, සභාපති
- ටී එච් බී ඒ දේශප්‍රිය මහතා, සාමාන්‍යාධිකාරී (වැ.බ)

**සීමාසහිත GSMB තාක්ෂණික සේවා (පුද්ගලික) සමාගම**

- එච් ඩී එස් සී හේවාවිස්ස මහතා, ප්‍රධාන විධායක නිලධාරි

**ශ්‍රී ලංකා ක්ලයිමෙට් ෆන්ඩ් (ප්‍රයිවට්) ලිමිටඩ්**

- කේ එච් එම් එච් එච් අබේරත්න මිය, ප්‍රධාන විධායක නිලධාරි (වැ.බ)

# ගරු පරිසර අමාත්‍යතුමාගේ පණිවිඩය



මිනිස් ප්‍රජාව ප්‍රමුඛ සියලු ජීවීන්ගේ යහපැවැත්ම තහවුරු කරන මතු පරපුර උදෙසා තිරසාර පරිසරයක් නිර්මාණය කිරීමේ මඟපෙන්වන්නා සහ මෙහෙයවන්නා ලෙස කටයුතු කරන පරිසර අමාත්‍යාංශයේ "2024 ප්‍රගති වාර්තාව සහ 2025 වර්ෂයට අදාළ ක්‍රියාකාරී සැලසුම" පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන අවස්ථාවේ පණිවිඩයක් ඉදිරිපත් කිරීමට ලැබීම පිළිබඳව සතුටු වෙමි.

තිරසර සංවර්ධන රාමුවක් තුළ රටේ නිවැරදි පරිසර කළමනාකරණයක් සහතික කර ගැනීම මගින් ආර්ථික වශයෙන් සංවර්ධිත පරිසර හිතකාමී මානව සමාජයක් බිහි කිරීම අරමුණු කර ගනිමින් ජනතාවගේ සන්තුෂ්ටිය මුල් කරගත් සංවර්ධනයක් උදෙසා පුරෝගාමීව කටයුතු කිරීම පරිසර අමාත්‍යාංශයේ වගකීමක් වන අතර වර්තමානයේ පවතින ආර්ථික අභියෝග හමුවේ රටෙහි ආර්ථික වර්ධනය වැදගත් සේම, එය ලබා ගත යුත්තේ අපගේ සුවිශේෂී පරිසර පද්ධතිය පරදුවට තැබීමෙන් නොවන බව ද සිහිපත් කර ගත යුතු වේ.

"පොහොසත් රටක්- ලස්සන ජීවිතයක්" තේමාව කරගනිමින් ඉදිරි වර්ෂයන් හිදී ජාතික නිෂ්පාදන ආර්ථිකයක් ගොඩනැගීමේ ක්‍රියාවලියේ දී ශ්‍රී ලංකාවට මුහුණ පෑමට සිදුව ඇති ආර්ථික හා සමාජීය අර්බුදකාරී වාතාවරණය යටතේ වුවද ගෝලීය වශයෙන් ළඟාකර ගැනීමට බැඳී සිටින තිරසර සංවර්ධන ඉලක්කයන් මුදුන්පත් කර ගැනීම අපගේ අරමුණ වේ. එමෙන්ම ආචාරධර්මීය ප්‍රතිපත්ති වැඩි දියුණු කිරීමට වඩාත් පිරිසිදු භෞතික පරිසරයක් සහ සංස්කෘතික වශයෙන් පොහොසත් පුරවැසියෙක් සඳහා ආමන්ත්‍රණය කිරීම අරමුණු කර ගත් Clean Sri Lanka වැඩසටහන, දියුණු ශ්‍රී ලාංකේය ජාතියක් නිර්මාණය කිරීම සඳහා සෑම පුරවැසියෙකුටම එකමුතු වී ක්‍රියා කිරීමට ලැබී ඇති මහඟු අවස්ථාවක් වේ.

පරිසරය හා අදාළව අන්තර්ජාතික සම්මුතීන් හා පිලිගැනීම්වලට අනුගතව එම අරමුණු සාක්ෂාත් කරගැනීමට අවැසි ස්වභාවික සම්පත් සංරක්ෂණය හා තිරසාර භාවිතය සඳහා මඟපෙන්වන විවිධ ප්‍රතිපත්ති උපායමාර්ග හා ක්‍රියාකාරී සැලසුම් මෙම අමාත්‍යාංශය මගින් සකස් කර ඇති අතර, එම සැලසුම් තුළින් තවදුරටත් පරිසර පද්ධති මෙන්ම වන ජීවීන් ආරක්ෂා කර ගැනීම උදෙසා කටයුතු සිදු කරමින් පවතී. එපමණක් නොව "තිරසර ජෛව ලෝකයක් තුළින් සදාහරිත ජීවිතයක්" උරුම කර දීම උදෙසා ජල සම්පත සුරකිමින්, සාගරයේ තිරසාර පැවැත්ම තහවුරු කරන ක්‍රමවේද හඳුනා ගනිමින් හා සියලු පරිසර පද්ධති වල පවතින අන්තර් සම්බන්ධතාවයන් හඳුනා ගනිමින් සමාජ ආර්ථික සංවර්ධනය උදෙසා පාරිසරික යහපැවැත්ම තහවුරු කිරීමේ සාමූහික ක්‍රියාවලීන්ට අමාත්‍යාංශය අනුගත වෙමින් සිටී.

ආර්ථික සංවර්ධනය සහ පරිසරය අතර සමතුලිතතාවය රැකෙන පරිදි ස්වභාවික සම්පත් භාවිත කරමින් දැනුම, කුසලතා, ආකල්ප මගින් ගොඩනැගෙන නීරෝගී ජන සමාජයක් සහ සමතුලිත පරිසරයක් උදෙසා මතු පරපුරේ ද උරුමය වෙනුවෙන් පරිසරය සුරැකීම සියලු දෙනාගේ වගකීමකි.

මාගේ අමාත්‍යාංශයත්, ඊට අනුබද්ධිත ආයතනත්, සමස්ත ජනතාවට මෙන්ම ඉදිරි පරම්පරාවට ද තිරසරව ප්‍රතිලාභ ලැබෙන අයුරින් සියලු සංවර්ධන වැඩසටහන් සහ ව්‍යාපෘතීන් පරිසර හිතකාමීව මෙහෙය වීමටත්, නියාමනය කිරීමටත් අවශ්‍ය සියලුම පියවර ගනු ලබන අතර ඒ සඳහා සහයෝගය දක්වමින් කටයුතු කරන සමස්ත කාර්ය මණ්ඩලයට මාගේ ස්තුතිය පිරිනමමි.

**වෛද්‍ය දම්මික පටබැඳි (පා.ම.)**

**පරිසර අමාත්‍ය**

# ගරු පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමාගේ පණිවිඩය



පරිසර අමාත්‍යාංශයේ "2024 කාර්ය සාධන වාර්තාව සහ 2025 වර්ෂයට අදාල ක්‍රියාකාරී සැලැස්ම" ඉදිරිපත් කරමින් ශ්‍රී ලංකාවේ ස්වභාවික උරුමයන් ආරක්ෂා කිරීම සහ තිරසර සංවර්ධනය ඉදිරියට ගෙන යාම වෙනුවෙන් පරිසර නියෝජ්‍ය අමාත්‍යවරයා ලෙස මෙම පණිවිඩය ඉදිරිපත් කරනුයේ ඉතාම සතුටිනි.

ශ්‍රී ලංකාවේ පරිසරය සුරැකීමේ සහ අපගේ අනාගත පරපුරේ ප්‍රයෝජනය සඳහා තිරසර සංවර්ධනයක් ප්‍රවර්ධනය කිරීමේ අත්‍යවශ්‍ය කාර්යය අඛණ්ඩව, වඩාත් ඵලදායි ලෙස ඉටුකිරීම සඳහා සියලු දෙනාගේ කැපවීම ඉතා වැදගත් වේ.

ශ්‍රී ලංකාව එහි පොහොසත් ජෛව විවිධත්වය සහ අද්විතීය පරිසර පද්ධති සමඟ ගෝලීය පාරිසරික භූ දර්ශනයේ වැදගත් ස්ථානයක් ගනී. එහෙත්, දේශගුණික විපර්යාස සහ වන විනාශයේ සිට පරිසර දූෂණය සහ වාසස්ථාන අහිමි වීම දක්වා අප මුහුණ දෙන පාරිසරික අභියෝග පිළිබඳව ද අප දැඩි ලෙස දනිමු. මෙම අභියෝග ජය ගැනීම සඳහා අධිෂ්ඨානශීලි ක්‍රියාමාර්ග අවශ්‍ය වේ. වඳවීමේ තර්ජනයට ලක්ව ඇති ජීවී විශේෂ සහ වාසස්ථාන ආරක්ෂා කිරීම සඳහා සංරක්ෂණ මූලාරම්භයන් ශක්තිමත් කිරීම මෙන්ම අපගේ කාබන් පියසටහන අඩු කිරීමට සහ බලශක්ති තිරසර බව වැඩි කිරීම, පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති ප්‍රවර්ධනය කිරීම හා අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම සඳහා අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, ප්‍රතිචක්‍රීකරණය සහ නැවත භාවිත කිරීමේ සංස්කෘතියක් ඇති කිරීම තුලින් පිරිසිදු ශ්‍රී ලංකාවක් ගොඩනැංවීම අපේ අරමුණ විය යුතුය. එම අරමුණ ජය ගැනීම සඳහා පරිසර අමාත්‍යාංශය කැප වී සිටී.

එමෙන්ම පාරිසරික හිතකාමී පිළිවෙත් අනුගමනය කිරීමෙන්, සංරක්ෂණ ක්‍රියාකාරකම් වලට සක්‍රියව සහභාගී වීමෙන් හෝ පාරිසරික සෞඛ්‍යයට ප්‍රමුඛත්වය දෙන ප්‍රතිපත්ති වෙනුවෙන් පෙනී සිටීමෙන් අප සෑම කෙනෙකුටම ඉටු කිරීමට කාර්යභාරයක් ඇත. පරිසර අමාත්‍යාංශය ගැටළු වලට තිරසර විසඳුම් සෙවීමේ ප්‍රයත්නයන්වල පෙරමුණ ගෙන සිටිම සතුටට කරුණකි.

අනාගතයේදී තිරසර කර්මාන්ත සඳහා සහාය වීම පිණිස හරිත මූල පිරීම් පුළුල් කරමින්, දේශගුණික බලපෑම් වලට ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කරමින්, සම්පත් සහ විශේෂඥතාව බලමුලු ගැන්වීම සඳහා ජාත්‍යන්තර හවුල්කාරිත්වයන් තවදුරටත් ශක්තිමත් කරමින් "පොහොසත් රටක් ලස්සන ජීවිතයක්" උදාකරලීමේ කර්තව්‍ය සඳහා එක්ව කටයුතු කිරීම වැදගත් වේ.

ඒ අනුව පාරිසරික භාරකාරත්වය සඳහා, හරිත තිරසර ශ්‍රී ලංකාවක් කරා යන මාවත සකස් කිරීම සඳහා නොසැලෙන කැපවීම වෙනුවෙන් අමාත්‍යාංශයේ කාර්යය මණ්ඩලයට හා පාර්ශ්වකරුවන්ට මාගේ හදපිරි කෘතඥතාව පුද කරමි.

**ඇන්ටන් ජයකොඩි (පා.ම.)**

**පරිසර නියෝජ්‍ය අමාත්‍ය**

## පරිසර අමාත්‍යාංශ ලේකම්තුමාගේ පණිවිඩය



පරිසර අමාත්‍යාංශය විසින් සම්පාදිත “2024 ප්‍රගති වාර්තාව හා 2025 ක්‍රියාකාරී සැලැස්ම” මඟින් 2024 වර්ෂය සඳහා අමාත්‍යාංශයේ මෙහෙයවීම යටතේ අමාත්‍යාංශයේ ස්ථාපිත අංශ හා ආයතන මඟින් මෙරට තිරසර සංවර්ධනය උදෙසා පරිසරය ආරක්ෂණය හා සංරක්ෂණය පෙරදැරිව 2024 දෙසැම්බර් මාසය දක්වා ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් හා ව්‍යාපෘතිවල ප්‍රගතිය සහ 2025 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම ඉදිරිපත් කර ඇත. ඒ සඳහා, එහි ලේකම්වරයා වශයෙන් මෙම පණිවිඩය නිකුත් කරනු ලබනුයේ හද පිරි සතුටිනි.

මේවන විට ගෝලීය අවධානය දේශගුණික විපර්යාසවල අහිතකර බලපෑම් කෙරෙහි යොමු වී තිබෙන අතර හරිතාගාර වායු විමෝචනය අවම රාජ්‍යයන්ට ගැනෙන රටක් ලෙස අප රට පැවතිය ද, දේශගුණික විපර්යාස මගින් රටෙහි ආර්ථිකය මත ඇතිකරන බලපෑම සුළුපටු නොවේ. මේ වන විටත්, 2050 වර්ෂය වන විට ශ්‍රී ලංකාව කාබන් වලින් නිදහස් රටක් බවට පත් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමටත් ඒ සඳහා මඟපෙන්වන්නා ලෙසත් පරිසර අමාත්‍යාංශය ක්‍රියාත්මක වෙමින් සිටී.

සුවදායි දෙරණක් ඇති කිරීම උදෙසා 2030 වන විට මෙරට භූමි හායනය අවම කිරීම සඳහා ඉලක්ක සැකසීමේ ක්‍රියාවලිය එක්සත් ජාතින්ගේ කාන්තාරීකරණය පිටු දැකීමේ සම්මුතියේ ආධාර ඇතිව පරිසර අමාත්‍යාංශය විසින් ක්‍රියාවට නංවා ඇති අතර මෙරට වන වැස්ම 29% සිට 32% දක්වා වැඩි කිරීම උදෙසා වැඩසටහන් රැසක් ක්‍රියාත්මක වේ. එමෙන්ම දේශගුණ විපර්යාස, ජෛවවිවිධත්ව හායනය හා පරිසර දූෂණය යන අභියෝග හමුවේ අනාගත පරපුරේ තිරසර පැවැත්ම සහතික කිරීම සඳහා අමාත්‍යාංශය මඟින් ව්‍යාපෘති රැසක් ක්‍රියාවට නංවා ඇත.

දේශගුණික විපර්යාස හරහා පැමිණෙන අභියෝග ජය ගැනීම සඳහා වැඩසටහන්, ජෛවවිවිධත්ව සංරක්ෂණ වැඩසටහන්, වායු සම්පත් කළමනාකරණ වැඩසටහන්, අපද්‍රව්‍ය කළමනාකරණ, පරිසර දූෂණ පාලන හා නියාමන කටයුතු, රසායනික ද්‍රව්‍ය කළමනාකරණ කටයුතු හා භූමි සම්පත් කළමනාකරණ කටයුතු සිදු කර ඇත. මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී අවශ්‍ය මූල්‍ය හා තාක්ෂණික දායකත්වය දේශිය හා විදේශිය ආයතන රැසකින් ලබා ගැනීමට හැකි වීමද අප අමාත්‍යාංශය ලද සුවිශේෂී ජයග්‍රහණයකි.

පරිසර විෂය භාර නව අමාත්‍යවරුන්ගේ මඟ පෙන්වීම යටතේ නීති සහ අණ පනත් වලට මෙන්ම ජාත්‍යන්තර පරිසර සම්මුතීන්වලටද අනුකූලව පරිසර විෂයට අදාලව ප්‍රතිපත්ති සම්පාදනය කරමින් මෙම අමාත්‍යාංශය යටතේ ඇති අංශ සහ ව්‍යවස්ථාපිත ආයතන මඟින් පරිසර සංරක්ෂණය හා මනා කළමනාකරණය සඳහා අදාල බලගැන්වීම සිදු කරනු ඇත. එමෙන්ම අනෙකුත් අමාත්‍යාංශ, රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතන සමඟ එක්ව ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධනය සඳහා අවශ්‍ය කටයුතු ආරම්භ කර ඇති අතර 2025 වර්ෂයේ මෙම අමාත්‍යාංශයට අදාල වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා සියලුම පාර්ශවකරුවන්ගේ සහය තව දුරටත් අපේක්ෂා කරමි.

**කේ. ආර්. උඩුවාවල**
**ලේකම්**
**පරිසර අමාත්‍යාංශය**

| | | පටුන | පිටු අංක |
|---|---|---|---|
| **1.** | | **1 පරිච්ඡේදය** | 01 |
| | 1.1 | හැඳින්වීම | 01 |
| | 1.2 | අමාත්‍යාංශයේ දැක්ම හා මෙහෙවර | 02 |
| | 1.3 | ප්‍රධාන කාර්යයන් | 03 |
| | 1.4 | සංවිධාන සටහන | 04 |
| **2.** | | **2 පරිච්ඡේදය - ප්‍රගතිය** | 06 |
| | 2.1 | පරිසර අමාත්‍යාංශයේ එක් එක් අංශ මගින් ක්‍රියාත්මක කරන වැඩසටහන්වල ප්‍රගතිය | 06 |
| | 2.1.1 | පාරිසරික ප්‍රතිපත්ති විශ්ලේෂණය හා ක්‍රියාකාරී සැලසුම් | 06 |
| | 2.1.2 | ශ්‍රී ලංකාවේ ජෛවවිවිධත්ව සංරක්ෂණය | 07 |
| | 2.1.3 | දේශගුණික විපර්යාස අභියෝග ජයගැනීම | 07 |
| | 2.1.4 | වායු සම්පත් කළමනාකරණය | 08 |
| | 2.1.5 | පරිසර සැලසුම් හා ආර්ථික | 09 |
| | 2.1.6 | පරිසර දූෂණ පාලන හා රසායන ද්‍රව්‍ය කළමනාකරණය | 11 |
| | 2.1.7 | ස්වභාවික සම්පත් සංරක්ෂණය | 12 |
| | 2.1.8 | පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීම් | 12 |
| | 2.1.9 | අන්තර්ජාතික පාරිසරික සබඳතා | 14 |
| | 2.1.10 | පාරිසරික දින සැමරීම | 15 |
| | 2.1.11 | ආයතනික කටයුතු | 16 |
| | 2.1.12 | මානව සම්පත් සංවර්ධන | 17 |
| | 2.1.13 | අභ්‍යන්තර විගණන | 17 |
| | 2.1.14 | පරිසර ගැටළු පිළිබඳ මහජන පැමිණිලි, අභියාචනා හා මාධ්‍ය වාර්තා | 17 |
| | 2.1.15 | නෛතික කටයුතු | 17 |
| | 2.2 | අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති වල ප්‍රගතිය | 18 |
| | 2.2.1 | එක්ව කළමනාකරණය කිරීම: වන විද්‍යාව, කෘෂිකර්මාන්තය සහ සංචාරක අංශ වෙත ප්‍රජාව කේන්ද්‍ර කරගත් පරිසර පද්ධති මත පදනම් වූ ප්‍රවේශයන් ඒකාබද්ධ කිරීම | 18 |
| | 2.2.2 | එක්සත් ජාතීන්ගේ කාන්තාරකරණය වැළැක්වීමේ සම්මුතියේ අධීක්ෂණය හා වාර්තාකරණය වැඩිදියුණු කිරීමට යොමු කිරීම සඳහා පාර්ශවකාර ආයතන හා වෘත්තිකයන්ගේ ධාරිතා සංවර්ධනය සඳහා වූ ව්‍යාපෘතිය (UNCCD) - ගෝලීය පරිසර පහසුකම - 7 -Umbrella IV | 19 |
| | 2.2.3 | ශ්‍රී ලංකාව තුල මොන්ට්‍රියල් සන්ධානයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම | 19 |
| | 2.2.4 | සමුද්‍රීය අපද්‍රව්‍ය සහ ක්ෂුද්‍ර ප්ලාස්ටික්: ප්ලාස්ටික් අපද්‍රව්‍ය පරිසර හිතකාමී ලෙස කළමනාකරණය කිරීම ප්‍රවර්ධනය කිරීම සහ ප්ලාස්ටික් අපද්‍රව්‍ය ජනනය වැළැක්වීම සහ අවම කිරීම | 20 |
| | 2.2.5 | මිනමාටා සම්මුතියට අයත් විශේෂිත ජාත්‍යන්තර වැඩසටහන යටතේ ක්‍රියාත්මක රසදිය අඩංගු හා රසදිය මිශ්‍ර වූ අපද්‍රව්‍ය අවම කිරීම සඳහා ජාතික ධාරිතා වර්ධන ව්‍යාපෘතිය | 21 |
| | 2.2.6 | කෘෂිකර්ම, වනාන්තර හා වෙනත් ඉඩම් පරිහරණ ක්ෂේත්‍ර සඳහා විනිවිදභාවය වැඩිදියුණු කළ රාමුවක් සකස් කිරීමේ ව්‍යාපෘතිය | 22 |
| | 2.2.7 | සුවදායි භූමිදර්ශ ව්‍යාපෘතිය | 23 |

| | | පිටු අංක |
|---|---|---|
| 2.3 | අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ආයතනවල ප්‍රගතිය | 24 |
| 2.3.1 | මධ්‍යම පරිසර අධිකාරිය | 24 |
| 2.3.2 | භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය | 27 |
| 2.3.3 | ජී එස් එම් බී ටෙක්නිකල් සර්විසස් (පුද්) සමාගම | 31 |
| 2.3.4 | ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (ප්‍රයිවට්) ලිමිටඩ් | 34 |
| 2.3.5 | මූල්‍ය ප්‍රගතිය | 37 |
| 2.4 | නාගරික සංවර්ධන සහ නිවාස අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වූ ආයතන වල ප්‍රගතිය | 38 |
| 2.4.1 | වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමණාකරණ දෙපාර්තමේන්තුව | 39 |
| 2.4.2 | සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය | 42 |
| 2.5 | සංචාරක අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වූ  ආයතනවල ප්‍රගතිය | 47 |
| 2.5.1 | ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව | 48 |
| 2.6 | ජල සම්පාදන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වූ  ආයතනවල ප්‍රගතිය | 53 |
| 2.6.1 | ජල සම්පත් මණ්ඩලය | 54 |
| 2.7 | වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වූ ආයතන වල ප්‍රගතිය | 57 |
| 2.7.1 | වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අංශය | 58 |
| 2.7.2 | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව | 63 |
| 2.7.3 | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව | 67 |
| 2.7.4 | ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව | 74 |
| 2.7.5 | රාජ්‍ය දැව සංස්ථාව | 79 |
| **3** | **3 පරිච්ඡේදය** | 82 |
| | ක්‍රියාකාරී සැලැස්ම 2025 | 82 |

# 01 පරිච්ඡේදය

## 1.1 හැඳින්වීම

අතිගරු ජනාධිපතිතුමා විසින් නිකුත් කරන ලද අංක 2412/08 දරණ 2024.11.25 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය අනුව "පරිසර අමාත්‍යාංශය" පිහිටුවන ලදි. ඒ අනුව පරිසර විෂය හා සම්බන්ධ ආයතන පරිසර අමාත්‍යාංශය යටතට ගැනුණු අතර, මෙම අමාත්‍යාංශයට වනාන්තර, වනසතුන්, හා තුරුලතා සංරක්ෂණය කරමින්, තිරසාර පරිසර සංකල්පයෙහි වැදගත්කම පිළිබඳව ජනතාව තුල ආකල්පමය වර්ධනයක් ඇති කිරීම මෙන්ම, වගුරු බිම් හා කඩොලාන අරක්ෂා කිරීම, වන සනත්වය සුරක්ෂිත කිරීම හා වන ආවරණය පුළුල් කිරීම, පරිසර දූෂණය වැලැක්වීම හා නවීන කළමනාකරණ හා තාක්ෂණය යොදා ගනිමින් පරිසර වෙනස්කම් සහ කාබන් භාවිතය අවම ආර්ථිකයක් සහිත තිරසාර සංවර්ධනයකට ගැලපෙන පරිදි පරිසර ප්‍රතිපත්ති හා නීති සම්පාදනය, උපායමාර්ග ක්‍රියාත්මක කිරීම සහ ආයතනවලට අදාළ කටයුතු සිදු කිරීමේ කාර්යයන් පවරා ඇත. වර්තමානය වන විට වෛද්‍ය දම්මික පටබැඳි මහතා මහතා විසින් පරිසර අමාත්‍ය ධූරය හොඹවන අතර ඇන්ටන් ජයකොඩි මහතා විසින් නියෝජ්‍ය අමාත්‍ය ධූරය හොඹවනු ඇත.

රාජ්‍ය ප්‍රතිපත්ති හා අනෙකුත් ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා "තිරසර පරිසරයක්" නිර්මාණය කිරීම සඳහා නීති සහ අණපනත්වලට අනුකූලව පරිසර විෂයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම යන ප්‍රමුඛ කාර්යයන් සඳහා පරිසර අමාත්‍යාංශය නායකත්වය සැපයීම සිදු කරනු ලබයි.

මේ වන විට ශ්‍රී ලංකා ආර්ථිකයට සිදුව ඇති පීඩාකාරී තත්ත්වය හේතුවෙන් ආර්ථික, සමාජීය, දේශපාලන ව්‍යුහයේ බොහෝ වෙනස්කම් රැසකට මුහුණ දී ඇති අතර එය පාරිසරික වෙනස්කම් රැසකට ද බලපා ඇත. එබැවින් පරිසරයට සිදු වන බලපෑම් අවම කර ගනිමින් සීඝ්‍ර ආර්ථික ප්‍රවණතා සහ ස්වභාවික සම්පත් භාවිතය සම්බන්ධව සමබරතාව පවත්වාගෙන යමින් රටෙහි පරිසරය හා ස්වභාවික සම්පත් කළමණාකරනය සඳහා පරිසර අමාත්‍යාංශ හා අනුබද්ධිත ආයතන ප්‍රමුඛව සමස්ත රාජ්‍ය යාන්ත්‍රනයේ ආයතනික, නෛතින හා තාක්ෂණික රාමුව ගොඩනැංවීම සඳහා විෂයභාර ඇමතිතුමාගේ උපදෙස් හා නායකත්වය යටතේ ක්‍රියාත්මක කෙරේ.



ඒ සඳහා වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමණාකරණ දෙපාර්තමේන්තුව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව, ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව, මධ්‍යම පරිසර අධිකාරිය, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය, සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය, රාජ්‍ය දැව සංස්ථාව, ජල සම්පත් මණ්ඩලය, සීමාසහිත GSMB තාක්ෂණික සේවා (පුද්ගලික) සමාගම හා ශ්‍රී ලංකා ක්ලයිමෙට් ෆන්ඩ් (ප්‍රයිවට්) ලිමිටඩ් යන ආයතන සමග පරිසර අමාත්‍යාංශය රටෙහි ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය වේගවත් වීමත්, ජනතාවගේ ජීවන ක්‍රමය වෙනස්වීමත්, හේතුවෙන් පරිසරයට ඇතිවන බලපෑම් අවම කිරීම සඳහා සමස්ත රාජ්‍ය යාන්ත්‍රණයේම ආයතනික, නෛතික හා තාක්ෂණික රාමුව ශක්තිමත් කරමින් ජනතාවගේ ජීවන තත්ත්වය තිරසරව හා සකසුරුවම්ව ගොඩනැංවීම සඳහා සුවිශේෂී කාර්යයක් ඉටු කිරීම සඳහා බැඳී සිටිනු ඇත.

මෙම වාර්තාව මගින් පරිසර අමාත්‍යාංශයේ නව විෂය පථය යටතේ ක්‍රියාත්මක ආයතන අමාත්‍යාංශයේ සියළු අංශ හා ව්‍යාපෘති මගින් 2024 වර්ෂයේ සිදු කරන ලද සංවර්ධන හා සංරක්ෂණ කාර්යය පිළිබඳ ප්‍රගතිය හා 2025 වර්ෂයට අදාල ක්‍රියාකාරී සැලැස්මේ තොරතුරු ඉදිරිපත් කිරීමට අපේක්ෂා කෙරේ.

## 1.2 ආයතනයේ දැක්ම හා මෙහෙවර

**අමාත්‍යාංශයේ දැක්ම**

**"තිරසර පරිසරයක් උරුම සංවර්ධිත ශ්‍රී ලංකාවක්"**

**අමාත්‍යාංශයේ මෙහෙවර**

පරිසර කළමනාකරණය පිළිබඳ ජාතික වැඩසටහන් ක්‍රියාවට නංවමින්, වනජීවී සංරක්ෂණය, ස්ථානීය වන සංරක්ෂණය, ශාක හා සත්ත්ව විශේෂ පරිබාහිර සංරක්ෂණය, වෙරළ සංරක්ෂණය හා කළමනාකරණය, සමුද්‍රීය පරිසර දූෂණ පාලනය, භූමි සම්පත් කළමනාකරණය, භූ ජල සම්පත් කළමනාකරණය, තිරසර දැව කර්මාන්තය ප්‍රවර්ධනය, කාබන් උදාසීනත්වය ලගාකරගැනීමට දායකත්වය ලබාදීම මෙන්ම දේශගුණ විපර්යාස හා පරිසර සංරක්ෂණය පිළිබඳ ජාත්‍යාන්තර බැඳීම් තහවුරු කරමින් ස්වභාවික සම්පත් සංරක්ෂණය සහ තිරසර භාවිතය සඳහා නායකත්වය ලබාදීම.

## 1.3 පරිසර අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයන්:

- පරිසර සංරක්ෂණය හා කළමනාකරණ පිළිබඳ ප්‍රතිපත්ති සහ සැලසුම් සම්පාදනය කිරීමට අදාළ පාර්ශ්වකරුවන්ට දැනුම් දීම සහ ක්‍රියාත්මක කිරීම තහවුරු කිරීම.
- ස්වභාවික සම්පත් (ජෛවවිවිධත්ව, ජලය, වාතය, පස හා ඛණිජ ආදී) තිරසර කළමනාකරණයත්, දේශගුණික බලපෑම් හා පරිසර දූෂණය අවම කර ගනිමින් ශ්‍රී ලංකාවේ සංවර්ධන ඉලකක් ලගාකර ගැනීමත්, සඳහා ක්‍රමවේදයන් සකස් කර ක්‍රියාත්මක කිරීම.
- පාරිසරික වෙනස්කම් සහ කාබන් අවම ආර්ථිකයක් සහිත තිරසර සංවර්ධනයක් ඇති කිරීම සඳහා ප්‍රතිපත්ති හා නීති සම්පාදනය කරමින් උපායමාර්ග ක්‍රියාත්මක කිරීම.
- තිරසර පරිසර සංකල්පයෙහි ඇති වැදගත්කම පිළිබඳව මෙන්ම වෙනත් ප්‍රධාන පාරිසරික ක්‍රියාදාමයන් පිළිබඳව ජාතික මට්ටමෙන් ජනතාව දැනුවත් කිරීම.
- ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කිරීමේ දී පරිසරයට සිදුවන බලපෑම් පිළිබඳ පර්යේෂණ පැවැත්වීම, එම තොරතුරු විශ්ලේෂණය කිරීම සහ එම තොරතුරු මහජනතාව ඇතුළු අදාළ අංශ වලට යොමු කිරීම.
- වගුරු බිම්, කඩොලාන පරිසර පද්ධති, වනාන්තර, වනසතුන්, තුරුලතා ආරක්ෂා කිරීම හා සංරක්ෂණය මඟින් යහපත් වූ පරිසර කළමනාකරණයක් සඳහා නවීන කළමනාකරණ ක්‍රම හා තාක්ෂණ යොදා ගනිමින් රාජ්‍ය රාජ්‍ය නොවන අංශවල හා මහජනතාවගේ කැපවීම සඳහා සුදුසු පරිසරයක් නිර්මාණය කිරීම.
- නිවාස, දේපල, වගාවන් සඳහා වන සතුන්ගෙන් වන හානිය අවම කර ගැනීමත්, වන අලි - මිනිස් ගැටුම් වැලැක්වෙන පරිදි ගම්මාන හා ජනාවාස ආරක්ෂාව සඳහා ග්‍රාමීය ප්‍රජා දායකත්වයෙන් යුතු ඒකාබද්ධ ක්‍රමවේදයක් සකස් කර ක්‍රියාත්මක කිරීම.
- පරිසර හා ස්වභාවික සම්පත් ක්ෂේත්‍රයට අදාළ පසු විපරම් කිරීමේ ක්‍රමවේදයන් සැකසීම හා පසු විපරමෙන් ලැබෙන තොරතුරු මත පරිසර කළමනාකරණය සඳහා සුදුසු ක්‍රමෝපායයන් යෙදීම.
- වර්තමානය සහ අනාගත පරපුර උදෙසා ශ්‍රී ලංකාව විසින් අත්සන් තබා ඇති බහු පාර්ශ්වික පාරිසරික සම්මුතීන්ට අනුකූලව ශ්‍රී ලංකාව විසින් ඉටුකළ යුතු ජාත්‍යන්තර බැඳීම් ඉටු කිරීම තහවුරු කිරීම හා තවදුරටත් ජාත්‍යන්තර සහයෝගිතාව වර්ධනය කිරීමට පියවර ගැනීම.

## 1.4 අමාත්‍යාංශයේ සංවිධාන සටහන - පරිසර අමාත්‍යාංශය

**පරිසර**



## වනජීවී වන සම්පත්




#2020/08/01 දිනැති අංක 20/0010/227 දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව, එය දරන්නාට පෞද්ගලිකව සහ තනතුරේ වරප්‍රසාදවලට බලපෑමක් නොවන පරිදි අනුමත කර ඇති අතර, විශ්‍රාම යාමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ පිටව යාමෙන් එම තනතුර අහෝසි වනු ඇත. වෙනත් ඕනෑම හේතුවක්.

# 02 පරිච්ඡේදය – ප්‍රගතිය

## 2.1 පරිසර අමාත්‍යාංශයේ අංශ මගින් සිදු කරන ලද වැඩසටහන්වල ප්‍රගතිය

### 2.1.1 පාරිසරික ප්‍රතිපත්ති විශ්ලේෂණය හා ක්‍රියාකාරී සැලසුම්

**හරිත ප්‍රසම්පාදනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය**

පාරිභෝගික හැසිරීම වෙනස් කිරීම තුලින් සම්පත් කාර්යක්ෂමතාව ඉහල නැංවීම, පරිසරය හා මානව සුභසාදනය සඳහා වන නිශේධාත්මක බලපෑම් අවම කිරීම සහ තිරසාර සංවර්ධනය සඳහා සහය වීම උදෙසා පරිසර හිතකාමී ප්‍රසම්පාදන ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගනිමින් ජාතික හරිත ප්‍රසම්පාදන ප්‍රතිපත්තිය 2024 මුදල් අමාත්‍යාංශය සහ ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව ඇතුළු ප්‍රධාන පාර්ශ්වකරුවන් සමඟ සහයෝගයෙන් පරිසර අමාත්‍යාංශය විසින් ලෝක පරිසර දිනයට සමගාමීව එළිදක්වන ලදී.




**ජාතික දේශගුණික විපර්යාස ප්‍රතිපත්තිය**

ශ්‍රී ලංකාවේ නැගී එන දේශගුණික අවදානම්, වෙනස් වන ජාතික ප්‍රමුඛතා, නව ගෝලීය වර්ධනයන් සහ දේශගුණය ආශ්‍රිත වැඩසටහන්, යාන්ත්‍රණ සහ ප්‍රතිලාභ හේතු කොටගෙන 2012 වසරේ දී සම්පාදනය කරන ලද ජාතික දේශගුණික විපර්යාස ප්‍රතිපත්තිය පරිසර අමාත්‍යාංශය විසින් යාවත්කාලීන කර ඇත. ඒ අනුව, ප්‍රතිපත්ති විශ්ලේෂණ වාර්තාව සහ දේශගුණික විපර්යාස පිළිබඳ ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රතිපත්තියේ පළමු කෙටුම්පත සකස් කරන ලද අතර මේ වන විට ජාතික ප්‍රතිපත්තිය කැබිනට් අනුමැතියෙන් පසුව එළිදක්වන ලදී .

**ශ්‍රී ලංකාවේ 2050 කාබන් ශුද්ධ ශුන්‍ය මාර්ග සිතියම සහ උපායමාර්ගික සැලසුම**

කාබන් ශුද්ධ ශුන්‍ය 2050 මාර්ග සිතියම සහ උපායමාර්ගික සැලැස්ම ඩුබායි හි CoP28 සමුළුවේ දී එළි දක්වන ලදී. කාබන් විමෝචනය අවම කිරීම සඳහා වගකිවයුතු අංශ වලට අදාල අමාත්‍යාංශවල කාබන් ශුද්ධ ශුන්‍ය ලේකම් කාර්යාල පිහිටවීම සඳහා සම්බන්ධීකරණ නිලධාරීන් හඳුනා ගන්නා ලද අතර මෙම අමාත්‍යාංශයේ දේශගුණික විපර්යාස ලේකම් කාර්යාලය සහ පොදුරාජ්‍ය මණ්ඩලීය ලේකම් කාර්යාලයේ සහයෝගීතාවයෙන් ශ්‍රී ලංකාවේ කාබන් ශුද්ධ ශුන්‍ය 2050 මාර්ග සිතියම සහ උපායමාර්ගික සැලැස්ම සඳහා තාක්ෂණික සැසියක් අසර්බයිජාන්, බකු හි CoP29 සමුළුවේ දී සිදු කරන ලදී.




**තිරසාර නයිට්‍රජන් කළමනාකරණය පිළිබඳ ක්‍රියාකාරී සැලසුම සකස් කිරීම**

2030 වන විට ශ්‍රී ලංකාවේ නයිට්‍රජන් නාස්තිය අඩකින් පමණ අඩු කිරීමේ අරමුණ ඇතිව පරිසර අමාත්‍යාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය සමඟ එක්ව ප්‍රතිපත්ති සම්පාදකයින්, විද්වතුන්, සිවිල් පරිපාලන නිලධාරීන්, සංවර්ධන වෘත්තිකයන්, ක්‍රියාකාරීන් සහ අනෙකුත් සියලුම උනන්දුවක් දක්වන පාර්ශ්වකරුවන්ගේ සහභාගිත්වයෙන් තිරසර නයිට්‍රජන් කළමනාකරණය පිළිබඳ ක්‍රියාකාරී සැලසුම සකස් කිරීම සම්බන්ධයෙන් අදාල පාර්ශවකාර ආයතන සමග එක්ව කෙටුම්පත් කර ඇත .

**ශ්‍රී ලංකාවේ විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය**

මෙම ප්‍රතිපත්තියෙහි ප්‍රධාන අරමුණ වනුයේ ජාතික, පළාත් සහ ප්‍රාදේශීය මට්ටම්වල පාරිසරික ගැටළු අවම කිරීම සඳහා විද්‍යුත් අපද්‍රව්‍ය කළමනාකරණය කිරීමට මගපෙන්වීමයි. ශ්‍රී ලංකාවෙහි විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය අවසන් සමාලෝචනය සිදුකර එය සිංහල හා දෙමළ භාෂාවන් වලට පරිවර්තනය කර ඇති අතර මුද්‍රණය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

## 2.1.2 ශ්‍රී ලංකාවේ ජෛවවිවිධත්ව සංරක්ෂණය

ශ්‍රී ලංකාවේ ආක්‍රමණික ආගන්තුක ජීවී විශේෂ සම්බන්ධයෙන් පවතින වර්තමාන ගැටළු පිළිබඳව හා ආක්‍රමණික ආගන්තුක ශාක හා සත්ව ජීවී විශේෂ තක්සේරු ප්‍රමුඛතාගත කිරීම පිළිබඳව විශේෂඥ කණ්ඩායම් රැස්වීමක් ලයිට් හවුස් ගැලේහිදී පවත්වන ලදී.

මීට අමතරව ආක්‍රමණික ආගන්තුක ජීවී විශේෂ පිළිබඳ වූ ඒකක කළමනාකරුවන්ගේ රැස්වීමක් පරිසර අමාත්‍යාංශයේදී පවත්වනු ලැබිය. මෙහි අරමුණු වූයේ ආක්‍රමණික ආගන්තුක ජීවීන් සම්බන්ධයෙන් පළාත් මට්ටමින් පවතින වර්තමාන තත්ත්වය පිළිබඳව විමසීම හා ඒ පිළිබඳව අත්දැකීම් හුවමාරු කර ගැනීම වේ.

අන්තර්ජාතික පරිසර දිනයට සමගාමීව ජෛවවිවිධත්ව සංරක්ෂණය අරමුණු කර ගනිමින් අනුරාධපුර දිස්ත්‍රික්කයේ තන්තිරිමලේ රජමහා විහාරයේ දහම් පාසැල් දරු දැරියන් 130 ට පමණ බුදු දහමෙන් සුරුකෙන ජෛවවිවිධත්වය මැයෙන් දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී. මෙයට අමතරව එදින එම විහාරස්ථානයේ අටවිසි බෝධීන් වහන්සේලා රෝපණය කිරීමේ වැඩසටහනක් ද පවත්වන ලදී.

නිල කාබන් පරිසර පද්ධති ප්‍රතිෂ්ඨාපනය, සංරක්ෂණය හා තිරසර භාවිතය පිළිබඳව දෙදින පුහුණු වැඩමුළුවක් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ අදාළ පාර්ශ්වකාර ආයතන නිළධාරීන් 60 දෙනෙකු සඳහා ත්‍රිකුණාමලය සර්වෝදය මධ්‍යස්ථානයේදී පවත්වන ලද අතර ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ නිල කාබන් පරිසර පද්ධති හඳුනා ගැනීම සඳහා ක්ෂේත්‍ර අධ්‍යයනයක් සාම්පලතිව් ප්‍රදේශයේදී සිදු කරන ලදී.



නිල කාබන් පරිසර පද්ධති හඳුනා ගැනීම -සාම්පලතිව්

ජාතික ආක්‍රමණශීලී ජීවී විශේෂ පිළිබඳ විශේෂඥ කමිටු රැස්වීම පරිසර අමාත්‍යාංශයේදී පවත්වන ලද අතර මෙම සාකච්ඡාවේදී ආගන්තුක ආක්‍රමණශීලී ජීවී විශේෂ සම්බන්ධයෙන් වන අවදානම් තක්සේරු ඇගයීම්, ප්‍රොටකෝලයන් යාවත්කාලීන කිරීම හා ශ්‍රී ලංකාවේ අළුතින් වාර්තාවන නව ජීවී විශේෂ සම්බන්ධයෙන් ගතයුතු ක්‍රියාමාර්ග හා අළුතින් හඳුනාගත් නව ජීවී විශේෂ සඳහා වන මාර්ගෝපදේශයන් පිළිබඳව සාකච්ඡා කරන ලදී.

**හවුල්කාරීත්ව සහ නව්‍යකරණ මූල්‍යකරණ ක්‍රමවේද තුළින් තෙත් කළාපයේ ජෛවවිවිධත්වය අනුප්‍රවාහගත කිරීම සහ තිරසර ඉඩම් කළමනාකරණය පිළිබඳ වූ ව්‍යාපෘතිය පිළිබඳ** ආරම්භක වැඩමුළුව 2024 ජූලි 16 වැනි දින බත්තරමුල්ල වෝටර්ස් එජ්හිදී පවත්වන ලද අතර ආරම්භක වැඩමුළුවේ ප්‍රධාන අරමුණු වූයේ ව්‍යාපෘති කණ්ඩායම සහ පාර්ශවකරුවන් හඳුන්වා දීම, ව්‍යාපෘතියේ වගකීම, ක්‍රියාකාරකම් සහ ව්‍යාපෘති උපාය මාර්ග සාකච්ඡා කිරීම වේ.

## 2.1.3 දේශගුණික විපර්යාස අභියෝග ජයගැනීම

**හරිත දේශගුණික අරමුදල (GCF) අරමුදල් සඳහා ව්‍යාපෘති සංකල්ප පත්‍රිකා ගොඩනැගීම**

"ශ්‍රී ලංකාවේ දේශගුණික විපර්යාස අවම කිරීම සඳහා GCF රට වැඩසටහන (Country Program)" ලේඛනය සකස් කර GCF වෙත ඉදිරිපත් කරන ලදී. හරිත දේශගුණික අරමුදලේ 2024-2027 කාලය සඳහා ප්‍රමුඛතා ව්‍යාපෘති හඳුනාගෙන සංකල්ප සටහන් පහක් සකස් කරන ලද අතර GCF ප්‍රතිතන උපකාරක කවුළුව පිහිටුවන ලදී.

**සියලුම අමාත්‍යාංශ සහ නියෝජිතායතනවලින් තෝරාගත් නිලධාරීන් සඳහා සංකල්ප පත්‍රිකා ලිවීම පිළිබඳ ධාරිතා ගොඩනැගීමේ වැඩමුළු පැවැත්වීම**

ධාරිතා ගොඩනැගීමේ වැඩමුළු ශ්‍රී ලංකාවේ ප්‍රධාන වැඩසටහන් පාර්ශවකරුවන්ගේ ධාරිතාව ඉහළ නැංවීම ප්‍රධාන අරමුණ වේ. මෙයට පරිසර අමාත්‍යාංශය - ජාතික නම් කරන ලද අධිකාරිය, යෝජිත සෘජු ප්‍රවේශ ආයතන සහ ආංශික පාර්ශවකරුවන් ඇතුළත් වේ. ඉලක්ක කණ්ඩායම NDCs හි අංශ 15 සහ NDA හි කාර්ය මණ්ඩලය නියෝජනය කරනු ඇත. මෙම පුහුණුවේ අරමුණු වන්නේ GCF අරමුදල් යෝජනා හඳුනා ගැනීම සහ සංවර්ධනය කිරීම, ව්‍යාපෘති සංවර්ධන ක්‍රියාකාරී කණ්ඩායමේ විභව සාමාජිකයින් සමඟ සම්බන්ධ වීම සහ GCF සංකල්ප සටහන් දක්වා වර්ධනය කළ හැකි ව්‍යාපෘති අදහස් සඳහා විෂය පථය හඳුනා ගැනීමයි. GCF වෙත ව්‍යාපෘති යෝජනා සංවර්ධනය සඳහා පහසුකම් සැලසීම සඳහා ව්‍යාපෘති යෝජනා සංවර්ධන ක්‍රියාකාරී කණ්ඩායම පිහිටුවන ලදී.

**දේශගුණ සුහුරු ගම්මාන සංවර්ධනය සඳහා මාර්ගෝපදේශයක් සකස් කිරීම**

මෙම වැඩසටහන යටතේ, ග්‍රාමීය පරිසර පද්ධතීන් ආරක්ෂා කරගනිමින් ග්‍රාමීය ප්‍රජාවගේ සමාජ ආර්ථික තත්වය හා ආධ්‍යාත්මික ගුණ වගාව ප්‍රවර්ධනය කිරීම සඳහා හරිත රැකියා හා තිරසර ජීවනෝපාය ප්‍රවර්ධනය, කෘෂිකාර්මික ජෛව විවිධත්වය ප්‍රවර්ධනය කිරීම, ප්‍රජා වන වගාව හා ග්‍රාමීය ප්‍රජා මූලික සංවිධාන සවිබල ගැන්වීම වැනි කටයුතු ඉටු කිරීමට අපේක්ෂිතය.

ඒ අනුව මෙම වැඩසටහන යටතේ මාර්ගෝපදේශ සංග්‍රහයක් සකස් කිරීම සඳහා පාර්ශවකරුවන්ගේ සහභාගිත්වයෙන් 2024 වසරේ රැස්වීම් 02ක් පවත්වන ලද අතර ලබාගන්නා ලද දත්ත අනුව මෙම මාර්ගෝපදේශ සංග්‍රහය සකස් කිරීමට බලාපොරොත්තු වේ.

**ජාතික අනුහුරුවීම සැලසුම් සූදානම සහාය (NAPRS) ව්‍යාපෘතිය හරහා දේශගුණ විපර්යාස සඳහා ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැගීම**

ජාතික සහ පළාත් මට්ටමින් දේශගුණ විපර්යාස සඳහා ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැගීම සඳහා 2024 වර්ෂය තුළ ජාතික අනුහුරුවීමේ සැලැස්ම (2025-2034) යාවත්කාලීන කිරීම සඳහා හඳුනාගත් අංශ 13 සඳහා ආංශික උපදේශන සහ නාභිගත කණ්ඩායම් සාකච්ඡා සිදු කරන ලදී. පළාත් නවය සඳහා වන පළාත් අනුහුරුවීමේ සැලසුම් පාර්ශවකරුවන්ගේ උපදේශන කිහිපයකින් පසුව වැඩි දියුණු කොට සමාලෝචනය කරන ලදී. පළාත් ධාරිතා අවශ්‍යතා ඇගයීම සිදු කරන ලද අතර ඒ අනුව දේශගුණික තත්ත්වයන් ප්‍රධාන වශයෙන් සංවර්ධන සැලසුම්කරණයට අනුහුරුවීම් කිරීම සඳහා එක් එක් පළාත් සඳහා දෙදින පළාත් මට්ටමේ ධාරිතා වර්ධනය කිරීමේ වැඩමුළු පවත්වන ලදී. මුහුදු මට්ටම ඉහළ යාම සහ ආන්තික කාලගුණික සිදුවීම් පිළිබඳව දැනුවත් කිරීම සඳහා වෙරළබඩ පළාත් පහ සඳහා පළාත් නිලධාරීන් සහ වෙරළබඩ ප්‍රජාවන් ඉලක්ක කර ගනිමින් දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.

ජාතික අනුහුරුවීමේ අරමුදලක් (National Adaptation Fund) පිහිටුවීම සඳහා ශක්‍යතා වාර්තාවේ කෙටුම්පත ඉදිරිපත් කරන ලදී.

ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ සමාජ ඒකාබද්ධ කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම පාර්ශවකරුවන්ගේ උපදේශන හරහා සමාලෝචනය කරන ලදී.

**ජාතික වශයෙන් නිර්ණය කළ දායකත්ව ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම (NDCs 2021-2030)**

2023 වර්ෂය සඳහා වන ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සඳහා NDC ක්‍රියාත්මක කිරීම සඳහා වූ ජාතික මෙහෙයුම් කමිටුවක් 2024 ජූලි 03 වන දින පවත්වන ලදී. විශේෂයෙන්ම විදුලිබල (විදුලි උත්පාදන) අංශයේ සැලකිය යුතු ප්‍රගතියක් ඉස්මතු විය. මෙහිදී 2025-2035 කාලසීමාව සඳහා යාවත්කාලීන කරන ලද NDCs වඩාත් අභිලාෂකාමී සහ ප්‍රගතිශීලී ඉලක්ක සමඟ 2025 පෙබරවාරි 10 වන දිනට ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කරන ලදී.

**දේශගුණ විපර්යාස පිළිබඳ එක්සත් ජාතීන්ගේ රාමුගත සම්මුතියේ පාර්ශවකරුවන්ගේ 29 වැනි සමුළුව**

අසර්බයිජාන් හිදී බකු නුවර 2024.11.11 සිට 2024.11.22 දක්වා පවත්වන ලද මෙම සමුළුව පරිසර අමාත්‍යාංශය නියෝජනය කරමින් නිලධාරින්ද, පෞද්ගලික අංශය සහ අධ්‍යන අංශය නියෝජනය කරමින් පිරිසක්ද සහභාගී විය. දේශගුණ විපර්යාස සඳහා ඉතා අවදානමට ලක්විය හැකි රටක් ලෙස Small Island Developing States (SIDS) කණ්ඩායම තුලට ඇතුළු වීම සඳහා මූලික සාකච්චා මෙම සමුලුවෙහිදී සිදු කරන ලදී.

එමෙන්ම සුහුරු කෘෂිකර්ම ආයෝජන සැලැස්මක් සකස් කිරීම 3 වන ජාතික බලයලත් අධිකාරිය සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය හරහා ආරම්භ කරන ලදී.

## 2.1.4 වායු සම්පත් කළමනාකරණය

**කොළඹ නාගරික බල ප්‍රදේශයේ වායු තත්ත්ව කළමනාකරණය පිළිබඳ සාක්ෂි පදනම් කරගත් උපාය මාර්ග සහ ප්‍රතිපත්ති වැඩිදියුණු කිරීම සඳහා ධාරිතා සංවර්ධනය**

වාතයේ ගුණාත්මකතාවය ඉතා සංවේදී ක්‍රියාවක් වන අතර ශ්‍රී ලංකාව තුල වාතයේ ගුණාත්මකතාවය නිර්ණය කිරීම සඳහා ස්වයංක්‍රිය වායු තත්ත්ව මැනීමේ උපකරණ තුනක් බත්තරමුල්ල, කොළඹ සහ මහනුවර නගරයන්හි ස්ථාපිත කර ඇත. එමගින් වාතයේ පවතින PM-10, PM-2.5,NOx, SOX, CO, ඕසෝන් පිළිබඳ දත්තයන් ලබා දෙනු ලැබේ. මෙහිදී ශ්‍රී ලංකාවේ ඇතැම් නාගරික ප්‍රදේශ වල සමහර දින වලදී සංසරණය වන වාතයේ $PM_{10}$ සහ $PM_{2.5}$ සම්මත අගයන්ට වඩා අධිකව පවතින බව තහවුරු කරගෙන ඇත.

මේ පිළිබඳ සැලකිල්ලට ගනිමින් ප්‍රංශ තාක්ෂණික සහයෝගීත්වය යටතේ කොළඹ නාගරික ප්‍රදේශය තුල වායු තත්ත්ව කළමනාකරණය පිළිබඳ සාක්ෂි පදනම් කරගත් උපාය මාර්ග සහ ප්‍රතිපත්ති

වැඩිදියුණු කිරීම සඳහා ධාරිතා සංවර්ධනය පිළිබඳ ඉදිරිපත් කරන ලද ව්‍යාපෘතිය මේ වන විට ක්‍රියාත්මක කරමින් පවතී. මෙහි තුන්වන පාර්ශවීය ආයතනය වන ප්‍රංශ සංවර්ධන ඒජන්සියට අදාල නියෝජිතයකු මේ වන විට වායු සම්පත් කළමනාකරණ හා ජාතික ඕසෝන් ඒකකය සමග සම්බන්ධව කටයුතු කරයි. මෙම ව්‍යාපෘතිය මධ්‍යම පරිසර අධිකාරිය හා ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය හා සිදු කරගෙන යනු ලැබේ.

**නිල් අහස සඳහා පිරිසිදු වාතය පිළිබඳ පස්වන ජාත්‍යන්තර දිනයට සමගාමීව** තෝරාගත් කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ආයතනය 20ක නිලධාරීන්, පරිසර අමාත්‍යාංශ නිලධාරීන් හා මධ්‍යම පරිසර අධිකාරී නිලධාරීන් සීතාවක ආයෝජන කලාපයේ කර්මාන්ත ආයතන විසින් වායු දූෂණය අවම කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග ප්‍රායෝගිකව පෙන්වීම සඳහා අධ්‍යයන චාරිකාවක් 2024 සැප්තැම්බර් මස 03 දින සිදු කරන ලදී.

## 2.1.5 පරිසර සැලසුම් හා ආර්ථික

**හරිත ප්‍රසම්පාදනය**

හරිත ප්‍රසම්පාදනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය 2024 ලෝක පරිසර දිනයේදී එළිදක්වන ලදී. පරිසර අමාත්‍යාංශය, ජර්මානු සහයෝගීතා ආයතනය (GIZ) සමඟ එක්ව තිරසාර පරිභෝජනය සහ නිෂ්පාදන ප්‍රවේශය යටතේ මීළඟ පස්වන ආසියා ව්‍යාපෘතිය 2024 දී ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම ආරම්භ කර ඇත. වෙළඳපල සූදානම විශ්ලේෂණයක් සහ රාජ්‍ය අංශයේ මිලදී ගැනීම් පිළිබඳව සමීක්ෂණයක් සංකල්පගත කර ඇති අතර මෙම ව්‍යාපෘතියේ සහාය යටතේ සිදු කෙරේ.

එමෙන්ම හරිත රාජ්‍ය ප්‍රසම්පාදනය ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට ඇතුළත් කිරීම සඳහා ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව සමඟ සහයෝගයෙන් කටයුතු කරමින් පවතී.

**පාරිසරික ලේබල්කරණය පිළිබඳ ජාතික රාමුව ක්‍රියාත්මක කිරීම**

ලේබල් කිරීමේ සහ සහතික කිරීමේ යෝජනා ක්‍රමවල විවිධත්වය සහ හරිත ශෝධන (Green Washing) හැකියාව වැනි කරුණු සැලකිල්ලට ගනිමින්, ශ්‍රී ලංකාවේ පාරිසරික ලේබල් කිරීම සඳහා වූ ජාතික රාමුව ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය (SLAB) සහ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය ඇතුළු ප්‍රධාන පාර්ශවකරුවන් සමඟ පරිසර අමාත්‍යාංශය විසින් සකස් කර වලංගු කරන ලදී.

මේ සඳහා 2022 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර, ජර්මානු සංවර්ධන සහයෝගීතාවය (GIZ) සමඟ එක්ව තිරසාර පරිභෝජනය සහ නිෂ්පාදන ප්‍රවේශය යටතේ ජාතික රාමුව ක්‍රියාත්මක කිරීම ආරම්භ කිරීමට කටයුතු කර ඇත.

එමෙන්ම තිරසර නිෂ්පාදනය හා පරිභෝජන (SCPO) ව්‍යාපෘතිය යටතේ රාමු නිර්ණායක සංවර්ධනය සිදු වෙමින් පවතී.

**හරිත නිෂ්පාදන හා හරිත රැකියා ප්‍රවර්ධන වැඩසටහන**

පරිසර අමාත්‍යාංශය මගින් තිරසර පරිභෝජනය හා නිෂ්පාදන රටාවක් රට තුල ව්‍යාප්ත කිරීමේ අරමුණින් පරිසර හිතකාමී නිෂ්පාදන හඳුනා ගැනීමේ හා ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබයි.

මෙම වැඩසටහන යටතේ දීප ව්‍යාප්තව සිටින පරිසර හිතකාමී නිෂ්පාදනකරුවන් හා හරිත රැකියාවල නිරතවූවන් පිළිබඳ තොරතුරු අප අමාත්‍යාංශයට අනුයුක්තව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවයේ නියුතු පරිසර නිලධාරීන් මගින් එකතු කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් හා ධාරිතා වර්ධන වැඩසටහන් මුළු දිවයිනම ආවරණය වන පරිදි පවත්වන ලදී .

එම තොරතුරු අනුව මාතලේ හා මහනුවර දිස්ත්‍රික්කවල ජනතාව සඳහා පරිසරය සමග සහජීවනයෙන් ජීවත් වෙමින් ආර්ථික තත්ත්ව ඉහළ මට්ටමකට ගෙන ඒමට අවැසි හරිත ක්‍රමෝපායන් පිළිබඳ වැඩමුළු 2ක් පවත්වන ලදී.

එමෙන්ම පරිසර හිතකාමී නිෂ්පාදන හඳුනා ගැනීමේ හා හරිත රැකියා ප්‍රවර්ධන වැඩසටහන මගින් අනුරාධපුර දිස්ත්‍රික්කයේ මධ්‍යම නුවරගම් පළාත ප්‍රදේශීය ලේකම් කාර්යාලයේ තල් කොළ හා පන් ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදන ත්‍රෛයි මාසික පුහුණු වැඩසටහනක් පවත්වන ලදී.



තල් කොළ හා පන් ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදන ත්‍රෛයි මාසික පුහුණු වැඩසටහන

**පරිසර සංවේදී ප්‍රදේශ වල ජෛවවිවිධත්ව සංරක්ෂණය සහ පරිසර පද්ධති සේවා නඩත්තුව වැඩිදියුණු කිරීමේ වැඩසටහන**

ශ්‍රී ලංකාවේ පාරිසරික සංවේදී ප්‍රදේශ (ESA) පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය පරිපාලනය, ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීම, හඳුනාගත් පාරිසරික සංවේදී ප්‍රදේශ ප්‍රකාශ කිරීම කළමනාකරණය සහ මඟ පෙන්වීම උදෙසා ඒකාබද්ධ ජාතික මෙහෙයුම් කමිටුව ස්ථාපිත කරන ලදී.

මෙහිදී පාරිසරික සංවේදී ප්‍රදේශ පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය, පාරිසරික සංවේදී ප්‍රදේශ (ESAs) පාලනය කිරීමේ රාමුව, සත්ත්ව විශ්ලේෂණය මත පදනම්ව හඳුනාගත් පාරිසරික සංවේදී ප්‍රදේශ නියමිත පරිදි සම්මත කර ගැනීම සහ ඉදිරි ගමන් මඟ පිළිබඳව සාකච්ඡා කරන ලදී.



කටාන සහ මීනුවන්ගොඩ හඳුනාගත් ESA අධ්‍යයනය

මේ වන විට ESAs 139ක් සත්ත්ව විද්‍යාත්මක විශ්ලේෂණ හරහා හඳුනාගෙන ඇත. මීට අමතරව, ජල හා ශාක යන අංශ දෙකෙහිම විද්‍යාත්මක තක්සේරු කිරීම් සිදු වෙමින් පවතී.

මුළු දිවයිනම ආවරණය වන පරිදි සත්ත්ව විශ්ලේෂණය මත පදනම් වූ පරිසර සංවේදී ප්‍රදේශ (ESA) Ver.1.0 මෙටා දත්ත කට්ටලය සහ පරිසර සංවේදී ප්‍රදේශ (ESA) Ver.1.1 මෙටා දත්ත කට්ටලය සකසා ඇත.

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ සහයෝගය ඇතිව ප්‍රාදේශීය පරිපාලන නිලධාරීන් සඳහා ක්ෂේත්‍ර චාරිකාවකින් ඇතුලත්ව පාරිසරික සංවේදී ප්‍රදේශ හඳුනාගැනීම හා කළමනාකරණය පිළිබඳ දින 3ක නේවාසික ධාරිතාව ගොඩනැගීමේ වැඩසටහනක් පවත්වන ලදී.

ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය, ස්වභාවික සම්පත් අංශය සහ අදාළ පාර්ශ්ව සමඟ පාරිසරික සංවේදී ප්‍රදේශ පිළිබඳ දත්ත පද්ධතිය සැකසීම, යාවත්කාලීන කිරීම, සහ සේවාදායක පහසුකම් (Server facilities) ලබා ගැනීම සහ වෙබ් අඩවිය සංවර්ධනය පිළිබඳ සාකච්ඡා පවත්වන ලදී.

BESASL දත්ත සමුදාය යාවත්කාලීන කිරීම සම්බන්ධයෙන් වයඹ විශ්වවිද්‍යාලය සමඟ රැස්වීම් පවත්වා සම්බන්ධීකරණය කර ඇත.

**හරිත ගිණුම්කරණය**

එක්සත් ජාතීන්ගේ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව තවත් ජාත්‍යන්තර ආයතන කිහිපයක් සමඟ එක්ව හරිත ගිණුම්කරණය ලෙස ප්‍රචලිත පාරිසරික හා ආර්ථික ගිණුම්කරණ පද්ධතිය (SEEA) හඳුන්වා දෙන ලදී.

මෙම වැඩසටහන යටතේ අමාත්‍යාංශ කාර්ය මණ්ඩලය සහ රේඛීය ආයතන (CEA, GSMB) දැනුවත් කිරීමේ වැඩසටහන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහ විශේෂඥ කමිටු සාමාජිකයින් විසින් සම්පත් දායකත්වය සපයන ලදී. එමෙන්ම පාර්ශවකරුවන්ගේ උපදේශන වැඩසටහන හා දැනුවත් කිරීමේ වැඩසටහන්ද පවත්වන ලදී.

**පැරිස් ගිවිසුමේ 6 වැනි වගන්තිය රට තුළ ක්‍රියාත්මක කිරීම**

**ඒකාබද්ධ කාබන් හර කිරීමේ යාන්ත්‍රණය**

අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ඇතිව කාබන්හර කිරීමේ යාන්ත්‍රණය JCM පිළිබඳ ඒකාබද්ධ කමිටුව පිහිටුවන ලද අතර ඒකාබද්ධ කමිටුවේ පළමු හා දෙවන රැස්වීම් පවත්වන ලදී. JCM යාන්ත්‍රණය යටතේ ව්‍යාපෘති සංකල්ප තුනක් සඳහා ඒකාබද්ධ කමිටුව එකඟතාව ලබා දී ඇත.

ජපාන නියෝජිතයින් සමඟ 2024 අගෝස්තු මස දක්වා 6 වැනි වගන්තිය පිළිබඳ මූලික වාර්තාව සකස් කිරීම පිළිබඳ පුහුණු වැඩමුළුවක් සහ ඒ පිළිබඳ සාකච්ඡා පවත්වන ලදී.

**පැරිස් ගිවිසුමේ 6 වැනි වගන්තිය යටතේ සහයෝගීතාව සඳහා ශ්‍රී ලංකාව සහ සිංගප්පූරුව අතර අවබෝධතා ගිවිසුම (MOU)**

ගිවිසුම් කෙටුම්පත පිළිබඳ ශ්‍රී ලංකාවේ අදහස් සහ යෝජනා සිංගප්පූරු රජය වෙත දැනුම්දීමට හා ශ්‍රී ලංකාවේ අනුමත කාබන් වෙළෙඳපොළ ප්‍රතිපත්ති රාමුව සහ මාර්ගෝපදේශ මූලධර්ම යටතේ ගිවිසුම අත්සන් කිරීමට කමිටු රැස්වීමේදී තීරණය විය.

**ශ්‍රී ලංකාවේ කාබන් වෙළඳ රාමුව සකස් කිරීම**

එක්සත් ජාතීන්ගේ දේශගුණවිපර්යාස පිළිබඳ රාමුගත සම්මුතියෙහි ඩුබායිහි පිහිටි කළාපීය සහයෝගීතා මධ්‍යස්ථානයෙහි (RCC Dubai UN-FCCC) තාක්ෂණික හා මූල්‍ය දායකත්වයෙන් ශ්‍රී ලංකාවේ කාබන් වෙළඳ රාමුව සකස් කිරීම පිළිබඳ රැස්වීම් හා වැඩමුළු මාලාවන් 2ක් අදාල පාර්ශවකරුවන් හා පවත්වන ලදී.

අමාත්‍ය මණ්ඩල අනුමැතියෙන් පසු ධනාත්මක ව්‍යාපෘති ක්ෂේත්‍ර ලැයිස්තුව පරිසර අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ ප්‍රකාශයට පත්කරන ලද අතර මෙමගින් වෙළඳපල අවස්ථා සඳහා යෝග්‍ය ව්‍යාපෘති ක්ෂේත්‍ර හඳුනා ගැනීමට ව්‍යාපෘති යෝජකයන්ට වඩා හොඳ මඟපෙන්වීමක් සපයනු ඇත.

එක්සත් ජාතීන්ගේ දේශගුණ විපර්යාස පිළිබඳ රාමුගත සම්මුතියෙහි ඩුබායිහි පිහිටි කළාපීය සහයෝගීතා මධ්‍යස්ථානයෙහි තාක්ෂණික හා මූල්‍ය දායකත්වයෙන් කාබන් වෙළඳාම පිළිබඳ ප්‍රතිපත්ති රාමුව හා මාර්ගෝපදේශ කෙටුම්පත් කර ඇත.

**ජාතික හරිත වාර්තාකරණ ක්‍රමවේදය**

2024 වර්ෂය තුළදී පසුගිය කාල වකවානුව තුල අක්‍රියව පැවති හරිත වාර්තාකරණ ක්‍රමවේදය නැවත ස්ථාපිත කිරීමට කටයුතු කර ඇත.ජාතික හරිත වාර්තාකරණ මෙහෙයුම් කමිටුව නැවත ස්ථාපිත කරන ලද අතර නව ව්‍යවසායකයින් ලියාපදිංචි කිරීම නැවත ආරම්භ කර ඇත. නව සේවා සැපයුම් සහ නිෂ්පාදන හරිත වාර්තාකරණ ක්‍රමවේදය යටතේ ලියාපදිංචි කිරීම ආරම්භ කිරීම පිළිබඳව ව්‍යවසායකයින් දැනුවත් කිරීම සඳහා පුවත්පත් දැන්වීම් පළකරන ලදී.

තවද පැවති හරිත වාර්තාකරණ ක්‍රමවේදයට අදාළ මාර්ගෝපදේශයන් නූතන ගෝලීය තිරසර වාර්තාකරණ රාමු වලට අනුගත වන පරිදි යාවත්කාලින කිරීම ආරම්භ කර ඇත. එමෙන්ම මේ යටතේ හරිත වාර්තාකරණ මාර්ගෝපදේශ යාවත්කාලීන කිරීමේ පාර්ශ්වකාර උපදේශන වැඩමුළුවක් පවත්වන ලදී.

## 2.1.6 පරිසර දූෂණ පාලන හා රසායන ද්‍රව්‍ය කළමනාකරණය

**ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුව අසලින් ගලා යන දියවන්නා ඔයේ ජල දූෂණ පාලනය කිරීම සහ එහි තත්ත්වය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය**

ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුව අසලින් ගලා යන දියවන්නා ඔයේ ජලය දූෂණය පාලනය කිරීම සහ එහි තත්ත්වය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියේ කාර්යසාධක බලකායේ කාරක සභා රැස්වීමක් 2024.03.20 වන දින පැවැත්වූ අතර එහිදී ඒ වන තෙක් මධ්‍යම පරිසර අධිකාරිය, ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධන සංස්ථාව සහ ජල සම්පත් මණ්ඩලය යන ආයතන විසින් සිදු කල කාර්යයන් පිළිබඳව ප්‍රගතිය වාර්තා කරන ලදී. තවද, පාර්ලිමේන්තු ජලාශයේ වත්මන් තත්වය හා ප්‍රතිපාදනවල අවශ්‍යතාවය පිළිබඳ පාර්ලිමේන්තු මැති ඇමතිවරුන් දැනුවත් කිරීමේ වැඩසටහනක් 2024.04.26 දින ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ දී පවත්වන ලදී. එසේම, කාර්යසාධක බලකාය විසින් දියවන්නා ඔය ආශ්‍රිත ජල මාර්ගවල දූෂණය පාලනය කිරීම සහ ජලයේ ගුණාත්මක බව ඉහළ නැංවීමේ අරමුණින් සකස් කල කළමණාකරණ සැලැස්ම මේ වන විට මුද්‍රණය කර ඇත.

සොබාදහම සංරක්ෂණය සඳහා වූ අන්තර්ජාතික සංගමය (IUCN) සහ ලංකා පරිසර අරමුදල (LEF) යන ආයතන පරිසර අමාත්‍යාංශය සමඟ එක්ව, සාගරය හා වෙරළ දූෂණය අවම කිරීමේ පියවරක් ලෙස අතහැර දැමූ, නැතිවූ සහ වෙනත් ආකාරයකින් ඉවතලන ධීවර ආම්පන්න (ALDGF) නිසා ඇති වන පාරිසරික බලපෑමට විසඳුම් සෙවීම ආරම්භ කර ඇත. තවද, ධීවර අමාත්‍යාංශය සහ ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවෙහි සහභාගිත්වයත් සමග දැනට ශ්‍රී ලංකාවේ ALDFG කළමනාකරණය සඳහා වූ දත්ත, දැනුවත් කිරීම්, ප්‍රතිපත්තිමය හිඩැස් ආමන්ත්‍රණය කිරීමට ක්‍රියාකාරකම් ආරම්භ කර ඇත. මේ යටතේ ALDFG පිළිබඳ ජාතික උපදේශන කමිටු රැස්වීම් දෙකක් පවත්වන ලදී. තවද ව, ධීවරයින්, ධීවර වරායන් සහ ධීවර නිලධාරීන් සඳහා සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටි (Standard Operating Procedures) සකස් කරන ලද අතර ඒවා සමාලෝචනය කිරීම දෙදින වැඩමුළුවක් පවත්වන ලදී. එමෙන්ම ALDFG අත්පොත ප්‍රකාශයට පත් කරන ලද අතර ධීවර ප්‍රජාව පුහුණු කිරීම සඳහා ALDFG අත්පොත භාවිතා කරනුයේ කෙසේද යන්න පිළිබඳව මන්නාරම ධීවර නිලධාරීන් සඳහා පුහුණු කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.

සමුද්‍ර දූෂණ කළමනාකරණය පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීම හා ඔවුන්ගේ ධාරිතා වර්ධනය සඳහා ධීවර නිලධාරීන් සමඟ ප්‍රජා සාමාජිකයින් 250 දෙනෙකු සඳහා සැසිවාර සඳහා පුහුණුවක් ක්‍රියාත්මක කරන ලදී.

"PET බෝතල් සඳහා විශේෂ අවධානයකින් යුතුව ශ්‍රී ලංකාවේ PET (Polyethylene Terephthalate) හා HIPS (High Impact Polystyrene) පසු භාවිත ප්ලාස්ටික් ඇසුරුම් සඳහා QR පාදක තැන්පතු ආපසු ගෙවීම් පද්ධතියක් (DRS ) ක්‍රියාත්මක කිරීම සඳහායෝජනා 3ක් ඉදිරිපත් වුනු අතර මේ වන විට තෝරාගැනීමේ ක්‍රියාවලියේ පවතී.

"භාවිතා කරන ලද ඇඳුම් ආනයනය පාලනය කිරීම /තහනම් කිරීම" පිළිබඳ අමාත්‍ය මණ්ඩල සංදේශය අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත.

## 2.1.7 ස්වභාවික සම්පත් සංරක්ෂණය

**නියඟය සඳහා පෙර සූදානම් යාන්ත්‍රණයක් සකස් කිරීම**

එක්සත් ජාතීන්ගේ කාන්තාරකරණය පිටුදැකීමේ අන්තර්ජාතික සම්මුතියේ (United Nations Convention to Combat Desertification - UNCCD) 15 වන පාර්ශවකාර රැස්වීමේදී ගෝලීය ප්‍රජාව විසින් නියඟය පිටුදැකීම පිළිබඳ උපායමාර්ගික අරමුණු හඳුන්වා දුන් අතර, ඒ අනුව පරිසර අමාත්‍යාංශය විසින් අදාල පාර්ශවකාර ආයතන සමඟ අවශ්‍ය සැලසුම් සකස් කරන ලදී. ඒ සඳහා සියලු පාර්ශවකාර ආයතන විසින් සහයෝගය ලබාදුන් අතර එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය විසින් "GEF -7 Enabling Activities for Implementing UNCCD COP Drought Decisions" හි කලාපීය ව්‍යාපෘතිය මඟින් අවශ්‍ය මූල්‍යම සහ තාක්ෂණික සහය ලබා දෙන ලදී.

**කාන්තාරකරණය, ඉඩම් හායනය අවම කිරීමේ උපාය මාර්ග සහ ක්‍රියාකාරී සැලසුම්වලට අනුගත කිරීම වෙනුවෙන් උපදේශන සේවාවක් සිදු කිරීම**

ජාතික උපදේශනයේ පරමාර්ථ වන්නේ කාලීන අයිතිවාසිකම් ශක්තිමත් කිරීම සහ ඉඩම් පාලනය වැඩිදියුණු කිරීම සඳහා ඵලදායී මාර්ග ගවේෂණය කිරීම අරමුණු කරගත් බහු පාර්ශ්වකරුවන්ගේ වේදිකාවක්, පුළුල් ජාතික උපාය මාර්ගයක් සහ ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ ඉඩම් හායනයට දායක විය හැකි අනාරක්ෂිත ඉඩම් අයිතිය පිළිබඳ අවදානම් පිළිබඳව ප්‍රධාන පාර්ශවකරුවන්ගේ ආයතන, අවදානමට ලක්විය හැකි කණ්ඩායම්, සිවිල් සමාජය සහ පෞද්ගලික අංශය දැනුවත් කිරීම වේ. එක්සත් ජාතීන්ගේ කාන්තාරකරණය පිටුදැකීමේ අන්තර්ජාතික සම්මුතිය විසින් ජාතික උපදේශන සංවිධානය කළ පළමු රටවල් පහෙන් එකක් ලෙස ශ්‍රී ලංකාව තෝරාගන්නා ලදී.



කාන්තාරකරණය, ඉඩම් හායනය අවම කිරීම පිළිබඳ උපදේශන සේවාවක් සිදු කිරීම

සෑම වසරකම ජූනි මස 05 දිනට යෙදෙන ජගත් පරිසර දිනය හා සමගාමීව 2024 වසරේ පරිසර දින සැමරුම් සතිය හා සමගාමීව වැඩසටහන් රාශියක් පවත්වන ලදී. ඵලදායී භූමි පරිහරණයෙන් සුවදායී දෙරණක් තේමා කරගනිමින් පැවැත්වූ මෙම වැඩසටහනේදී අමාත්‍යාංශ පරිශ්‍රයේදී රුක් රෝපණ වැඩසටහනක් සිදු කරන ලදී. එමෙන්ම, ගෙවතු වගාව පිළිබඳව කෘෂිකර්ම උපදේශකයෙකු විසින් අමාත්‍යාංශය නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහනක් ද පැවැත්වූ අතර එළවළු බීජ ද බෙදා දීම සිදු කෙරිණි.

## 2.1.8 පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීම්

**හරිත ව්‍යවසායකත්ව ප්‍රවර්ධනය මඟින් පරිසර සංරක්ෂණය වැඩසටහන යටතේ දිවයින පුරා පැළ තවාන් 650ක් සිටුවීමේ වැඩසටහන.**

දිවයිනේ වන වැස්ම ඉහල නැංවීම සඳහා වන පැල අවශ්‍යතාවය සපුරා ගැනීම උදෙසා සහ හරිත ව්‍යවසායකයින් බිහිකිරීම අරමුණින් "හරිත ව්‍යවසායකත්ව ප්‍රවර්ධනය මඟින් පරිසර සංරක්ෂණ" වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී.

තෝරා ගත් අඩු අදායම්ලාභී පවුල් අතර එක් පැළ තවානක් වෙනුවෙන් රු. 300,000.00 ආධාරයක් ලබා දෙන ලද අතර තෝරාගනු ලැබූ තවාන්කරුවන් සඳහා අවශ්‍ය පුහුණුව ද පරිසර අමාත්‍යාංශය හා එහි පාර්ශවකරුවන් ද සමග එක්ව ලබා දීමට කටයුතු කරන ලදී. මෙම ව්‍යාපෘතිය මගින් හරිත ව්‍යවසායකයින් 336ක් සඳහා හරිත ගෘහ ලබා දී ඇත. තවද හම්බන්තොට, මොනරාගල, අනුරාධපුර දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි පැළ තවාන් වල පසු විපරම් කටයුතු සිදු කිරීමද සිදු කරන ලදී.

දැනුවත් කිරීමේ වැඩසටහන් වලට සමගාමීව පාරිසරික දැනුම හා ආකල්ප වර්ධනය කිරීමේ අරමුණින් පාසල් සිසුදරුවන්, ගුරුභවතුන් මහජනතාව, හා ශාන්ත ජෝශප් විද්‍යාලයේ සිසුන් 192ක් සඳහා පරිසරය පිළිබඳ දේශනයක් මෙන්ම ප්‍රායෝගික පුහුණුවක් ලබා දෙන ලදී.

එමෙන්ම, පරිසර අධ්‍යාපනය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහනක් අමාත්‍යාංශ නිලධාරීන්ගේ ප්‍රධානත්වයෙන් මොරටුව මෙතෝදිස්ත උසස් විද්‍යාලයේ ළමුන් 300 ක් සඳහා පවත්වනු ලැබීය.

අනුරාධපුර, මන්නාරම, වව්නියාව, පුත්තලම දිස්ත්‍රික්කවල පාසල්හි විද්‍යා විෂය උගන්වන ගුරුවරුන් සහ ගුරු උපදේශකවරුන් 105 ක් සඳහා පාරිසරික විෂය සංවේදී කරුණු පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහනක් අනුරාධපුර පසු අස්වනු තාක්ෂණ ආයතනයේදී පවත්වන ලදී.

එම වැඩමුළුවේදී වනාන්තර කළමනාකරණය, පරිසර දූෂණය පාලනය පිළිබඳ දැනුවත් කරන ලදී.

**ජගත් පරිසර දිනයට** සමගාමීව දිවයිනම ආවරණය වන පරිදි සියළු ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් ව්‍යාපෘති යෝජනා කැඳවන ලදී.

ඒ අතරින් තෝරාගත් සාර්ථක පරිසර ව්‍යාපෘතියක් සඳහා රු.10,000 ක් බැගින් යෝජිත පරිසර දින ව්‍යාපෘති 285ක් සඳහා ප්‍රතිපාදන වෙන් කර පරිසර දිනය හා පරිසර සතිය ඇතුලත එම ව්‍යාපෘති දියත් කිරීම අදාල ප්‍රාදේශීය ලේකම්ගේ ප්‍රධානත්වයෙන් සිදු කරන ලදී.

**"සොබා" සඟරාව 2024 කලාපය**

පරිසර අමාත්‍යාංශය මඟින් වාර්ෂිකව ප්‍රකාශයට පත් කරනු ලබන "සොබා" පාරිසරික සඟරාවේ 2024 වර්ෂයේ පළමු කලාපය "ප්ලාස්ටික් මඟින් සිදුවන දූෂණය පිටු දකිමු." යන්න තේමා කරගනිමින් සඟරා 1500ක් මුද්‍රණය කරන ලදී.

2024 ජූනි 05 දිනට යෙදී තිබුණු ජගත් පරිසර දිනයට සමගාමීව එළිදැක් වූ මෙම සඟරාව පාසැල් පුස්තකාල, මහජන පුස්තකාල, රාජ්‍ය ආයතන සහ පළාත් පාලන ආයතන වෙත බෙදා හරින ලදී.

තවද, සොබා සඟරාවේ 2024 දෙවන කලාපය "ආර්ථික සංවර්ධනය හා පාරිසරික සමතුලිතතාවය" යන තේමාව යටතේ මුද්‍රණය කර අවසන් අතර ඉදිරියේදී බෙදා හැරීමට නියමිතය.

**සොබා වලන" හා "සොබා සේයා" කෙටි චිත්‍රපට හා පාරිසරික ඡායාරූප තරඟාවලිය පැවැත්වීම.**

සොබා දහම කලාත්මකව දකිමු යන්න තේමා කොට ගනිමින් සොබා සේයා පාරිසරික ඡායාරූප තරගාවලිය සංවිධානය කරනු ලැබේ. ඒ අනුව සොබා වලන කෙටි චිත්‍රපට තරඟාවලියට අදාළව පුහුණු වැඩමුළුවක් 2024 ජූලි මස 03 වන දින අමාත්‍යාංශ ශ්‍රවණාගාරයේදී අයදුම්කරුවන් 200 දෙනකුගේ සහභාගීත්වයෙන් සාර්ථකව පවත්වන ලදී.



කෙටි චිත්‍රපට හා පාරිසරික ඡායාරූප තරඟාවලියේ ජයග්‍රාහකයින් සඳහා ත්‍යාග ප්‍රදානය

"සොබා වලන" හා "සොබා සේයා" කෙටි චිත්‍රපට හා පාරිසරික ඡායාරූප තරඟාවලියේ ජයග්‍රාහකයින් ඇගයීම සඳහා ත්‍යාග ප්‍රදානොත්සවය 2024/12/10 වන දින අමාත්‍යාංශයේදී පවත්වන ලදී.

**වායු තත්ත්ව කළමනාරණය පිළිබද දැනුවත් කිරිමේ වැඩසටහන්**

ජාතික ඕසෝන් ඒකකය විසින් 2022 වර්ෂයේදී එළි දක්වන ලද ගෘහස්ථ වායු තත්ත්ව කළමනාකරණය සඳහා මාර්ගෝපදේශ සංග්‍රහයට අදාලව විවිධ ක්ෂේත්‍රයන් සහ මහජනතාව සඳහා දැනුවත් කිරිමේ වැඩසටහන් පරිසර දිනයට සමගාමීව කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී හා රත්නපුර, ගාල්ල, යාපනය, මාතර, හම්බන්තොට, බදුල්ල, මොණරාගල, අනුරාධපුරය, පොළොන්නරු දිස්ත්‍රික් ලේකම් කාර්යාල වලදී පවත්වන ලදී.

ඕසෝන් ක්ෂයකාරක රසායන ද්‍රව්‍ය හා ඕසෝන් ක්ෂයකාරක නොවන රසායන ද්‍රව්‍ය පිළිබඳ දැනුවත් කිරිමේ වැඩමුළු 2 ක් භාණ්ඩ නිශ්කාශන අංශයේ රේගු නිලධාරීන් සඳහා පවත් වන ලදී.

ශීතකරණ හා වායුසමන ක්ෂේත්‍රයේ යහපුරුදු හා ගිනිගන්නා සුළු ශීතකාරක හා ඒවා අඩංගු උපකරණ හැසිරවීම පිළිබඳ එක් දින හා දෙදින පුහුණු වැඩමුළු 08 ක් කාර්මික ශිල්පීන් සඳහා පවත්වන ලදී.

ගිනි ගන්නා සුළු ශීතකාරක හැසිරවීම හා ශීතකරණ ක්ෂේත්‍රයේ යහ පුරුදු පිළිබඳ හා කිගාලි සංශෝධනය හඳුන්වා දීම සඳහා වැඩමුළු 05 ක් ආයෝජන ප්‍රවර්ධන කලාපයන්හි සේවයේ නියුතු කාර්මික ශිල්පීන් සඳහා පවත් වන ලදී.

තෙදින හා දෙදදින ශීතකරණ හා වායුසමන ක්ෂේත්‍රෙය් යහ පුරුදු සම්බන්ධව නිපුණතා පාදක ඇගයීම්කරුවන් පුහුණු කිරීමේ වැඩමුළු 2 ක් පවත්වන ලදී.

වායුසමන හා ශීතකරණ වැඩහල් අධීක්ෂණය හා ඇගයීම් කරණ වැඩසටහන් 4 ක් පවත්වන ලද අතර වායුසමන හා ශීතකරණ අවසාන පාර්භෝගිකයා දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.

ජාතික ඕසෝන් ඒකකය මඟින් ඕසෝන් පුහුණුකරුවන් ලෙස පුහුණු කරවන ලද මධ්‍යම පරිසර අධිකාරියේ නිලධාරීන් මඟින් දිවයින පුරා පාසල් ළමුන්, ගුරුවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන් 11 ක් පවත්වන ලදී.

බාලදක්ෂිකා සංගමය හා ජාතික ඕසෝන් ඒකකය ඒකාබද්ධව Ceylona camp වැඩමුළුව දේශීය හා

විදේශීය බාලදක්ෂිකාවන් 5000 ක් සමඟ ඉබ්බාගමුව ජාතික පාසලේදී පවත් වන ලදී.

ජාතික ශාක නිරෝධායන සේවයේ සහයෝගීතාවයෙන් මීතයිල් බ්‍රෝමයිඩ් ප්‍රතිකාර සපයන්නන් හා ආනයනකරුවන් සඳහා මීතයිල් බ්‍රෝමයින් ආනයනය,පාලනය හා විධිමත් කිරීම ශක්තිමත් කිරීමේ වැඩමුළුවක් පවත් වන ලදී.

**ජෛවවිවධත්වය පිලිබඳ දැනුවත් කිරීම**

ජෛවවිවිධත්වය හා බැඳුණු පාරම්පරික දැනුම සංරක්ෂණය පිළිබඳ කළුතර දිස්ත්‍රික් රාජ්‍ය නිලධාරීන්, පාසැල් නියමු දරු දැරියන් දැනුවත් කිරීමේ වැඩමුළුවක් කලුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී පවත්වන ලදී.

යාවත්කාලීන කරන ලද ජාතික රතු දත්ත ලේඛණය පිළිබඳ අදාළ පාර්ශවකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහනක් පේරාදෙණිය ජාතික උද්භිද උද්‍යානයේදී පවත්වන ලද අතර තර්ජනයට ලක්ව ඇති ශාක විශේෂ තර්ජිත තත්ත්වයෙන් මුදවා ගෙන ආරක්ෂා කර ගැනීමට අවශ්‍ය පියවර ගැනීමේ අරමුණින් මෙම දැනුවත් කිරීමේ වැඩසටහන පවත්වන ලදී.

ශ්‍රී ලංකාවේ ආක්‍රමණික ආගන්තුක ජීවී විශේෂ හඳුනාගැනීම, පාලනය හා කළමනාකරණය පිළිබඳව රාජ්‍ය නිළධාරීන් හා ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහක් මාතර තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී පවත්වනු ලැබීය. පරිසර අමාත්‍යාංශයේ තාක්ෂණික දායකත්වයෙන් ශ්‍රී ලංකා නාවික හමුදා නිළධාරීන් සඳහා මෙන්ම පුත්තලම දිස්ත්‍රික්කයේ අදාළ රාජ්‍ය නිළධාරීන් සඳහා කඩොලාන පරිසර පද්ධති සංරක්ෂණය කිරීමේ වැදගත්කම සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩමුළු 2ක් පිළිවෙලින් ලයිට් හවුස් ගැලේහිදී හා ආනවිලුන්දාවේ දී පවත්වන ලදී.

## 2.1.9 අන්තර්ජාතික පාරිසරික සබඳතා

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා මහා බ්‍රිතාන්‍යයේ එක්සත් රාජධානියේ රජය සහ උතුරු අයර්ලන්ත රජය අතර සමුද්‍රික රාජ්‍යයන්ගේ හවුල්කාරිත්ව වැඩසටහන සඳහා සහයෝගිතාව පිණිස වූ අවබෝධතා ගිවිසුම සඳහා අත්සක් තැබීම ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය මහ කොමසාරිස් ගරු ඇන්ඩෲ පැට්‍රික් මහතාගේ සහභාගීත්වයෙන්, Blue Planet Fund හි නියෝජ්‍ය අධ්‍යක්ෂ සාරා රස්ලින් මහත්මිය සහ පරිසර අමාත්‍යාංශයේ ලේකම් අතර 2024.05.17 දින සිදු කරන ලදී.

**ගෝලීය පාරිසරික පහසුකමහි 8 වන චක්‍රය (GEF 8) මගින් ක්‍රියාත්මක කිරීමට යෝජිත ව්‍යාපෘති**

STAR ප්‍රතිපාදන ලබා ගැනීමේ අපේක්ෂාවෙන් GEF ආයතනයේ අනුමැතිය සඳහා පහත සඳහන් ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කරන ලදී.

| ව්‍යාපෘතියේ නම | හවුල්කාර ආයතනය |
|---|---|
| ශ්‍රී ලංකාවේ ගංගා ද්‍රෝණි තුනක් ආශ්‍රිත ප්‍රජාව හා පරිසර පද්ධති සවිබල ගැන්වීම සඳහා සහල් පාදක තිරසර කෘෂි පද්ධති | ආහාර හා කෘෂිකර්ම සංවිධානය (FAO) |
| දේශගුණ සුහුරු හා තිරසර නගර | එක්සත් ජාතීන්ගේ පරිසර වැඩසටහන (UNEP) |
| ශ්‍රී ලංකාවේ නැගෙනහිර වෙරළ ආශ්‍රිත සුවිශේෂී ජෛව විවිධත්ව හා පරිසර පද්ධති සේවා සංරක්ෂණය තුළින් තිරසර ආර්ථික ප්‍රතිලාභ ප්‍රවර්ධනය | එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) |
| දේශගුණ අනුහුරුතාව හා ගෝලීය පාරිසරික ප්‍රතිලාභ ඉහළ නැංවීම සඳහා ජෛව විවිධත්වයෙන් ඉහළ, පාරිසරික වශයෙන් සංවේදී හා ගෝලීයව වැදගත් මධ්‍යම කඳුකර භූමි ප්‍රදේශ සහ-කළමණාකරණය | සොබාදහම සංරක්ෂණය සඳහා ජාත්‍යන්තර සංගමය (IUCN) |
| GEF ක්ෂුද්‍ර මූල්‍ය වැඩසටහන | එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) |

**ජාත්‍යන්තර පාරිසරික සම්මුතිය, සංධානය, සහයෝගිතා වැඩසටහන හෝ ජාත්‍යන්තර ආයතන සඳහා වාර්ෂික දායකත්ව මුදල් හෝ සත්කාරක මුදල් ගෙවීම**

අංක 22/1134/604/012 සහ 2022අගෝස්තු 31 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් ගෙවීම් සිදු කිරීමට අනුමැතිය ලබා දී ඇති පහත සඳහන් ආයතන වෙනුවෙන් ගෙවීම් සිදු කර ඇත.

- ජාත්‍යන්තර පාරිසරික සම්මුතිය, සංධානය,සහයෝගිතා වැඩසටහන හෝ ජාත්‍යන්තර ආයතනයඑක්සත් ජාතීන්ගේ , පාරිසරික වැඩසටහන(UNEP) එක්සත් ජාතීන්ගේ දේශගුණ විපර්යාස පිළිබඳ රාමුගත සංමුතිය (UNFCCC), ජෛව විවිධත්ව සම්මුතිය (CBD), කියෝතෝ සංධානය

## 2.1.10 පාරිසරික දින සැමරීම

**ලෝක මුහුදු තෘණ දිනය සැමරීම**

**(2024 මාර්තු 01)**

**නීල පිබිදුම ප්‍රජා උන්නතිය උදෙසා සශ්‍රීක මුහුදු තෘණ** (Blue for blooming: vitalizing seagrass resilience for livelihoods)' යන තේමාව යටතේ අන්තර්ජාතික මුහුදු තෘණ දිනය පාර්ශවකරුවන්ගේ සහභාගිත්වයෙන් පවත්වන ලදී. මෙම වැඩසටහනට සමගාමීව චිත්‍ර තරඟයක්, පාපැදි සවාරියක් සහ සරුංගල් සංදර්ශනයක් පැවැත්වීම ද සිදු කරන ලදී.




**ඉන්දියානු සාගර රිම් සංගම් දිනය සැමරීම**

**(2024 මාර්තු 10)**

අතිගරු ජනාධිපතිතුමාගේ සහභාගීත්වයෙන් ගාලු මුවදොර පිටියේදී සමරන ලද අතර මෙම දිනයේ අරමුණ වූයේ අනාගත පරම්පරාව සඳහා තිරසාර ඉන්දියානු සාගරයක් උරුම කිරීමයි. මෙහිදී සමස්ත දිවයින ආවරණය වන පරිදි පාසල් ළමුන් දැනුවත් කිරීම සඳහා වැඩසටහන් සිදු කරන ලද අතර කඩොලාන සහ මුහුදු තෘණ සංරක්ෂණය, සමුද්‍රික ප්ලාස්ටික් දූෂණය වැලැක්වීම සම්බන්ධයෙන් ළමුන් සහ මහජනතාව දැනුවත් කිරීම සඳහා පරිසර අමාත්‍යාංශය විසින් ප්‍රදර්ශන කුටි සංවිධානය කරන ලදී.

**ජාත්‍යන්තර ජෛවවිවිධත්ව දිනය සැමරීම**

**(2024 මැයි 22)**

**"ජෛවවිවිධත්ව සංරක්ෂණ සැලැස්මේ කොටස්කරුවකු වෙමු " යන තේමාව යටතේ** මෙවර අන්තර්ජාතික ජෛවවිවිධත්ව දිනය සැමරීමේ ජාතික උත්සවය වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා එක්ව නුවරඑළිය හෝර්ටන්තැන්න ජාතික වනෝද්‍යානයේ දී පවත්වනු ලැබිය. ජෛවවිවිධත්වයට තර්ජනයක්ව පවතින ආගන්තුක ආක්‍රමණශීලි ශාක විශේෂයක් වන යුලෙක්ස් (*Ulex europaeus*) ශාකය ඉවත් කිරීමේ ප්‍රායෝගික වැඩසටහනක් පවත්වන ලද අතර මේ සඳහා රජයේ ආයතන, රාජ්‍ය නොවන සංවිධාන, පුද්ගලික අංශය, තරුණ පරිසරවේදීන්, විශ්ව විද්‍යාල සිසුන්, පාසැල් දරුවන් හා ප්‍රජාව සහභාගී විය

**ජගත් පරිසර දිනය සැමරුම් වැඩසටහන**

**(2024 ජුනි 05)**



**"එලදායි භූමි පරිහරණයෙන් සුවදායී දෙරණක්"** යන තේමාව යටතේ ජගත් පරිසර දින සැමරීම සිදු කරන ලදි. පරිසර දින සැමරුමට සමගාමීව 2024.05.30 දින සිට පරිසර සතියක් ප්‍රකාශයට පත් කල අතර, එය දිවයින පුරාම ක්‍රියාත්මක කරන ලදි. එම සතිය මැයි 30 දින සිට පිළිවෙලින් රුක් රෝපණ දිනය, වායු දූෂණය සහ එහි අහිතකර බලපෑම් අවම කිරීමේ දිනය, පරිසර පවිත්‍ර කිරීමේ දිනය, ජෛව විවිධත්ව සංරක්ෂණ දිනය, ජලය හා ජල මූලාශ්‍ර සංරක්ෂණ දිනය, තිරසර ඉඩම් කලමනාකරණ දිනය, ප්ලාස්ටික් අපද්‍රව්‍ය කලමනාකරණ දිනය හා ජගත් පරිසර දින සැමරුම ලෙස දිවයිනම ආවරණය වන පරිදි ක්‍රියාත්මක කරන ලදී. ජාතික සැමරුම් වැඩසටහනට සමගාමීව හරිත ප්‍රසම්පාදන ප්‍රතිපත්තිය එළිදැක්වීම රත්නපුර දිස්ත්‍රික්කයේ වර්ණගලවත්ත පරිසර ආරක්ෂණ කලාපය ප්‍රකාශයට පත් කිරීම, හොඳම හරිත දුම්රිය ස්ථාන 10 ක් සඳහා ත්‍යාග හා සහතික පත්‍ර ප්‍රදානය කිරීම සිදු කරන ලදී.

**කාන්තාරකරණය සහ නියඟය පිටු දැකීමේ ජාත්‍යන්තර දිනය සැමරීම**

**(2024 ජුනි 17)**

**"අපේ උරුමය සහ අනාගතය වෙනුවෙන් භූමිය උදෙසා එක්සත් වෙමු"** තේමාව යටතේ අනාගත පරම්පරාවන් සඳහා ඉඩම් ආරක්ෂා කිරීම සඳහා සාමූහික ක්‍රියාකිරීමේ අවශ්‍යතාව අවධාරණය කරමින් පරිසර අමාත්‍යාංශ ශ්‍රවනාගාරයේදී පාර්ශවකාර ආයතන දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.

**කඩොලාන පරිසර පද්ධති සංරක්ෂණය සඳහා වූ අන්තර්ජාතික දින සැමරුම**

**(2024 ජුලි 26)**

පුත්තලම දිස්ත්‍රික්කයේ පුබුදුගම කඩොලාන සංරක්ෂිත වනාන්තරය ආශ්‍රිතව පවත්වන ලදී. මෙහිදී හායනයට පත් වී ඇති හෙක්ටයාර 15.3 ක පමණ කඩොලාන පරිසර පද්ධති ප්‍රදේශයක, කඩොලාන ප්‍රතිෂ්ඨාපන කටයුතු විද්‍යානුකූලව ආරම්භ කරන ලදී. මෙදින කඩොලාන පරිසර පද්ධති සංරක්ෂණය කිරීම සඳහා සාමූහික කැපවීම සහ පාරිසරික දැනුවත්භාවය වැඩි දියුණු කිරීමද මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මගින් සිදු කරන ලදී.

**ජගත් ඕසෝන් දිනය සැමරීම**

**(2024 සැප්තැම්බර් 16)**

“දේශගුණ ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීම යන මැයෙන් 2024 වර්ෂයේ ඕසෝන් දින සැමරුම පරිසර අමාත්‍යාංශයේදී සිදු කරන ලදී. මෙහිදී “ශීතකාරක ප්‍රතිචක්‍රීකරණ යන්ත්‍රයක් එකලස් කිරීමේ” තරඟයේ ජයග්‍රාහකයින් සඳහා ත්‍යාග ප්‍රදානයද සිදු කරන ලදී. ඕසෝන් දින සැමරුම් උත්සවයට සහභාගීවූවන් සඳහා නිවසේ සිටුවිය හැකි පලතුරු පැලයක්ද ලබා දෙන ලදී. ඕසෝන් දින සැමරුම් උත්සවය පාදක කරගනිමින් ඕසෝන් වියන සුරැකීම සම්බන්ධයෙන් ජනතාව අතරට පණිවිඩයක් රැගෙන යා හැකි ආකාරයට සකසන ලද ටී ෂර්ට්, භාණ්ඩ රැගෙන යා හැකි බෑගයක්, කුඩයක් හා තනිරුල් පොත් සකස් කරන ලදී.

**අන්තර්ජාතික කඳුකර දින සැමරුම**

**(2024 දෙසැම්බර් 11)**




**‘තිරසර අනාගතයක් සඳහා කඳුකර විසඳුම් සෙවීම නවෝත්පාදන අනුහුරුවීම් හා තාරුණ්‍යයෙන් ඔබ්බට’** යන තේමාව පෙරදැරිව මෙවර ජාතික උත්සවය හන්තාන කඳුකරය ආශ්‍රිතව පවත්වන ලදී. කඳුකර පරිසරයන්හි ජීවත් වන ජීවී විශේෂ හඳුනාගැනීම, එම ජීවී විශේෂ ආරක්ෂා කිරීමෙන් ජෛවවිවිධත්වය සුරැකීම සඳහා මෙම වසරේ තේමාවට අදාලව යොවුන් පරපුර දායක කර ගැනීම අරමුණ කර ගනිමින් විශ්වවිද්‍යාල මහාචාර්යවරුන් සහ පරිසර විශේෂඥයින් විසින් හන්තාන කඳුකරයේ පාරිසරික වැදගත්කම සහ ශාක හා සත්ව විශේෂ විවිධත්වය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් සහ ක්ෂේත්‍ර චාරිකාවක් සිදු කරන ලදී.

## 2.1.11 ආයතනික කටයුතු

| | |
|---|---|
| **බඳවා ගැනීම්** | |
| නීති නිලධාරී | 01 |
| **සේවා ස්ථිර කිරීම්** | |
| දීපව්‍යාප්ත සේවා | 01 |
| කාර්යාල සේවක සේවය | 02 |
| **උසස් කිරීම්** | |
| දීපව්‍යාප්ත සේවා | 01 |
| රාජ්‍ය කළමණාකරන සේවය | 02 |
| සංවර්ධන නිලධාරී සේවය | 10 |
| කාර්යාල සේවක සේවය | 02 |
| **විශ්‍රාම ගැන්වීම්** | |
| රාජ්‍ය කළමනාකරණ සේවය | 03 |
| ඒකාබද්ධ රියදුරු සේවය | 04 |
| **ඉල්ලා අස්වීම්** | |
| සංවර්ධන නිලධාරී | 04 |
| **තනතුර අතහැරයාම්** | |
| සංවර්ධන නිලධාරී | 06 |
| **ණය ලබා දීම්** | |
| ආපදා ණය | 108 |
| දේශීය නිවාඩු රාජ.පරි.ච.14/2022 | 03 |
| විදේශ නිවාඩු රාජ්‍ය.පරි.ච. 14/2022 | 03 |
| හැඳුනුම්පත් සකස් කිරීම් | 17 |
| පාර්ලිමේන්තු ප්‍රශ්න සඳහා පිළිතුරු ඉදිරිපත් කිරීම | 07 |
| **වාර්ෂික වාර්තා හා කාර්ය සාධන වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම්** | **02** |
| **සහනදායී පදනම මත වාහන ආනයන බලපත්‍ර නිකුත් කිරීම්** | **15** |
| **අමාත්‍ය මණ්ඩල සංදේශ** | **20** |

## 2.1.12 මානව සම්පත් සංවර්ධන

ජාතික අයවැය චක්‍රලේඛ අංක 01/2024 යටතේ ඇති ප්‍රතිපාදන අනුව දේශීය පුහුණු වැඩසටහන් පැවැත්වීම සඳහා රජයේ වියදම් පාලනය කිරීමට යටත්ව 2024 වර්ෂය සඳහා මානව සම්පත් සංවර්ධන ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමට අදාළව පුහුණු වැඩසටහන් පැවැත්වීම සේවා ව්‍යවස්ථාව, බඳවා ගැනීමේ ප්‍රතිපත්ති සහ චක්‍රලේඛ ප්‍රකාරව අදාළ නිලධාරීන් විසින් ඉටු කළ යුතු අනිවාර්ය පුහුණු ක්‍රියාකාරකම් සඳහා මූලිකත්වය දෙමින් සැලසුම් කරන ලදී.

මානව සම්පත් සංවර්ධන අංශය විසින් අමාත්‍යාංශයේ, මධ්‍යම පරිසර අධිකාරියේ, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ සහ දේශගුණික අරමුදලේ නිලධාරීන් සියයකට වැඩි පිරිසක් සඳහා විදේශ පුහුණු වැඩසටහන් මෙන්ම ජාත්‍යන්තර රැස්වීම්, සම්මන්ත්‍රණ, සමුළු සඳහා සහභාගී වීමට අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදු කර ඇති අතර රුපියල් මිලියන හතක පමණ මුදලක් එම සංචාර සඳහා දීමනා ලෙස ලබා දීමට කටයුතු කර ඇත.

## 2.1.13 අභ්‍යන්තර විගණන

අමාත්‍යාංශය හා ඊට අයත් ආයතනවල අභ්‍යන්තර පාලනය විධිමත්ව ශක්තිමත් කිරීම සඳහා අභ්‍යන්තර විගණන අංශය පිහිටුවා ඇත.

අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය විසින් 2024 වර්ෂය සඳහා සංශෝධිත විගණන සැලැසුම යටතේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර්තා ඇතුලත්ව විගණන වාර්තා 26 ක් නිකුත් කිරීමට සැලසුම් කර ඇත.

ඒ අනුව 2024.12.31 දක්වා, විගණන කළමනාකරණ කමිටු රැස්වීම් 03 ක් පවත්වා ඇති අතර ඊට අදාළ කමිටු වාර්තා නිකුත් කර ඇත. විගණන කටයුතු අවසන් කරන ලද විගණන වාර්තා 20 ක් ඉදිරිපත් කර තිබේ. විගණන සැලසුමට පරිබාහිරව විශේෂ විමර්ශන 01 ක් සිදු කර ඇත.

## 2.1.14 පරිසර ගැටළු පිළිබඳ මහජන පැමිණිලි, අභියාචනා හා මාධ්‍ය වාර්තා

වාර්තාකරණ කාලසීමාවට අදාලව පරිසර අමාත්‍යාංශයේ විවිධ අංශවලට, අමාත්‍යාංශයට අයත් ආයතන හා වෙනත් අමාත්‍යාංශ හා ආයතන වෙත විමර්ශන කටයුතු සඳහා පැමිණිලි 190ක් ලැබී ඇති අතර 99 සඳහා වාර්තා කැඳවා ඇති අතර පිළිතුරු ලැබීම් 71 ක් හා විමර්ශන 13 ක් සිදු කර අවසන් අතර විමර්ෂණ 28 ක් සිදු කරමින් පවතී.

ජාතික පාරිසරික පනත යටතේ අභියාචනා 22 ක් සඳහා තීරණ ලබා දී ඇති අතර, පතල් හා ඛනිජ පනත යටතේ අභියාචනා 19ක් සඳහා තීරණ ලබා දී ඇත.

## 2.1.15 නෛතික කටයුතු

| ක්‍රියාකාරකම | ප්‍රගතිය |
|---|---|
| බදුල්ල හා රත්නපුර දිස්ත්‍රික්ක වල පොලිස් නිලධාරීන් සඳහා පාරිසරික සම්බන්ධ නීති හා රෙගුලාසි පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහන් පැවැත්වීම. | රු.මි. 0.39 |
| අමාත්‍යාංශයට අදාළ උසාවි නඩු, මානව හිමිකම් නඩු සහ ඔම්බුඩ්ස්මන් නඩු සඳහා සහාය ලබා දීම | නඩු 19 |
| විශේෂයෙන් නීති කෙටුම්පත් සම්පාදකගේ එකඟතාව සහ අනුමැතිය ලබා ගැනීම සඳහා නීති ලේඛන සකස් කිරීමේදී සහාය ලබා දීම | රෙගුලාසි 01 |
| අමාත්‍යාංශය හා රේඛීය නියෝජිතායතන සම්බන්ධ ගිවිසුම සකස් කිරීම | ගිවිසුම් 33 |

## 2.2 පරිසර අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘතිවල ප්‍රගතිය

### 2.2.1 එක්ව කළමනාකරණය කිරීම: වන විද්‍යාව, කෘෂිකර්මාන්තය සහ සංචාරක අංශ වෙත ප්‍රජාව කේන්ද්‍ර කරගත් පරිසර පද්ධති මත පදනම් වූ ප්‍රවේශයන් ඒකාබද්ධ කිරීම

එක්ව කළමනාකරණය කිරීමේ ව්‍යාපෘතියේ අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ අනුරාධපුර මල්වතු ඔය ද්‍රෝණිය, මන්නාරම, පුත්තලම සහ වව්නියාවේ තෝරාගත් අත්හදා බැලීමේ භූමි දර්ශකවලට අයත් කෘෂිකර්මාන්තය, සංචාරක හා වන වගාව සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා ජෛව විවිධත්ව සංරක්ෂණය ඇතුළත් කිරීම සඳහා සාකල්‍ය භූමි දර්ශක ප්‍රවේශයක් ස්ථාපිත කිරීමයි. මල්වතු ඔය ද්‍රෝණියේ වෙන් වශයෙන් පිහිටි ප්‍රදේශ තුනක එනම් ගොඩබිම් ප්‍රදේශ දෙකක් (රිටිගල සිට මිහින්තලය යෝධ වැව /මඩු පාර- විල්පත්තුව) සහ එක් මුහුදු ආශ්‍රිත කලාපයක (මන්නාරම බොක්ක/ වන්කාලෙයි-අරිප්පු-සිලාවතුර) ඉඩම් පරිහරණය සැලසුම් කිරීම සඳහා දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය මට්ටමින් රජය සහ බහුවිධ ප්‍රාදේශිය සහ පළාත් බල ප්‍රදේශ පුරා පැතිරුණු සිවිල් සමාජය සමඟ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ඇත.

**ආක්‍රමණශීලී ආගන්තුක ජීවී විශේෂ හඳුනාගැනීම, පාලනය හා කළමනාකරණය**

ආක්‍රමණශීලී ආගන්තුක ජීවී විශේෂ හඳුනාගැනීම, පාලනය හා කළමනාකරණය පිළිබඳව අදාල පාර්ශවකාර ආයතනයන්හි රාජ්‍ය නිලධාරීන් ඇතුළුව තොරාගත් පාර්ශවකරුවන් දැනුවත් කිරීමේ හා ධාරිතා වර්ධන වැඩසටහන පාර්ශවකාර ආයතනයන්හි රාජ්‍ය නිලධාරින්ගේ සහභාගීත්වයෙන් රිටිගල වනජීවී පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානයේදී, ඔක්තෝම්බර් මස 28 හා 29 දෙදින පුරා සාර්ථකව පැවැත්විය. තවද අනුරාධපුර දිස්ත්‍රික්කයේ විද්‍යා ගුරුවරුන් සඳහා පුහුණු වැඩසටහනක් ජාතික පසු අස්වනු තාක්ෂණ ආයතනයේදි පවත්වන ලද අතර මේ සඳහා පාසැල් ගුරුවරුන් 115 පමණ සහභාගී විය. මෙහිදී මල්වතුඔය ආශ්‍රිතව ජෛවවිවිධත්වය හා එහි වැදගත්කම පිළිබඳව දැනුම ලබාදෙන ලදී.

අනුරාධපුර දිස්ත්‍රික්කයෙහි මැදවච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් මහවැවෙහි ආක්‍රමණශීලී ආගන්තුක ශාක විශේෂ ඉවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී. මෙහිදී ජපන් ජබර (Eichchornia crassipres) හා සැල්වීනියා (Salvinia molesta) යන අක්‍රමණශීලී ආගන්තුක ජලජ ශාක විශේෂ ඉවත් කිරීම සිදු කෙරුණි.

එමෙන්ම ආක්‍රමණශීලි ශාක සත්ව විශේෂ පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් මැදවච්චිය ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේදී අදාල නිලධාරීන් හා ගොවි සංවිධාන නියෝජිතයින් 100 දෙනෙකුගේ පමණ සහභාගීත්වයෙන් පැවැත්විය.



ආක්‍රමණශීලී ආගන්තුක ශාක විශේෂ ඉවත් කිරීම- මැදවච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය

**අනුරාධපුර හෝටල් පෙදෙස උද්‍යානය “ සමනල උද්‍යානයක් “ ලෙස සංවර්ධනය කිරීම**

පරිසර හිතකාමී වටපිටාවක් හරහා සමනලුන් සංරක්ෂණය කිරීම හා දැනුවත් කිරීම හා ඒ ආශ්‍රිත ඊකියා ප්‍රවර්ධනය අරමුණු කර ගනිමින් පර්චස් 110 ක වපසරියකින් යුක්ත උද්‍යානයක් සංවර්ධනය කිරීම උතුරු මැද පළාත් සභාවේ සංචාරක අමාත්‍යාංශය හා ජෛවවිවිධත්ව අංශය එක්ව කටයුතු කරනු ලබයි.

**පොල් වගාවන් ක්‍රමවත්ව පවත්වා ගෙන යාමට හා ජෛවවිවිධත්ව සංරක්ෂණය උදෙසා අලිවැට සකස් කිරීම හා වගා බිමෙහි ජෛවවිවිධත්වය ඇති කිරීම.**



අලිවැට සකස් කිරීම හා වගා බිමෙහි ජෛවවිවිධත්වය ඇති කිරීම- මැදවච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය

මැදවච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් අංක 63 , තම්මැන්නා ඇලවක වසමේ උඩුම්බුගල ගමේ ප්‍රතිලාභීන් 13 දෙනෙකුට අයත් පොල්වගා බිම්, වල් අලීන්ගෙන් ආරක්ෂා කර ගැනීම සඳහා

අලිවැට සකස් කිරීම හා වගා බිමෙහි ජෛවවිවිධත්වය වැඩිදියුණු කරමින් මිශ්‍ර බෝග වගාව හා ජීව වැට ස්ථාපනය කිරීම මේ යටතේ සිදු කරන ලදී.

මන්නාරම් දිස්ත්‍රික්කයේ නීල කාබන් (Blue Carbon) පරිසර පද්ධති හා ජෛවවිවිධත්වය පිළිබඳව දෙදින පුහුණු වැඩමුළුවක් නාවික හමුදා නිළධාරින් 60 දෙනෙකු සඳහා මන්නාරම දිස්ත්‍රික්කයේ මොල්ලිකුලම් නාවික මධ්‍යස්ථානයේදී පවත්වන ලද අතර කඩොලාන, ලවණ වගුරු, මුහුදු තෘණ හඳුනා ගැනිම සඳහා ක්ෂේත්‍ර අධ්‍යයනයක් සිදු කරන ලදී.

කෘෂිකර්ම, වනාන්තර, හා සංචාරක ක්ෂේත්‍ර සඳහා ජෛවවිවිධත්වය අනුප්‍රවාහගත කිරීමේ ක්‍රමවේදයන් පිළිබඳව මන්නාරම් දිස්ත්‍රික්කයේ හා අනුරාධපුර දිස්ත්‍රික්කයේ රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම් වැඩසටහන් පවත්වන ලදී.

**කහටගස්දිගිලිය ප්‍රදේශයේ මීමැසි පාලනය මගින් ජීවනෝපාය වැඩිදියුණු කිරීම.**

කහටගස්දිගිලිය ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ සහාය ඇතිව මී මැසි පාලනය පිළිබද තෝරාගත් ප්‍රතිලාභීන්ට අවශ්‍ය පුහුණුව ලබාදීම, තෝරාගත් ගොවිපළ වෙත මී මැසි පෙට්ටි සහ මීමැසි ජනපද බෙදා දීම සිදු කරන ලදී.

## 2.2.2 එක්සත් ජාතීන්ගේ කාන්තාරකරණය වැළැක්වීමේ සම්මුතියේ අධීක්ෂණය හා වාර්තාකරණය වැඩිදියුණු කිරීමට යොමු කිරීම සඳහා පාර්ශවකාර ආයතන හා වෘත්තිකයන්ගේ ධාරිතා සංවර්ධනය සඳහා වූ ව්‍යාපෘතිය (UNCCD) - ගෝලීය පරිසර පහසුකම - 7 -Umbrella IV

ගෝලීය පරිසර පහසුකම් වැඩසටහන(GEF) යටතේ ලැබුණු මෙම ව්‍යාපෘතිය මඟින් භූමිය පදනම් කර ගනිමින් සකස් කරනු ලැබූ ජාතික දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම සඳහා ජාතික මට්ටමේ ආයතනික හා තාක්ෂණික ධාරිතාවය වර්ධනය කිරීම මෙන්ම භූමිය සම්බන්ධ ගැටළුවලට සම්බන්ධ රාජ්‍ය ආයතනවලට සහාය ලබා දීම හා පුහුණු වැඩසටහන් පැවැත්වීම හා තාක්ෂණික උපකරණ මිලදී ගැනීමට අපේක්ෂා කෙරේ.

UNCCD ව්‍යාපෘතිය මඟින් ශ්‍රී ලංකාවේ භූමි හායනය පිළිබඳව තත්ත්ව වාර්තාකරණය සඳහා අවශ්‍යය දත්ත රැස්කර, දත්ත පද්ධතියක් ස්ථාපිත කිරීම මේ වන විට ආරම්භ කර ඇත. කාන්තාරණය වැළැක්වීමේ සම්මුතියේ (UNCCD) වාර්තාකරණ ව්‍යාපෘතිය මගින් එම ව්‍යාපෘතියේ ජාතික වාර්තාකරණ කාර්යය සඳහා වැදගත්වන දත්ත හා තොරතුරු ජනනය කරනු ලබන ආයතනවල නිලධාරීන් සඳහා ධාරිතා සංවර්ධන වැඩමුළු පැවැත්වීම යටතේ වනරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් හා පරිසර අමාත්‍යාංශයේ නිලධාරීන් සඳහා QGIS වැඩමුළු දෙකක් නිලධාරීන් 100 දෙනෙකු සඳහා පවත්වන ලදී. පළමු වැඩසටහන 2024.10.20 සිට 2024.10.24 දින දක්වාත්, දෙවන පුහුණු වැඩසටහන 2024.11.25 සිට 2024.11.28 දක්වාත් නුවරඑළිය, සඳතැන්නහි පිහිටි ශ්‍රී ලංකා වන විද්‍යායතනයේදී සාර්ථකව පවත්වන ලදී.

## 2.2.3 ශ්‍රී ලංකාව තුල මොන්ට්‍රියල් සන්ධානයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම

ඕසෝන් වියන සුරැකීම සඳහා වූ වියානා සම්මුතිය හා ඕසෝන් ක්ෂය කාරක ද්‍රව්‍ය පාලනය සඳහා වූ මොන්ට්‍රියල් සන්ධානයේ පාර්ශවකරුවෙකු වශයෙන් 1989 වසරේ සිට ශ්‍රී ලංකාව, ඕසෝන් ස්ථරය ආරක්ෂා කිරීම සඳහා එම පාර්ශව කමිටුව විසින් ගනු ලබන තීන්දු තීරණ ක්‍රියාත්මක කරනු ලබයි.

මේ යටතේ හයිඩ්‍රොක්ලෝරෝෆ්ලෝරෝකාබන් (HCFC) ශ්‍රේණියේ රසායන ද්‍රව්‍යයන් 2030 වන විට 100%ක් පරිභෝජනය අවම කිරීමට අපේක්ෂිත වන අතර 2024 සිට 2045 දක්වා කාලරාමුව තුල HFC අවම කිරීමේ අපේක්ෂිත වන අතර 2024 සිට 2045 දක්වා කාලරාමුව තුල HFC අවම කිරීමේ කළමනාකරණ සැලැස්ම සකස් කරමින් පවතී. ඒ අනුව HCFCs ආනයනය කිරීම පාලනය කිරීම සඳහා බලපත්‍ර ක්‍රමවේදය ක්‍රියාත්මක වීම හා කෝටා නිකුත් කිරීම සිදු වේ.

ඕසෝන් ක්ෂයකාරක රසායන ද්‍රව්‍යයක් වන හයිඩ්‍රොෆ්ලෝරෝකාබන් අදියර ගතව ඉවත් කිරීමේ කළමනාකරණ සැලැස්ම මේ වන විට ක්‍රියාත්මක වෙමින් පවතී. ඕසෝන් ක්ෂයකාරක ද්‍රව්‍ය (ODS) හා ඕසෝන් ක්‍ෂයකාරක නොවන

රසායන ද්‍රව්‍යයන් පරිභෝජනය පාලනය කිරීම හා නියාමනය සඳහා ආයතනික ශක්තිමත් කිරීම යන සංරචකය 2023-2024 කාලරාමුව තුල ක්‍රියාත්මක වෙමින් පවතී.

ජාතික ඕසෝන් ඒකකය හා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) එක්ව කිගාලි ක්‍රියාත්මක කිරීමේ සේවා ක්ෂේත්‍රයේ උපායමාර්ග හා ක්‍රියාත්මක සැලැස්ම සැකසීම සකස් කර අවසන් කරන ලදී.

ඕසෝන් ක්ෂකාරක නොවන රසායන ද්‍රව්‍යයන් ශිතකරණ හා වායුසමන ක්ෂේත්‍රයේ හා අනෙකුත් ක්ෂේත්‍රයන් ශක්තිමත් කිරීම සඳහා අදාල පාර්ශවකරුවන් ශක්තිමත් කිරීම එම ක්‍රියාවලින් විධිමත් කිරීම සහ වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයේ ධාරිතා වර්ධනය කිරීම වැනි කටයුතු සම්බන්ධයෙන් දත්ත හා තොරතුරු සමීක්ෂණය හා විශ්ලේශණය මඟින් KIP (Kigali Implementation Plan) උපාය මාර්ගය හා ක්‍රියාකාරී සැලැස්මේ ක්‍රියාක්මක කිරීමේ සංරචකය සකස් කර නිම කරන ලදී.

ශ්‍රී ලංකා රේගු ආයතනයේ නිලධාරීන් සඳහා පුහුණු කිරීම, දැනුවත් කිරීම හා ධාරිතා වර්ධනය කිරීමේ වැඩසටහන් පවත්වන ලද අතර අදාල පාර්ශවකරුවන් සමඟ ද ව්‍යාපෘති මෙහෙයුම් කමිටු රැස්වීම පවත්වන ලදී .

HCFC ආනයන පංගු ක්‍රමවේදය යටතේ 2024 වර්ෂය තුළදී කෝටා නිකුත් කිරීම සඳහා වන (quota distribution) ඕසෝන් ප්‍රහීනකාරක රසායනික ද්‍රව්‍ය පාලනය සඳහා ක්‍රියාත්මක යාන්ත්‍රණය යටතේ HCFC 159065.6kg ක් ආනයනය කිරීමට සුදුසුකම් ලත් ආයතන 19 ක් හා HFC 1,119,155CO2 Tons ආනයනය කිරීමට සුදුසුකම් ලත් ආයතන 37 කට බෙදා දෙන ලදී. මෙම කෝටාව ආනයනය කිරීමේදී ජාතික ඕසෝන් ඒකකයේ නිර්දේශය මත ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ ආනයන පාලන බලපත්‍රයක් සහිතව ආනයනය කිරීම සිදු කරන අතර **HFC** පසුවිපරම් කිරීම සඳහා ශ්‍රී ලංකා රේගුවේ **ASYCUDA** පද්ධතියට පිවිසීමට හැකියාව ලැබී ඇත.

ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු අධිකාරිය (NAITA) හා තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) සමඟ එක්ව කාර්මික ශිල්පීන් 97ක් සඳහා මුල්‍ය හා තාක්ෂණ දායකත්වය ලබාදී ඇත. එම කාර්මික ශිල්පීන්ගේ හැකියාවන් වර්ධනය කිරීම සඳහා කඩිනම් තාක්ෂණික වැඩමුළු 02 ක් පවත්වන ලදී.

පෙර ඉගෙනුම් පාදක ඇගයීම් ක්‍රමවේදය ඔස්සේ (RPL) සහතිකරණයක් ලබාගත් කාර්මිකයින් සඳහා, බලපත්‍රලාභී කාර්මිකයකුවීම සඳහා අවශ්‍ය මූලික කටයුතු මහජන උපයෝගිතා කොමිෂන් සභාව (PUCSL) සමඟ සහයෝගීව සිදු කරන ලදී. තවද RAC කාර්මික ශිල්පීන් 326 දෙනෙකු NVQ මට්ටම 3 ලබා ගන්නා ලදී.

පරණ මධ්‍යම වායුසමන යන්ත්‍ර ඉවත් කිරීමට උපාය මාර්ග සකස් කිරීම හා වඩාත් කාර්යක්ෂම ක්ෂේත්‍රයන් හඳුන්වා දීම සඳහා මධ්‍යම වායුසමන යන්ත්‍ර (chillers) සමීක්ෂණය පිළිබඳ වාර්තාවක් සුනිත්‍ය බලශක්ති අධිකාරිය සමඟ ජාතික ඕසෝන් ඒකකය එක්ව සකස් කරන ලදී.

ශීතන බහාළුම් හා ජංගම වායුසමන ක්ෂේත්‍රය පිළිබඳ පුහුණුවන්නාගේ මාර්ගෝපදේශය හා පුහුණු කරන්නාගේ මාර්ගෝපදේශය තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) මගින් කෙටුම්පත් කර ජාතික ඕසෝන් ඒකකය වෙත යොමු කර ඇත.

**HFCs** සඳහා විකල්ප ලෙස භාවිතා කරන ශීතකාරක ගිනි ගන්නා සුළු විෂ සහිත වන අතර ඒවා අඩංගු උපකරණ සහ ශීතකාරක සඳහා ප්‍රමිතීන් සකස් කිරීම සඳහා පේරාදෙණිය විශ්ව විද්‍යාලයෙන් උපදේශන සේවාව ලබා ගන්නා ලදී.

## 2.2.4 සමුද්‍රීය අපද්‍රව්‍ය සහ ක්ෂුද්‍ර ප්ලාස්ටික්: ප්ලාස්ටික් අපද්‍රව්‍ය පරිසර හිතකාමී ලෙස කළමනාකරණය කිරීම ප්‍රවර්ධනය කිරීම සහ ප්ලාස්ටික් අපද්‍රව්‍ය ජනනය වැළැක්වීම සහ අවම කිරීම

මෙම ව්‍යාපෘතිය පරිසර අමාත්‍යාංශය සහ ජපානයේ ගෝලීය පරිසර උපාය මාර්ග ආයතනය (IGES) විසින් UNEP/BRS ලේකම් කාර්යාලයෙහි සහයෝගය ඇතිව ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කෙරේ. මෙම ව්‍යාපෘතිය සඳහා අරමුදල් සපයනු ලබන්නේ සංවර්ධන සහයෝගීතාවය සඳහා වූ නෝර්වීජියානු නියෝජිතායතනය (NORAD) විසිනි. ව්‍යාපෘතියේ පරමාර්ථය වන්නේ රට තුළ ගොඩබිම ආශ්‍රිත ක්‍රියාකාරකම්වලින් සමුද්‍රීය අපද්‍රව්‍ය සහ ක්ෂුද්‍ර ප්ලාස්ටික් ජනනය වැළැක්වීම සහ සැලකිය යුතු ලෙස අඩු කිරීම මගින් තිරසාර සංවර්ධන ඉලක්ක (SDG) ඉලක්ක 14.1 වෙත දායක වීමය.

ව්‍යාපෘතිය මගින් ද්‍රව්‍ය ප්‍රවාහ විශ්ලේෂණය (Material Follow Analysis) ක්‍රමය හරහා ජාතික ප්ලාස්ටික් අපද්‍රව්‍ය ඉන්වෙන්ටරිය "National Plastic Waste Inventory for Sri Lanka: A Material Flow Approach" පරිසර අමාත්‍යාංශය සහ ජපානයේ ගෝලීය පරිසර උපාය මාර්ග ආයතනය (IGES), පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ උපදේශනය සමඟින් සකස් කර ප්‍රකාශ කර ඇති අතර 'ශ්‍රී ලංකාවේ කුඩා හා මධ්‍ය පරිමාණ හෝටල් ක්‍රියාකරුවන්ගේ ප්ලාස්ටික් භාවිතය අවම කිරීම සඳහා තිරසාර පිළිවෙත්' "Towards Plastic Free Hospitality- A Guide to Manage Plastic Waste at Small and Medium Hotels in Sri Lanka" සඳහා මාර්ගෝපදේශයක් සකස් කර ප්‍රකාශ කර ඇත.

එමෙන්ම ප්ලාස්ටික් අපද්‍රව්‍ය සහ සමුද්‍රීය අපද්‍රව්‍ය අවම කිරීම සඳහා ක්‍රියාකාරකම් පදනම් කරගත් ප්‍රවේශයක් තුළින් සිසුන් දැනුවත් කිරීම සඳහා " Marching with the Next Generation towards a plastic waste-free future in Sri Lanka " පිළිබඳ ගුරු මාර්ගෝපදේශ පොත සහ ශිෂ්‍ය ක්‍රියාකාරකම් පොතේ කෙටුම්පත සකස් කරන ලද අතර 5 වන අන්තර් රාජ්‍ය සාකච්ඡා කමිටුව (Intergovernmental Negotiating Committee 5) සඳහා සූදානම් වීම සඳහා රැස්වීම් පැවැත්විණි.

## 2.2.5 මිනමාටා සම්මුතියට අයත් විශේෂිත ජාත්‍යන්තර වැඩසටහන යටතේ ක්‍රියාත්මක රසදිය අඩංගු හා රසදිය මිශ්‍ර වූ අපද්‍රව්‍ය අවම කිරීම සඳහා ජාතික ධාරිතා වර්ධන ව්‍යාපෘතිය

මිනමාටා සම්මුතියට අයත් විශේෂිත ජාත්‍යන්තර වැඩසටහන (Specific International Programme) සහ එක්සත් ජාතීන්ගේ පාරිසරික වැඩසටහන (United Nations Environmental Programme) එක්ව රුපියල් මිලියන 32.15 මූල්‍ය පහසුකම් සලසන මෙම ව්‍යාපෘතියෙහි මූලික අරමුණ වන්නේ රසදිය අන්තර්ගත හෝ රසදිය මිශ්‍ර අපද්‍රව්‍ය පරිසර හිතකාමී ලෙස බැහැර කිරීම හා කළමනාකරණය සඳහා අවශ්‍ය ජාතික ධාරිතා වර්ධනය මගින් ශ්‍රී ලංකාව තුල මිනමාටා සම්මුතිය ක්‍රියාත්මක කිරීමට සහාය දැක්වීම වේ.

මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන සංරචක ලෙස කාර්මික, සෞඛ්‍ය හා අධ්‍යාපන අංශවල භාවිතා වන රසදිය අන්තර්ගත නිෂ්පාදන වෙනුවට භාවිතා කල හැකි රසදිය අන්තර්ගත නොවන පරිසර හිතකාමී විකල්ප නිෂ්පාදන හඳුන්වා දීම, රසදිය අන්තර්ගත අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා ජාතික මාර්ගෝපදේශ හඳුන්වාදීම සහ කාර්මික, සෞඛ්‍ය, අධ්‍යාපන අංශවල ධාරිතා වර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ඇතුළුව රසදිය අන්තර්ගත අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳව එම අංශ සහ සාමාන්‍ය ජනතාව දැනුවත් කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හඳුනාගෙන ඇත. ඒ අනුව, කර්මාන්ත, අධ්‍යාපන, සෞඛ්‍ය සහ ගෘහාශ්‍රිත ක්ෂේත්‍ර සම්බන්ධයෙන් දේශීයව හෝ ජාත්‍යන්තරව පවතින රසදිය රහිත විකල්ප ලැයිස්තුවක් සකස් කරන ලද අතර ශක්‍ය විකල්ප හඳුනාගැනීම සඳහා පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණයක් සිදු කරන ලදී. එමෙන්ම රසදිය රහිත විකල්ප පිළිබඳ පිළියෙළ කරන ලද වාර්තාව මගින් ඉහත අංශවල නිෂ්පාදන හා ක්‍රියාවලීන්ට අදාළ මිනමාටා සම්මුතියේ වගකීම් ඉටු කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කරයි.

තවද රසදිය අඩංගු උපකරණ සඳහා විකල්ප ප්‍රදර්ශනය කිරීම මෙම ව්‍යාපෘතිය යටතේ හඳුනාගත් එක් ක්‍රියාකාරකමක් වේ.

මෙය ක්‍රියාත්මක කිරීම සඳහා 'රිජ්වේ ආර්යා ළමා රෝහල' තෝරා ගන්නා ලද අතර, රෝහලෙහි භාවිත වන රසදිය රුධිර පීඩන මාපක, රසදිය උෂ්ණත්වමාන හා CFL බල්බ, රසදිය රහිත විකල්ප මගින් ප්‍රතිස්ථාපනය කිරීම සඳහා ව්‍යාපෘතිය සහාය දැක්විය. ඒ අනුව රෝහල සඳහා ඇනරොයිඩ් රුධිර පීඩන මාපක 120 ක්, ඩිජිටල් උෂ්ණත්වමාන 200 ක් සහ LED බල්බ 1400 ක් ලබා දෙන ලදී.



රිජ්වේ ආර්යා ළමා රෝහල සඳහා ඇනරොයිඩ් රුධිර පීඩන මාපක ඩිජිටල් උෂ්ණත්වමාන ලබා දීම

මෙමගින් රිජ්වේ ආර්යා රෝහලේ ඉවතලන CFL / ප්‍රතිදීප්ත බල්බ කිලෝග්‍රෑම් 295.6ක්, මුල්ලේරියාව ජාතික මානසික සෞඛ්‍ය ආයතනයේ CFL /ප්‍රතිදීප්ත බල්බ කිලෝග්‍රෑම් 629

ක් සහ ශ්‍රී ලංකා ජාතික රෝහලේ CFL/ප්‍රතිදීප්ත බල්බ කිලෝග්‍රෑම් 968.5ක් ප්‍රතිචක්‍රීකරණය කිරීමට පහසුකම් සලසා ඇත. රසදිය අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා වන ජාතික තාක්ෂණික මාර්ගෝපදේශ අදාළ පාර්ශවකරුවන්ගේ සහභාගීත්වයෙන් පවත්වන ලද වැඩමුළු මාලාවක් හරහා සකස් කර ඇත. මෙම මාර්ගෝපදේශ ජීවන චක්‍ර ප්‍රවේශය අනුගමනය කරමින් සකස් කර ඇති අතර මෙමගින් ප්‍රසම්පාදන අදියරේ සිට හැසිරවීම, අන්තර්කාලීන ගබඩා කිරීම, අපද්‍රව්‍ය වෙන් කිරීම සහ ගබඩා කිරීම හා අවසානයේ රසදිය ආශ්‍රිත ද්‍රව්‍ය ඇසුරුම් කිරීම සහ ලේබල් කිරීම, ආරක්ෂිතව ප්‍රවාහනය සඳහා දක්වා අවශ්‍ය තාක්ෂණික මාර්ගෝපදේශ සපයයි.

පුහුණුකරුවන් පුහුණු කිරීමේ (TOT) වැඩසටහන් තුනක් සහ කර්මාන්ත, සෞඛ්‍ය හා අධ්‍යාපන අංශ සඳහා පුහුණු වැඩසටහන් 17 ක් ඇතුළු පුහුණු වැඩසටහන් මාලාවක් ක්‍රියාත්මක කරන ලදී. රසදිය අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා පුහුණු මොඩියුල 06කින් සමන්විත පුහුණු විෂය මාලාවක් සකස් කල අතර ඉහත විෂය මාලාව මත පදනම්ව සියලුම පුහුණු වැඩසටහන් පවත්වන ලදී.

පුහුණු වැඩසටහන්වලට අමතරව රසදිය අඩංගු උපකරණ සහ නිෂ්පාදන ආරක්ෂිතව හැසිරවීම පිළිබඳ දැනුවත් කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් 25ක් පවත්වා ඇත. මීට අමතරව, ඉලක්ක කණ්ඩායම් සහ රටේ සාමාන්‍ය ජනතාව දැනුවත් කිරීම සඳහා රසදිය කළමනාකරණය පිළිබඳ අත් පත්‍රිකා සහ පෝස්ටර් සකස්කර ඇත.

## 2.2.6 කෘෂිකර්ම, වනාන්තර හා වෙනත් ඉඩම් පරිහරණ ක්ෂේත්‍ර සඳහා විනිවිදභාවය වැඩිදියුණු කළ රාමුවක් සකස් කිරීමේ ව්‍යාපෘතිය

කෘෂිකාර්ම, වනාන්තර හා වෙනත් ඉඩම් පරිහරණ ක්ෂේත්‍රය සඳහා විනිවිදභාවය වැඩිදියුණු කළ රාමුවක් සකස් කිරීමේ ව්‍යාපෘතිය සඳහා ගෝලීය පාරිසරික පහසුකමේ මූල්‍ය ප්‍රදානයක් යටතේ පරිසර අමාත්‍යාංශය විසින් එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ සහයෝගයෙන් ක්‍රියාත්මක කරනු ලබයි.

මෙහිදී ජාතික වශයෙන් තීරණය කරන ලද දායකත්වයට අනුකූලව දත්ත, තොරතුරු රැස් කිරීම, සත්‍යාපනය හා වාර්තාකරණය සඳහා ධාරිතා ගොඩනැගීමේ වැඩසටහන් 32 ක්, පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහනක් පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහනක් (TOT) සහ පාර්ශවකරුවන්ගේ අදහස් හා යෝජනා සඳහා සැසි දෙකක් පැවැත්විය. අදාල පුහුණු කිරීම් සඳහා අත් පොත් හා පත්‍රිකා සකස් කර පාර්ශවකරුවන්ගේ පරිශීලනයට යොමු කරන ලදී.

එමෙන්ම පැරිස් ගිවිසුමේ විනිවිදභාවය වැඩිදියුණු කළ රාමුව යටතේ වාර්තා කිරීම සඳහා අවශ්‍යතා සකස් කිරීම සඳහා දේශගුණික විපර්යාස ලේකම් කාර්යාලයේ නිළධාරීන් හා පරිසර අමාත්‍යාංශයේ අනෙකුත් අංශවල නිලධාරීන්ගේ ධාරිතා වර්ධනය කිරීම සඳහා වැඩසටහන් 08 ක් පවත්වා සියලුම වැඩසටහන් අවසානයේ දැනුම පරීක්ෂණයක් පවත්වන ලදී.

ශ්‍රී ලංකාවේ කෘෂිකාර්ම, වනාන්තර හා වෙනත් ඉඩම් පරිහරණ ක්ෂේත්‍රය සඳහා ප්‍රගතිය විනිවිදභාවයෙන් යුතුව වර්තාකිරීම සඳහා ඊට අදාළවන්නා වූ ජාතිකව නිර්ණය කළ දායකත්වයන්හි ප්‍රගතිය වාර්තාකරණයේදී හා හරිතාගාර වායු ඉන්වෙන්ට්‍රිය අවශ්‍ය දත්ත හා තොරතුරු ගබඩා කිරීම හා සත්‍යාපනය සඳහා දත්ත පද්ධතියක් සකස් කර ඇත. ඒ සඳහා අදාළ ආයතනයන්හි තාක්ෂණික දැනුම වර්ධනය සඳහා පාර්ශවකරුවන් දැනුවත්කිරීම කර ඇත. මේ සඳහා එම විෂය ක්ෂේත්‍රය පිළිබඳ පුළුල් දැනුමක් ඇති උපදේශකවරුන්ගේ සහභාගිත්වයෙන් යුතුව මෙම වැඩසටහන්/වැඩමුළු පවත්වන ලදී.



පාර්ශවකරුවන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම

තවද, වනාන්තර මැනීම හා වන යොමු මට්ටම අදාළව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර ගෙන යන අතර එම දත්ත පිළිබඳ භූමි නිරවද්‍යතාවය තහවුරු කරමින් පවතී.

ඊට අමතරව, හරිතාගාර වායු විමෝචනය හා අවශෝෂණය ගණනය සඳහා අවශ්‍ය වන්නාවූ ශ්‍රී ලංකාවට අදාල විමෝචන අගයන් ලබා ගැනීම සඳහා පර්යේෂණ ආයතන සමග වැඩ කටයුතු කරගෙන යමින් පවතී.

ජාතික විනිවිදභාවයෙන් යුතුව වර්තාකිරිමේ ක්‍රමවේදය අධීක්ෂණ සහ වාර්තාකරණ සඳහා මාර්ග සිතියම පාර්ශවකරුවන්ගේ සක්‍රීය සහභාගීත්වය ඇතිව සකස් කරන ලදී. දත්ත පද්ධතිය සඳහා දත්ත සපයන්නන් පුහුණු කිරීම සඳහා මිනුම් ප්‍රොටෝකෝලය සහ QC / QA ප්‍රොටෝකෝල සකස් කරන ලදී.

## 2.2.7. සුවදායි භූමිදර්ශ ව්‍යාපෘතිය

එල්ලංගා පාරිසරික පද්ධතිය හා එහි ජෛවවිවිධත්වය තිරසාරව නඩත්තු කිරිම තුලින් කෘෂිකාර්මික ඉඩම් තිරසාර පරිභෝජන ප්‍රවර්ධනය, ආහාර සුරක්ෂිතතාව, යහ පැවැත්ම හා පරිසර හිතකාමීත්වය ප්‍රවර්ධනය කිරීම අරමුණ ඇතිව සුවදායි භූමිදර්ශ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී.

මෙම ව්‍යාපෘතිය යටතේ තුම්බිකුලම වැව ඇතුළුව තවත් වැව් 6 ක් සංවර්ධනය කරීම, ඒ ආශ්‍රිත වගා බිම් තිරසර භූමි කළමණාකරණය අනුව සකස් කිරීම, එල්ලංගා පද්ධතිය ආශ්‍රිතව නව ආර්ථික ප්‍රවණතා සොයා බැලිම හා පාරිසරික සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමේ විභවතා හඳුනා ගැනීම, එල්ලංගා පද්ධතිය ආශ්‍රිතව රජරට විශ්වවිද්‍යාලය තුල ක්‍රියාත්මක කිරීම සඳහා පාඨමාලාවන් 2ක් හඳුන්වා දීම සහ එල්ලංගා පද්ධතිය ආශ්‍රිතව නිෂ්පාදන විකිණීම සඳහා හෙළ බොජුන් හලක් ස්ථාපනය කිරීම සිදු කරන ලදී.



හෙළ බොජුන් හල ස්ථාපනය කිරීම

# 2.3 අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල ප්‍රගතිය

## 2.3.1 මධ්‍යම පරිසර අධිකාරිය

**ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලවීම**

මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රධාන කාර්යාලය, පළාත් කාර්යාල නවය සහ ප්‍රධාන කාර්යාලයේ ජල තත්ව රසායනාගාරය ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව සහතික කර ඇති තත්ත්ව කළමනාකරණ පද්ධතියක් යටතේ ක්‍රියාත්මක වේ. ප්‍රධාන කාර්යාලය සහ පළාත් කාර්යාල සඳහා ISO 9001:2015 ලබා ගෙන ඇති අතර ප්‍රධාන කාර්යාලයේ ජල තත්ව රසායනාගාරය සඳහා ISO 17025 ලබා ගෙන ඇත.

**ජාතික පාරිසරික පනත සංශෝධනය**

මෙම වසර තුළ දී 1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනත සංශෝධනය සඳහා නීතිපති අනුමැතිය ලබා ගන්නා ලදි.

**පරිසර දූෂණ පාලනය ක්‍රියාකාරකම්**

2024 දෙසැම්බර් 31 වන විට, දිවයින පුරා බලපත්‍රලාභී කර්මාන්ත 22,501 ක් ඇති අතර, ඒවායින් 16,245 ක් 2024 වසර තුලදී නිකුත් කර ඇත. එමෙන්ම, කර්මාන්ත 429 ක් නව පාරිසරික ආරක්ෂණ බලපත් (පා.ආ.බ.) ලබා ගැනීමේ ක්‍රියාවලිය තුළ පවතින අතර, කර්මාන්ත 5,827 ක් බලපත්‍ර අළුත් කර ගැනීමේ ක්‍රියාවලිය තුල පවතී. මීට අමතරව, 2024 වසර තුලදී ම.ප.අ. විසින් නව කර්මාන්ත 1406 ක් සඳහා පාරිසරික නිර්දේශ නිකුත් කර ඇත.

පරිසර දූෂණ පාලනය සඳහා මධ්‍යම පරිසර අධිකාරිය මඟින් ක්‍රියාත්මක කරනු ලබන පාරිසරික ආරක්ෂණ බලපත්‍ර හා පාරිසරික නිර්දේශ ක්‍රියාවලින් වඩාත් විධිමත් වූ ක්‍රමවේදයක් අනුව ක්‍රියාත්මක කිරීම අරමුණු කරගනිමින් මධ්‍යම පරිසර අධිකාරියේ නිලධාරීන් සඳහා “පාරිසරික ආරක්ෂණ බලපත්‍ර සහ පාරිසරික නිර්දේශ නිකුත් කිරීම සඳහා වන ගුරු උපදෙස් මාලාව - 2024” ප්‍රකාශයට පත් කිරීම සහ “කුඩා පරිමාණ දූෂකාරක කර්මාන්ත / නියමිත කටයුතු සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම පිළිබඳ පලාත් පාලන ආයතන සඳහා මාර්ගෝපදේශ” නිකුත් කිරීම සිදු කරනු ඇත.

**කර්මාන්ත වල පාරිසරික අනුකූලතාවය සහ පසුවිපරම් කිරීම**

පරිසර හිතකාමී කර්මාන්ත පිහිටුවීම අරමුණු කරගනිමින් කර්මාන්තකරුවන් දැනුවත් කිරීමට “වී මෝල් - 2024” සහ “හුණු පෝරණු -2024” යන මාර්ගෝපදේශ මාලාවන් ප්‍රකාශයට පත් කිරීම සිදු කර ඇත.

2024 වසර තුලදී ‘අ’ කාණ්ඩයේ කර්මාන්ත 503 ක ද ‘ආ’ කාණ්ඩයේ කර්මාන්ත 2334 ක ද සහ ‘ඇ’ කාණ්ඩයේ කර්මාන්ත 1,638ක වාර්ෂික අනුකූලතා පසුවිපරම් කටයුතු සිදු කරන ලදී.

**ජල හා වායු තත්ව කළමණාකරනය කිරීම**

මධ්‍යම පරිසර අධිකාරිය විසින් පළාත් ආවරණය කරමින් කැළණි ගඟ, කළු ගඟ, නිල්වලා ගඟ දැදුරු ඔය, නුවර වැව, වැනි ප්‍රධාන ජල මූලාශ්‍ර 23 ක ජල තත්ව පසුවිපරම් ක්‍රියාවලිය අඛණ්ඩව සිදු කරනු ලබයි.

වායු තත්ව කළමණාකරනයට අදාලව පහත ක්‍රියාකාරකම් සිදු කර ඇත.

- ජාතික වායුතත්ත්ව දර්ශකය (AQI-SL) ගණනය කිරීම පිළිබඳ මාර්ගෝපදේශනය සකස් කරන ලදී.
- ශ්‍රී ලංකාවේ වායු ගුණාත්මක තත්වයෙහි හදිසි වෙනස්කම් සිදුවන අවස්ථා සඳහා හදිසි ප්‍රතිචාර දැක්වීමේ ක්‍රියාකාරී සැලැස්ම (Contingency Response Action Plan) සකස් කරන ලදී. (CRAP-DAQ-SL)
- UNEP මඟින් ප්‍රදානය කරන ලද වායු තත්ත්වය මැනීමේ අඩු වියදම් සංවේදක උපකරණ (Low Cost IQ Air Sensor) දිස්ත්‍රික්ක 05 ක (මුලතිව්, මන්නාරම, පුත්තලම, රත්නපුර, කිලිනොච්චිය) ස්ථානගත කරන ලදී.
- දිවයින පුරා වායු තත්ත්ව අධීක්ෂණ මධ්‍යස්ථාන ඒකාබද්ධ කිරීම සහ වාතයේ ගුණාත්මක තත්ත්වයන් පිළිබඳ යාවත්කාලීන තොරතුරු මහජනතාවට බෙදා හැරීම සඳහා මෘදුකාංගයක් සකස් කිරීමට අදාල කාර්යන් සිදු කරමින් පවතී.

**පාරිසරික බලපෑම් ඇගයීම් ක්‍රියාකාරකම්**

2024 වසර තුලදී, නව ව්‍යාපෘති සඳහා පාරිසරික බලපෑම් ඇගයීම් අනුමත කිරීම් 01 ක් ද මූලික පාරිසරික පරීක්ෂණ අනුමත කිරීම් 134 ක් ද ලබාදී ඇති අතර, පාරිසරික බලපෑම් ඇගයීම් අනුමත කාලය අවසන් වීමට නියමිත එහෙත් ඉදිකිරීම් කටයුතු අවසන් කර නොමැති අනුමත ව්‍යාපෘතීන් 03 ක් සඳහා වලංගු කාලය දීර්ඝ කර ඇත.

පාරිසරික බලපෑම් ඇගයීම සහ මූලික පාරිසරික පරීක්ෂණ කොන්දේසි වලට අනුකූලව අනුමත ව්‍යාපෘතීන් ක්‍රියාත්මක වේද යන්න සහතික කිරීම සඳහා අනුමත ව්‍යාපෘතීන් 31ක් පසුවිපරම් කිරීම සිදු කරනු ලදී. එමෙන්ම, පාරිසරික බලපෑම් ඇගයීම සහ මූලික පාරිසරික ක්‍රියාවලිය ක්‍රියාත්මක කරන නියෝජිත ආයතන වෙත නියමිත ව්‍යාපෘති 64ක් සඳහා තාක්ෂණික සහාය ලබාදෙන ලදී.

**උපායමාර්ගික පාරිසරික ඇගයීම ක්‍රියාකාරකම්**

මේ යටතේ කර්මාන්ත, පුනර්ජනනීය බලශක්ති සහ සංචාරක ක්ෂේත්‍ර සඳහා සිදු කරනු ලබන ජාතික උපායමාර්ගික පාරිසරික ඇගයීමේ මූලික අධ්‍යයනයන් සම්පූර්ණ කිරීම සහ අදාළ පාර්ශවකාර ආයතන විසින් ලබා දෙනු ලැබූ තොරතුරු අනුව භූගෝලීය තොරතුරු තාක්ෂණය භාවිතා කරමින් මූලික සිතියම් සැකසීම සිදු කරන ලදී.

පරිසර අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ ජනාධිපති ලේකම් කාර්යාලයේ උපදෙස් පරිදි තවද ජාතික උපායමාර්ගික පාරිසරික ඇඟයීම සිදු කිරීම හා ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් යෝජිත ත්‍රිකුණාමල වරාය ආශ්‍රිත කාර්මික සංවර්ධනය සඳහා වූ ප්‍රධාන සැලැස්ම පිළිබඳ උපායමාර්ගික පාරිසරික ඇගයීම සිදු කිරීම.

**ස්වභාවික සම්පත් කළමනාකරණය**

ලෝක තෙත්බිම් දින ජාතික වැඩසටහන 2024 පෙබරවාරි මස 2-3 යන දෙදින තුල තලවතුගොඩ දියසරු උද්‍යානයේ දී පවත්වන ලදි. මෙම වැඩසටහන ප්‍රදර්ශන කුටි 17 කින් සහ වනජීවී ඡායාරූපකරණය පිළිබඳ ප්‍රායෝගික වැඩසටහන්, තෙත්බිම් ආශ්‍රිත ක්ෂේත්‍ර අධ්‍යාපන හා දැනුවත් කිරීම් චාරිකා වැනි විවිධ ක්‍රියාකාරකම් රාශියකින් සමන්විත වූ අතර, "තෙත්බිම් සැඳෑව" තෙත්බිම් හා පරිසරය ආශ්‍රිත ගීත රසවින්දන හා විචාරාත්මක වැඩසටහනක් ද පවත්වන ලදී.

මඩකලපුව දිස්ත්‍රික්කයේ මාන්මුනායි දකුණු එරුවිල්පත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි හෙක්ටයාර් 36.42 ක ඒතාලෛයිකුලම් වැව ආශ්‍රිත තෙත්බිම් පරිසර පද්ධතිය අංක 2369/39 දරණ ගැසට් නිවේදනය මඟින් පරිසර ආරක්ෂණ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත්කරන ලදී.

රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සහ අඩවිකන්ද ග්‍රාම නිලධාරි වසම තුල සහ කෑගල්ල දිස්ත්‍රික්කයේ දැරණියගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි හෙක්ටයාර් 502.69ක වර්ණගලවත්ත ප්‍රදේශය අංක 2387/22 දරණ ගැසට් නිවේදනය මඟින් පරිසර ආරක්ෂණ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලදී.

ජාතික පාරිසරික පනතේ ප්‍රතිපාදන ප්‍රකාර ප්‍රකාශයට පත්කර ඇති පාරිසරික ආරක්ෂක ප්‍රදේශ 13 හි තිරසර පැවැත්ම උදෙසා අදාල කළමනාකරණ හා සංරක්ෂණ ක්‍රියාකාරකම් ලෙස ආක්‍රමණශීලී ශාක ඉවත් කිරීම, මායිම් කණු යොදා භූමියේ මායිම් සලකුණු කිරීම, ශාක විශේෂ විතැන් සංරක්ෂණය (Ex-situ conservation) ආදී කටයුතු සිදු කරන ලදී.

**පොලිතීන් හා ප්ලාස්ටික් රෙගුලාසි බලාත්මක කිරීම**

2024 වසර තුලදී, වැටලීම් 7,802 ක් සිදු කරන ලද අතර, නීති කඩකිරීම් 340 ක් අනාවරණය වන ලදි. එමෙන්ම, පොලිතීන් ආහාර දවටන කිලෝග්‍රෑම් 11,611.5 ක ප්‍රමාණයක් අත් අඩංගුවට ගන්නා ලදී.

**අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාකාරකම්**

උපලේඛණගත අපද්‍රව්‍ය කළමනාකරණ බලපත්‍ර (SWML) 2024 වසර තුලදී දිවයින පුරා කර්මාන්ත/ ආයතන 531 ක් සඳහා බලපත්‍ර නිකුතු කර ඇත. තවද ග්‍රීන්පාර්ක් ඒකාබද්ධ කසල කළමනාකරණ මධ්‍යස්ථානය මඟින් 2024 වර්ෂයේ දී ප්‍රතිචක්‍රීකරණය කළ නොහැකි ඝණ අපද්‍රව්‍ය ටොන් 3446.3 ක් පරිසර දූෂණය පාලනය කරමින් විධිමත් පරිදි කළමණාකරණය කර ඇත. එමෙන්ම, දිරාපත් වන අපද්‍රව්‍ය ටොන් 406.63 ක් කොම්පොස්ට් පොහොර නිෂ්පාදනය කර ඇති අතර එම නිෂ්පාදිත පොහොර වගා කටයුතු සඳහා භාවිතයට අලෙවිකර ඇත.

ශ්‍රීපාද පුදබිම සඳහා අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහනක් ක්‍රියාවට නංවන ලද අතර, එමඟින් ජනනය වන අපද්‍රව්‍ය ප්‍රමාණය අඩු කර හඳුනාගත් ප්‍රදේශය සඳහා ස්ථිර දිගුකාලීන අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්මක් ස්ථාපිත කිරීම සිදු කරනු ලබයි.

කැලණි ගඟේ ගලා යන දිරාපත් නොවන අපද්‍රව්‍ය එකතු කිරීම සඳහා යුනිලීවර් (පුද්ගලික) සමාගම සමඟ එක්ව "නිල්දහර" වැඩසටහන පවත්වන ලදී.

Online වාර්තා කරණ පද්ධතියක් ඇති කිරීම සඳහා EPR (නිෂ්පාදකයාගේ විස්තීරණ වූ වගකීම) රෙගුලාසිය ජාතික පාරිසරික පනතෙහි සංශෝධනයට ඇතුළත් කිරීම සිදු කරන ලදී.

ලෝක පරිසර දිනයට සමගාමීව ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය එක්රැස් කිරීමේ වැඩසටහනක් 2024 ජුනි මස 3-4 යන දෙදින තුල බස්නාහිර, දකුණ, නැගෙනහිර සහ ඌව පලාත් වල දිස්ත්‍රික්ක 11 ක් පුරා සංවිධානය කරන ලදී.

එක්රැස් කරන ලද අපද්‍රව්‍ය මධ්‍යම පරිසර අධිකාරියේ ලියාපදිංචි බලයලත් ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය එක්රැස් කරන්නන් වෙත භාරදෙන ලදී.

**ජාත්‍යන්තර සම්මුතීන්**

මධ්‍යම පරිසර අධිකාරිය ශ්‍රී ලංකාව තුල බාසල් සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ බලයලත් ආයතනය වන අතර, 2024 වසර තුලදී, උපද්‍රවකාරි අපද්‍රව්‍ය ආනයන අනුමැතීන් 601ක්, අපනයන අනුමැතීන් 123 ක් නිකුත් කරන ලද අතර, දේශ සීමා හරහා ප්‍රවාහනය සඳහා අනුමැතීන් 34ක් සහ ප්‍රතිනැව්ගත කිරීම් සඳහා අනුමැතීන් 19 ක් ද ලබාදෙන ලදී.

එමෙන්ම, රොටර්ඩෑම් සම්මුතියේ කාර්මික රසායනික ද්‍රව්‍ය කළමනාකරණය සඳහා වූ බලයලත් ආයතනය ලෙස ඇස්බැස්ටර්ස් ආනයනය කිරීම සඳහා ආනයන අනුමැතීන් 143 ක් සහ රසායනික ද්‍රව්‍ය ආනයනය කිරීම සඳහා ආනයන අනුමැතීන් 389 ක් 2024 වසර තුලදී ලබාදී ඇත.

**ජනාධිපති පරිසර සම්මාන**

10 වැනි "ජනාධිපති පරිසර සම්මාන - 2024" ප්‍රධානෝත්සවය 2024 ජුනි 28 වන දින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී (BMICH) පවත්වන ලදී.

එහිදි, කර්මාන්ත, පාසල්, රාජ්‍ය හා පෞද්ගලික ආයතන, පරිසර සංවිධාන, පළාත් පාලන ආයතන, නවෝත්පාදන, පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති, විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍ය යන අංශ නියෝජනය කරමින් සම්මානලාභීන් 124 දෙනෙකු එදින ජනාධිපති පරිසර සම්මාන ලබාගන්නා ලදී.



සම්මානලාභීන් 124 දෙනෙකු විසින් ජනාධිපති පරිසර සම්මාන ලබා ගැනීම

**පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීම**

අධ්‍යාපන අමාත්‍යාංශය සහ ජාතික අධ්‍යාපන ආයතනය සමඟ එක්ව ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල ගුරු අභ්‍යාසලාභීන්ව පරිසර ආරක්ෂාව හා සංරක්ෂණය පිළිබඳ දැනුවත් කිරීම සඳහා "හරිත නායක" වැඩසටහන දියත් කරන ලදී.

17 වැනි පරිසර නියමු ජාතික කඳවුර 2024 අගෝස්තු 15 සිට 18 දක්වා මහරගම ජාතික අධ්‍යාපන ආයතනයේ දී (NIE) සාර්ථකව පවත්වන ලදී. මෙම කඳවුර සඳහා ශ්‍රී ලංකාවේ සියළුම පළාත් නියෝජනය කරමින් පාසල් 57කින් රන් පදක්කම්ලාභී පරිසර නියමුවන් 230 ක් ඔවුන්ගේ ගුරුවරුන් සමඟ සහභාගී වන ලදී. මෙහි දී, පාරිසරික සාක්ෂරතාවය ඉහළ නැංවීම උදෙසා පරිසර හිතකාමී නව නිපැයුම්, ශිල්ප ප්‍රදර්ශන, ක්ෂේත්‍ර චාරිකා, සංගීත වැඩසටහන් සහ තවත් බොහෝ ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

මධ්‍යම පරිසර අධිකාරියේ ඩිජිටල්කරණයේ මූලික පියවරක් ලෙස එහි ප්‍රධාන පුස්තකාලය වන ජාතික පාරිසරික තොරතුරු මධ්‍යස්ථානය මේ වන විට ඉතා සාර්ථක ඩිජිටල් පුස්තකාලයක් ලෙස සංවර්ධනය කර ඇත.

**රුක් රෝපණ වැඩසටහන්**

2024 ලෝක පරිසර දිනයට සමගාමීව දිවයින පුරා රුක් රෝපණ වැඩසටහන් 116 ක් සංවිධානය කරන ලදී.

එමෙන්ම නිදහස් දිනයට සමගාමීව දොම්පේ මහමෙව්නාව අසපුවේ දී පැල 500 ක් සිටුවන ලද අතර අත්තිඩිය සොබාකෙත මධ්‍යස්ථානයේ දී එච්. අයි. ජාත්‍යන්තර විද්‍යාලය සහ ගල්කිස්ස උසස් බාලිකා විද්‍යාලය සමඟ රුක් රෝපණ වැඩසටහනක් සංවිධානය කරන ලදී.

ශ්‍රී ලංකාවේ දුම්රිය ස්ථාන තුල පරිසර හිතකාමී භාවිතයන් ප්‍රවර්ධනය කිරීම උදෙසා "හොඳම හරිත දුම්රිය ස්ථානය" තේරීමේ වැඩසටහන හඳුන්වාදෙන ලදී. මෙම වැඩසටහන යටතේ දී පරිසර හිතකාමී හොඳම හරිත දුම්රිය ස්ථානය තේරීම සිදුකළ අතර, දුම්රිය ස්ථානාධිපති වරුන්ගේ උත්සහාය අගය කරමින් කාණ්ඩ 02 ක් යටතේ (ප්‍රධාන දුම්රිය ස්ථාන සහ උප දුම්රිය ස්ථාන) සම්මාන පිරිනමන ලදී.

**මහජන පැමිණිලි හැසිරවීම හා විමර්ශණ කටයුතු**

මධ්‍යම පරිසර අධිකාරිය විසින් මාර්ගගත පැමිණිලි දත්ත පද්ධතියක්, පැය 24 පුරා ක්‍රියාත්මක ක්ෂණික ඇමතුම් '1981' සේවාවක් සහ වෙබ් අඩවියක් පවත්වාගෙන යනු ලබයි. 2024 වසර තුලදී මධ්‍යම පරිසර අධිකාරියට මහජන පැමිණිලි 3016 ක් ලැබී තිබූ අතර, ඉන් පැමිණිලි 2,347 ක් (78%) විසඳීමට කටයුතු කර ඇත. 2024 වසර තුළ විශේෂ විමර්ශන 19 ක් ලැබී ඇති අතර ඉන් 17ක් අවසන් කර ඇත.

# 2.3.2 භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය

## භූ විද්‍යා අංශය ප්‍රගතිය

| ව්‍යාපෘති | 2024 වර්ෂය සඳහා කාර්යය | 2024 ප්‍රගතිය % | සම්පූර්ණ ප්‍රගතිය % |
|---|---|---|---|
| සිතියම් අංක 19 සම්පාදනය: අලුත්ගම -ගාල්ල | දත්ත සම්පාදනය සිතියම පිළියෙල කිරීම සහ මුද්‍රණය කිරීම | 25% | 75% |
| සිතියම් අංක 15 ක්ෂේත්‍ර කටයුතු: පදියතලාව - තිම්පඩි- කණ්ඩායම 1 | ක්ෂේත්‍ර කටයුතු | 100% | 14% |
| සිතියම් අංක 15 ක් ක්ෂේත්‍ර කටයුතු: පදියතලාව - තිම්පඩි- කණ්ඩායම 2 | ක්ෂේත්‍ර කටයුතු | 100% | 14% |
| කුඹුරු වලින් එකතු කරන ලද පස් වල භූ රසායනික සහ ඛණිජ විද්‍යාත්මක ගුණ අධ්‍යනය කිරීම | රසායනික විශ්ලේෂණය | 75% | 50% |
| සිලිකා වැලි පිළිබඳ පොත් පිංචක් පිළියෙල කිරීම | පාෂාණ විද්‍යාගාර විශ්ලේෂණය සඳහා යොමු නියැදි සැකසීම | 50% | 25% |
| ISO 17025 ප්‍රතීතනය ලබාගැනීම | විශ්ලේෂණ රසායනා ගාරය - ISO 17025 ප්‍රතීතනය නැවත ලබාගැනීම සඳහා අවශ්‍ය ලිපිගොනු සැකසීම | 100% | - |
| | පාෂාණ විද්‍යාගාරය - ISO 17025ප්‍රතීතනය අයදුම් කිරීම සඳහා අවශ්‍ය ලිපිගොනු සැකසීම | 25% | 25% |

| ව්‍යාපෘති | 2024 වර්ෂය සඳහා කාර්යය | 2024 ප්‍රගතිය % | සම්පූර්ණ ප්‍රගතිය % |
|---|---|---|---|
| **වැලි සමීක්ෂණ** | | | |
| මහවැලි | ක්ෂේත්‍ර කටයුතු | 100% | 100% |
| කළු ගඟ | ක්ෂේත්‍ර කටයුතු | 100% | 100% |
| මා ඔය | ක්ෂේත්‍ර කටයුතු | 100% | 100% |
| මුන්දෙනි ආරු | ක්ෂේත්‍ර කටයුතු | 100% | 100% |
| **ගොඩවැලි සමීක්ෂණ** | | | |
| කරුවලගස්වැව | ක්ෂේත්‍ර කටයුතු | 100% | 100% |
| **පාරිසරික අධ්‍යනයන්** | | | |
| **සතික මොඩලය** මහවැලි ගඟ | ක්ෂේත්‍ර කටයුතු | 100% | 100% |
| කළු ගඟ | ක්ෂේත්‍ර කටයුතු | 100% | 100% |
| **ඒකාබද්ධ ක්ෂේත්‍ර අභ්‍යාසය 2025 (අන්තර්ජාතික න්‍යෂ්ටික අවිහරණය පිළිබඳ ගිවිසුම් සංවිධානය) –IFE 2025** | | | |
| මූලික සංවිධානය- (ව්‍යාපෘතිය කල්යන ලදී) ස්ථාන 05ක ඉදිකිරීම් සිදුකිරීමට නියමිතව තිබුණි. | ක්ෂේත්‍ර කටයුතු | 10% | 10% |
| **අනෙකුත් කටයුතු** නාවිකයන්, විශ්ව විද්‍යාල සිසුන් සඳහා වැඩමුලු පැවැත්වීම සඳහා සම්පත් දායකත්වය දෙන ලදී. | - | 100% | 100% |

## සිතියම්ගත කිරීම සහ භූ තොරතුරු ප්‍රගතිය

| ව්‍යාපෘති | 2024 වර්ෂය සඳහා කාර්යය | 2024 ප්‍රගතිය % | සම්පූර්ණ ප්‍රගතිය % |
|---|---|---|---|
| 1:50,000 චාතුර්ථික සිතියම්කරණය - සිතියම් අංක 28: ත්‍රිකුණාමලය | ක්ෂේත්‍ර කටයුතු, සිතියම් සම්පාදනය | ක්ෂේත්‍ර කටයුතු 100% සිතියම් සම්පාදනය 20% | 50% |
| 1:50,000 චාතුර්ථික සිතියම්කරණය - සිතියම් අංක 51: පදිරිප්පු | ක්ෂේත්‍ර කටයුතු | 100% | 30% |
| 1:50,000 චාතුර්ථික සිතියම්කරණය - සිතියම් අංක 57: අම්පාර | ක්ෂේත්‍ර කටයුතු | 100% | 40% |
| සවිස්තරාත්මක භූ විද්‍යාත්මක සිතියම්කරණය 1: 25,000 පරිමාණය - සිතියම් අංක 48 මාතලේ | ක්ෂේත්‍ර කටයුතු | 100% | 30% |
| | සිතියම් සම්පාදනයෙන් 20% | 100% | |
| සවිස්තරාත්මක භූ විද්‍යාත්මක සිතියම්කරණය 1: 25,000 පරිමාණය - නිලාවැලි සිතියම | ක්ෂේත්‍ර කටයුතු | 100% | 100% |
| | සිතියම් සම්පාදනය | 100% | |
| පළාත්බද ඛණිජ සම්පත් සිතියම් - බස්නාහිර පලාත් ඛනිජ සිතියම | ක්ෂේත්‍ර කටයුතු | 95% | 75% |
| | සිතියම් සම්පාදනයෙන් 50% | 75% | |
| පළාත්බද ඛණිජ සම්පත් සිතියම් - උතුරු පලාත් ඛනිජ සිතියම | ක්ෂේත්‍ර කටයුතු | 95% | 75% |
| | සිතියම් සම්පාදනයෙන් 75% | 90% | |
| ප්‍රකාශන - වාර්ෂික ඛනිජ වාර්තාව | දත්ත රැස් කිරීම | 90% | 40% |
| | වාර්තාව සම්පාදනයෙන් 10% | 100% | |
| දත්ත පද්ධති යාවත්කාලීන කිරීම - භූ තොරතුරු දත්ත පද්ධතිය | | 100% | |
| පුස්තකාලය - පොත් නැවත මුද්‍රණය කිරීම | | 75% | 75% |
| පුස්තකාලය - ධූමායනය | | 100% | 100% |
| පුස්තකාලය - KOHA මෘදුකාංගය සම්පූර්ණ කිරීම (පරිශීලක විස්තර ඇතුලත් කිරීම) | | 5% | 80% |
| පුස්තකාලය - KOHA පද්ධතිය හරහා පුස්තකාල කටයුතු ආරම්භ කිරීම | | 5% | |
| භූ කම්පන දත්ත ලබා ගැනීමේ හැකියාව වැඩිදියුණු කිරීම | භූ කම්පන මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීම | 5% | 5% |
| භූ කම්පන අවදානම් තක්සේරුව / ශ්‍රී ලංකාවේ භූ කම්පන සිතියම සකස් කිරීම | දත්ත රැස් කිරීම | 90% | 25% |
| භූ කම්පන මධ්‍යස්ථාන 04 ක් නඩත්තු කිරීම සහ භූ කම්පන නිරීක්ෂණ මධ්‍යස්ථානය ක්‍රියාත්මක කිරීම | නඩත්තු කිරීම | 90% | 95% |
| භූ කම්පන මධ්‍යස්ථානයේ ක්‍රියාකාරිත්වය | භූ කම්පන නිරීක්ෂණය | 100% | 100% |
| ශ්‍රී ලංකාව සහ ඒ අවට භූ කම්පන සහ භූ විද්‍යාව පිළිබඳ වැඩිදුර අධ්‍යනය | පර්යේෂණ වැඩසටහන් දෙකක් | 25% | 25% |

## ආදායම උපදවන කර්තව්‍යයන්

### විද්‍යාගාර

**තනි ගනුදෙනුකරුවන් සඳහා සිදු කරන ලද පරීක්ෂණයෙන් ලැබෙන සෘජු ආදායම**

| විද්‍යාගාරය | විශ්ලේෂණය කල සාම්පල ගණන | ආදායම |
|---|---|---|
| පාෂාණ විද්‍යාගාරය | 1730 | රු. 12,037,999.00 |
| විශ්ලේෂණ විද්‍යාගාරය | 402 | රු. 5,928,289.13 |

**සාම්පල පිටරට යැවීම සඳහා ලිපි නිකුත් කිරීමෙන් ලැබෙන ආදායම**

| | |
|---|---|
| විද්‍යාගාරය | රු. 2,650,500.00 |

**අභ්‍යන්තර කටයුතු, නීති කටයුතු, ශ්‍රී ලංකා රේගුව සහ රජයේ ආයතන සඳහා කරන ලද විශ්ලේෂණ (ආදායමක් නොමැත)**

| විද්‍යාගාරය | විශ්ලේෂණය කල සාම්පල ගණන | විශ්ලේෂණයෙහි වටිනාකම |
|---|---|---|
| පාෂාණ විද්‍යාගාරය | 105 (ජලය) | රු. 1,575,000.00 |
| විශ්ලේෂණ විද්‍යාගාරය | 21 | රු. 110,250.00 |

**සේවාලාභී ඉල්ලීම් මත සිදුකරන ලද ව්‍යාපෘති**

| විස්තරය | සමීක්ෂණ සංඛ්‍යාව | ආදායම |
|---|---|---|
| කෙටි ක්ෂේත්‍ර සමීක්ෂණ | ක්ෂේත්‍ර පරීක්ෂණ - 19 | රු. 2,625,513.01 |

| ව්‍යාපෘතිය | ප්‍රගතිය (%) | සටහන් |
|---|---|---|
| අරණායක, අරාව ප්‍රදේශයේ මහ-3 පොම්ප ගබඩා බල ව්‍යාපෘතියේ ශක්‍යතා අධ්‍යයනය සඳහා ද්විමාන ප්‍රතිරෝධතා සමීක්ෂණය - ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය (CECB) (උප පෘෂ්ඨීයේ ස්වභාවය හඳුනාගැනීම සඳහා පෘථිවි මැනුම් සිදු කිරීම: අසුපිණි ඇල්ල) | 100% | රු.1,101,289.28 |
| මිනිරන් සමීක්ෂණ : ලිහිණියාව | 100% | රු.666,824.60 |
| ඛනිජ වැලි සමීක්ෂණය - Vetrivel Group Lanka Pvt Ltd EL/463 | 100% | රු.1,791,107.84 |
| ඛනිජ වැලි සමීක්ෂණය - Ceylon Metal Private Limited EL/468,EL/466 | 50% | රු.1,245,304.03<br>රු.749,118.75 |
| සීගිරිය ව්‍යාපෘතිය යටතේ සිදුකරන මධ්‍යම සංස්කෘතික අරමුදල සඳහා- චිත්‍ර ගුහාව අසල සිදුකරන නවීකරණ කටයුතු | 50% | රු.1,472,733.08 |

**කැණීම් අංශය**

| ක්‍රියාව | 2024 දෙසැම්බර් 31 දක්වා භෞතික ප්‍රගතිය | | |
|---|---|---|---|
| | වාර්ෂික ඉලක්කය | ප්‍රගතිය | ප්‍රගතියේ ප්‍රතිශතය වාර්ෂික ඉලක්කයට සාපේක්ෂව / % |
| ගවේෂණ බලපත්‍ර නිකුත් කිරීම | 30 | 36 | 120.0 |
| AL/B බලපත්‍ර නිකුත් කිරීම | 1,692 | 1,330 | 78.6 |
| AL/A බලපත්‍ර නිකුත් කිරීම | 1,033 | 835 | 80.8 |
| IML/A බලපත්‍ර නිකුත් කිරීම | 64 | 64 | 100.0 |

| ක්‍රියාව | 2024 දෙසැම්බර් 31 දක්වා භෞතික ප්‍රගතිය | | |
|---|---|---|---|
| | වාර්ෂික ඉලක්කය | ප්‍රගතිය | ප්‍රගතියේ ප්‍රතිශතය වාර්ෂික ඉලක්කයට සාපේක්ෂව / % |
| IML/B බලපත්‍ර නිකුත් කිරීම | 59 | 71 | 120.3 |
| IML C & D බලපත්‍ර නිකුත් කිරීම | 2,561 | 1,984 | 77.5 |
| SPI නිකුත් කිරීම | 957 | 374 | 39.1 |
| TDL A බලපත්‍ර නිකුත් කිරීම | 28 | 45 | 160.7 |
| TDL B බලපත්‍ර නිකුත් කිරීම | 3,551 | 4,040 | 113.8 |
| අපනයන බලපත්‍ර නිකුත් කිරීම | 500 | 506 | 101.2 |
| ප්‍රවාහන බලපත්‍ර නිකුත් කිරීම | 622,000 | 840,454 | 135.1 |
| පරීක්ෂණ පිපිරීම් පැවැත්වීම | 170 | 117 | 68.8 |

## කැණීම් පුනරුත්ථාපනයේ ප්‍රගතිය

| කලාප | පුනරුත්ථාපනය කරන ලද භූමි | පුනරුත්ථාපනය යටතේ | නීති අංශය වෙත යවන ලද ගොනු ගණන | පරීක්ෂා කිරීම සඳහා ඉතිරිව ඇති ගොනු ගණන |
|---|---|---|---|---|
| අම්පාර | 235 | 19 | 0 | 27 |
| අනුරාධපුර | 326 | 39 | 73 | 18 |
| බදුල්ල | 8 | 2 | 2 | 2 |
| මඩකලපුව | 73 | 3 | 5 | 14 |
| කොළඹ | 43 | 13 | 6 | 7 |
| ගම්පහ | 146 | 45 | 43 | 24 |
| හම්බන්තොට | 46 | 14 | 18 | 5 |
| යාපනය | 35 | 32 | 15 | 17 |
| කළුතර | 52 | 30 | 15 | 7 |
| මහනුවර | 11 | 5 | 0 | 3 |
| කෑගල්ල | 19 | 16 | 0 | 11 |
| කුරුණෑගල | 247 | 57 | 46 | 77 |
| මන්නාරම | 24 | 0 | 1 | 1 |
| මාතලේ | 11 | 2 | 11 | 3 |
| මාතර | 90 | 40 | 29 | 12 |
| මොනරාගල | 78 | 8 | 21 | 11 |
| පොලොන්නරුව | 119 | 13 | 23 | 3 |
| පුත්තලම | 214 | 18 | 41 | 71 |
| රත්නපුරය | 18 | 17 | 4 | 17 |
| ත්‍රිකුණාමලය | 54 | 43 | 2 | 13 |
| වවුනියාව | 54 | 27 | 5 | 5 |
| **මුළු එකතුව** | **1903** | **443** | **360** | **348** |

## මූල්‍ය ප්‍රගතිය - 2024

| සත්‍ය - 2023 | විස්තරය | අයවැය - 2024 | සත්‍ය - 2024 | % ප්‍රගතිය |
|---|---|---|---|---|
| රු. | | රු. | | |
| 5,652,772,821 | ආදායම | 4,308,243,746 | 3,937,108,520 | **91%** |
| 1,848,024,204 | වියදම් | 1,758,939,172 | 1,638,168,953 | **93%** |
| **3,804,748,617** | **ආදායම සහ වියදම අතර වෙනස** | **2,549,304,574** | **2,298,939,567** | |
| 2,768,045,859 | රජයේ භාණ්ඩාගාරයට ගෙවීම් | 2,310,802,500 | 2,118,235,625 | |
| **1,036,702,758** | ලාභය | **238,502,074** | **180,703,942** | |
| ** රෙගුලාසි වලට අනුව, 2024 අවසාන කාර්තුව සඳහා වූ රාජ්‍ය භාග එකතු කිරීම් 2025 ජනවාරි 31 දිනෙන් අවසන් වේ. | | | | |

### 2024 වසරේ අනෙකුත් වැදගත් ක්‍රියාකාරකම්

GSMB කැණීම් ඉංජිනේරුවරුන් හට ඩ්‍රෝන උපකරණය පිළිබඳ දැනුවත් කිරීම සඳහා එක් සමීක්ෂණයක් පවත්වන පවත්වන ලද අතර, ඉන් අනතුරුව කලුතර දිස්ත්‍රික්කයේ කැනීම් භූමි 21ක්, අනුරාධපුර දිස්ත්‍රික්කයේ කැනීම් භූමි 2ක්ම, ඩකලපුව දිස්ත්‍රික්කයේ කැනීම් භූමි 14 ක්, කුරුණෑගල දිස්ත්‍රික්කයේ 24ක්, මුලතිව් දිස්ත්‍රික්කයේ 2ක්, ගම්පහ දිස්ත්‍රික්කයේ ස්ථාන 9ක්, කොළඹ දිස්ත්‍රික්කයේ ස්ථාන 12ක් සහ රත්නපුර දිස්ත්‍රික්කයේ එක් ස්ථානයක මේ වනවිට සමීක්ෂණ කටයුතු නිමවී ඇත. හම්බන්තොට වරායේ ඇති ගල් සහ ගල් කුට්ටි තොග ඉලක්ක කර ගනිමින් පාෂාණ සංචිත සහ ගල් කුට්ටි අපනයනය සඳහා GSMB විසින් අපනයන බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලියක නිරතව සිටින අතර එහි ස්ථාන දෙකෙන් එක් ස්ථානයක පරිමා සමීක්ෂණය අවසන් කර ඇත.කැණීම් බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය පිළිබඳ සවිස්තරාත්මක ඇගයීමක් සිදු කරන ලද අතර, අයදුම්පතක් භාර ගැනීමෙන් පසු පතල් බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා කැපවූ කාල රාමුවක් ස්ථාපිත කරනලදී. මෙය GSMB හි වෙබ් අඩවියේ පළ කර ඇත.

## 2.3.3 සීමාසහිත ජී එස් එම් බී ටෙක්නිකල් සර්විසස් (පුද්) සමාගම

**1. කැණීම් අංශයේ ව්‍යාපෘති**

- පිපිරුම් අධීක්ෂණ ව්‍යාපෘති
- පිපුරුම් පරීක්ෂණ වාර්තා
- GPS සමීක්ෂණ
- ශබ්ද මට්ටම මැනීම සහ පාලන සැලැස්ම
- දූලි අධීක්ෂණ වාර්තා
- භූ කම්පණ නිරීක්ෂණ
- ආර්ථික ශක්‍යතා වාර්තා
- තාක්ෂණික නිළධාරී සේවාවන්
- කැණීම් ක්ෂේත්‍රයේ ව්‍යාපෘති යෝජනා වාර්තා

**2. භූ විද්‍යා අංශයේ ව්‍යාපෘති**

- භූ විද්‍යාත්මක සිතියම් ගත කිරීම
- භූ භෞතික විද්‍යාත්මක සමීක්ෂණ
- භූ තාක්ෂණික සමීක්ෂණ
- ඛණිජ ගවේෂණ ව්‍යාපෘති
- ඛණිජ නිධි ප්‍රමාණ සමීක්ෂණ

**3. වැලි කැණීමේ ව්‍යාපෘති**

- මනම්පිටිය

**4. වැලි තොග අංගන**

- නව නගරය

## ජී එස් එම් බී ටෙක්නිකල් සර්විසස් (පුද්) සමාගමේ 2024.01.01 සිට 2024.11.31 දක්වා ප්‍රගතිය

| අයිතමය | සංරචකය | ප්‍රධාන ක්‍රියාකාරකම | ඉලක්කය 2024 රු. මිලියන | මූල්‍යමය | 2024.11.30 දක්වා අයවැයගත මුදල | 2024.11.30 දක්වා ලබා කර ගත් මුදල | % |
|---|---|---|---|---|---|---|---|
| 1.1 | වැලි කැණීම් ව්‍යාපෘති | මනම්පිටිය | 1107.3 | මූ | 1,015.02 | 995.63 | 98% |
| 1.2 | වැලි විකුණුම් අංගනය | නව නගරය | 9.25 | මූ | 8.48 | 5.26 | 62% |
| 1.3 | කැණීම් අංශය | කැණීම් ව්‍යාපෘති | 68.26 | මූ | 62.57 | 59.21 | 95% |
| 1.4 | භූ විද්‍යා අංශය | භූ විද්‍යාත්මක ව්‍යාපෘති | 32.93 | මූ | 30.19 | 9.96 | 33% |
| 1.5 | වෙනත් ආදායම් | ස්ථාවර තැන්පතු | 42.42 | මූ | 38.89 | 43.36 | 112% |
| | | වෙනත් පොලී සහ වෙනත් ආදායම් | 1.89 | මූ | 1.73 | **1.80** | 104% |
| | එකතුව | | **1262.04** | මූ | **1,156.87** | **1,115.22** | **96%** |

## වැලි ව්‍යාපෘතීන්හි ප්‍රගතිය

| සංරචකය | අයිතමය | ප්‍රධාන ක්‍රියාකාරකම | ඉලක්කය 2024 රු. මිලියන | මූල්‍ය | 2024.11.30 දක්වා අයවැයගත මුදල | 2024.11.30 දක්වා ලබා කර ගත් මුදල | % |
|---|---|---|---|---|---|---|---|
| වැලි කැණීම් ව්‍යාපෘති | 1.1 | මනම්පිටිය | 1,107.29 | මූ | 1,015.01 | 995.63 | 98% |
| වැලි විකුණුම් අංගන | 1.2 | නව නගරය | 9.25 | මූ | 8.48 | 5.26 | 62% |
| එකතුව | | | **1,116.54** | මූ | **1,023.49** | **1,000.89** | 98% |

## කැණීම් අංශයේ ප්‍රගතිය

| සංරචකය | අයිතමය | ප්‍රධාන ක්‍රියාකාරකම | ඉලක්කය 2024 රු. මිලියන | මූල්‍ය | 2024.11.30 දක්වා අයවැයගත මුදල | 2024.11.30 දක්වා ලබා කර ගත් මුදල | % |
|---|---|---|---|---|---|---|---|
| පිපිරුම් අධීක්ෂණ | 2.1 | පිපිරුම් අධීක්ෂණ | 42.02 | මූ | 38.52 | 35.24 | 91% |
| පාරිසරික බලපෑම් අධ්‍යනය සහ අධීක්ෂණ නිළධාරි සේවාවන් | 2.2 | දූලි අධීක්ෂණ | 17.49 | මූ | 16.03 | 15.27893 | 95% |
| | 2.3 | ශබ්ධ පරීක්ශණ | | | | | |
| | 2.4 | කම්පන අධීක්ෂණ | | | | | |
| | 2.5 | ආර්ථික ශක්‍යතා වාර්තා | | | | | |
| | 2.6 | පිපිරුම් සමීක්ෂණ | | | | | |
| | 2.7 | GPS වාර්තා | | | | | |

| සංරචකය | අයිතමය | ප්‍රධාන ක්‍රියාකාරකම | ඉලක්කය 2024 රු. මිලියන | මූල්‍ය/ භෞතික | 2024.11.30 දක්වා අයවැයගත මුදල | 2024.11.30 දක්වා ලබා කර ගත් මුදල | % |
|---|---|---|---|---|---|---|---|
| පාරිසරික බලපෑම් අධ්‍යානය සහ අධීක්ෂණ නිළධාරී සේවාවන් | 2.8 | තාක්‍ෂණි නිළධාරී උපදේශන | 8.74 | මූ | 8.02 | 8.69 | 108% |
| එකතුව | | | **68.26** | මූ | **62.57** | **59.21** | **95%** |

## භූ විද්‍යා අංශයේ ප්‍රගතිය:

| සංරචකය | අයිතමය | ප්‍රධාන ක්‍රියාකාරකම | ඉලක්කය 2024 රු. මිලියන | මූල්‍ය/ භෞතික | 2024.11.30 දක්වා අයවැයගත මුදල | 2024.11.30 දක්වා ලබා කර ගත් මුදල | % |
|---|---|---|---|---|---|---|---|
| භූ විද්‍යාත්මක ව්‍යාපෘති | 3.1 | සංචිත ඇස්තමේන්තු | 1.28 | මූ | 1.17 | 0.53 | 45% |
| | 3.2 | පාරිසරික අධ්‍යයනය (EIA/ IEE) | 3.50 | මූ | 3.21 | - | - |
| | 3.3 | ඛනිජ ගවේෂණය | 17.07 | මූ | 15.65 | 7.92 | 51% |
| | 3.4 | භූ තාක්ෂණික විමර්ශන | 7.00 | මූ | 6.42 | - | - |
| | 3.5 | භූ භෞතික අධ්‍යයනය | 0.50 | මූ | 0.46 | - | - |
| | 3.6 | වෙනත් භූ විද්‍යාත්මක ව්‍යාපෘති | 3.59 | මූ | 3.29 | 1.51 | 46% |
| **එකතුව** | | | **32.93** | **මූ** | **30.19** | **9.96** | **33%** |

## ස්ථාවර තැන්පතු පොලී ආදායම සහ අනෙකුත් ආදායම් වල ප්‍රගතිය

| සංරචකය | අයිතමය | ප්‍රධාන ක්‍රියාකාරකම | ඉලක්කය 2024 රු. මිලියන | මූල්‍ය/ භෞතික | 2024.11.30 දක්වා අයවැයගත මුදල | 2024.11.30 දක්වා ලබා කර ගත් මුදල | % |
|---|---|---|---|---|---|---|---|
| වෙනත් ආදායම් | 4.1 | ස්ථාවර තැන්පතු පොලී ආදායම | 42.42 | මූ | 38.89 | 43.36 | 112% |
| | 4.2 | වෙනත් පොලී සහ වෙනත් ආදායම් | 1.89 | මූ | 1.73 | 1.8 | 104% |
| එකතුව | | | **44.31** | මූ | **40.62** | **45.16** | **111%** |

# 2.3.4 ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (ප්‍රයිවට්) ලිමිටඩ්

ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (පුද්ගලික ) සමාගම 2008 අප්‍රේල් 09 වන දින සමාගම් අංක පී.වී.63781 යටතේ 2007 අංක 07 දරන සමාගම් පනතින් පිහිටුවන ලද රජය සතු සමාගමක් වන අතර 2020 සැප්තැම්බර් 25 වන දින අති විශේෂ ගැසට් පත්‍රයක් මඟින් පරිසර අමාත්‍යාංශය විෂය පථය යටතට ඇතුලත් කර ඇත. සමාගම විසින් රාජ්‍ය හා පෞද්ගලික අංශයන් සඳහා තිරසාර පාරිසරිකත්ව ව්‍යාපෘතීන් රැසක් දේශියව හා විදේශීයව ක්‍රියාත්මක කරනු ලබයි.

**නිෂ්පාදන හා සේවා**

ශ්‍රී ලංකා දේශගුණ අරමුදල විසින් තිසාර පරිසරයක් උදෙසා වූ ව්‍යාපෘතීන් හා උපදේශන සේවාවන් ක්‍රියාත්මක කරනු ලැබේ. තිරසර පරිසරයක් ගොඩනැගීම සඳහා සිදු කරනු ලබන ව්‍යාපෘතීන් සත්‍යාපනය හා වලංගුකරණය මෙන්ම උපදේශන සේවාවන් සැපයීම සමාගමේ ප්‍රමුඛ සේවා වේ.

**1.හරිතාගාර වායු සත්‍යාපනය**

ශ්‍රී ලංකා දේශගුණ අරමුදල විසින් ISO 14064–1:2018, ISO 14067:2018 හා ISO 14046 යනාදී අනුකූලතා සහතිකපත් රාජ්‍ය හා පෞද්ගලික ආයතන සඳහා පිරිනමනු ලැබේ. එසේ පිරිනමනු ලබන්නේ එම ආයතන විසින් ගණනය කරන ලද හරිතාගාර වායු විමෝචනය ශ්‍රී ලංකා දේශගුණ අරමුදල විසින් සත්‍යාපනය කිරීමෙන් අනතුරුවය. ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය විසින් ශ්‍රී ලංකා දේශගුණ අරමුදලට ඉහත සඳහන් සත්‍යාපනය ක්‍රියාවලිය සඳහා අවසර ලබා දී තිබේ.

**ජල පියසටහන් සත්‍යාපනය**

ශ්‍රී ලංකා දේශගුණ අරමුදල විසින් ජල කළමනාකරණයේ වැදගත්කම අවබෝධ කරගෙන සිටින අතර, ජල පිය සටහන් තක්සේරු කිරීමට සහ ඒ පිළිබඳ දැනුවත් කිරීමට ක්‍රියාකාරීව සිටින අතර මෙහිදී, ජල සම්පත් මත මානව ක්‍රියාකාරකම්වල සමස්ත බලපෑම සලකා බලනු ලැබේ.

**වැඩසටහන් කාබන් පියසටහන් සත්‍යාපනය**

ශ්‍රී ලංකා දේශගුණ අරමුදල විසින් යම්කිසි අවස්ථාවක ඇතිවන (වැඩ මුලුවක, උත්සව අවස්ථාවක වැනි) හරිතාගාර වායු විමෝචනය සත්‍යාපන සිදුකරනු ලැබේ. මුලපිරීම් සිදුවීම්, කාර්යයන් සහ අදාළ විශේෂ දිනය තුළ ජනනය වන කාබන් පියසටහන තක්සේරු කිරීමෙන් අනතුරුව සත්‍යාපනය කිරීම සිදුවේ.

**2. ශ්‍රී ලංකා කාබන් ණය යෝජනා ක්‍රමය**

මෙම යෝජනා ක්‍රමය මඟින් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන සුදුසුකම් ලත් කාබන් කළමණාකරන ව්‍යාපෘති ලියාපදිංචි කරන අතර අපේක්ෂිත පාර්ශව සඳහා ගුණාත්මක බව තහවුරු කළ ශ්‍රී ලාංකීය සහතික කරන ලද විමෝචන අඩු කිරීම් නිකුත් කරනු ලැබේ.

**3. පවිත්‍ර සංවර්ධන යාන්ත්‍රණය**

ශ්‍රී ලංකා දේශගුණ අරමුදල විසින් පුනර්ජනනීය බලශක්ති භාවිතයෙන් ශ්‍රී ලංකාවේ හරිතාගාර වායු විමෝචනය අවම කිරීම සඳහා පවිත්‍ර සංවර්ධන යාන්ත්‍රණය භාවිතා කිරීමට ආයෝජකයින් දිරි ගැන්වීම හා පහසුකම් සැපයීම සිදු කරනු ලැබේ.

තවද ව්‍යාපෘති සැලසුම් ලේඛනය, අධීක්ෂණ වාර්තාව, සකස් කිරීම සහ එක්සත් ජාතීන්ගේ දේශගුණික විපර්යාස පිළිබඳ රාමුගත සම්මුතියේ පවිත්‍රතා සංවර්ධන යාන්ත්‍රණය යටතේ ව්‍යාපෘති ලියාපදිංචි කිරීම සහ සහතික කරන ලද විමෝචන අඩුකිරීම් නිකුත් කිරීම සඳහා වලංගු කිරීම හා සත්‍යාපන ක්‍රියාවලියට පහසුකම් සපයනු ලැබේ.

**4. ශුද්ධ ශුන්‍ය බලශක්ති සහතිකකරණය**

ශුද්ධ ශුන්‍ය බලශක්ති සංකල්පය යනු බලශක්තිය භාවිතය මඟින් බලශක්ති සංරක්ෂණ කාර්යක්ෂමතාව සහ ස්ථානීය පුනර්ජනනීය උත්පාදනය 100% සපුරා ගනු ලැබූ බලශක්ති භාවිතය වේ.

**5. දේශගුණික ධනාත්මක සහතිකකරණය**

දේශගුණික ධනාත්මක සහතිකකරණය තුලින් ශක්තිමත් ආර්ථික වර්ධනයක් පවත්වා ගැනීමටත්,සැලකිය යුතු විමෝචනය අවම කිරිම තුලින් දිගුකාලීන යහපැවැත්මක් ලඟාකර ගැනීමටත් මඟ පෙන්වයි.

නිෂ්පාදන,සේවා හා සංවිධානයන්හි වාර්ෂික හරිතාගාර වායු විමෝචන සහතිකකරණය කිරීම මඟින් ඒවායෙහි හරිතාගාර වායු විමෝචනය පියවා ගැනීමටත් හැකියාව ලැබී ඇත. තවද දේශගුණික ධනාත්මක සහතිකය ලබා ගැනිම සඳහා ආයතනයේ මෙහෙයුම් ක්‍රියාකාරකම්හි විමෝචනය කෙරෙහි වාර්ෂිකව අවධානය යොමු කිරිම තුලින් වාර්ෂික හරිතාගාර විමෝචනය සහ එය සත්‍යාපනය කරමින් අතිරික්ත ප්‍රමාණය අළෙවි කර ගැනීමට අවස්ථාව සලසා දී ඇත.

**6. උපදේශන සේවාවන්**

කාබන් අවම ආර්ථිකයක් ගොඩනැගීම සඳහා තීරණ ගැනීමට අවශ්‍ය මඟපෙන්වීම හා නායකත්වය සපයයි. තවද ජාතික හරිත වාර්තාකරණ පද්ධතිය සඳහා උපදේශන සේවාවන් සපයයි.

## 7. SBTi (Science Based Targets Initiative)

**උපදේශනය**

ආයතන සඳහා SBTi සැකසීම සඳහා ශ්‍රී ලංකා දේශගුණික අරමුදල උපදේශන සපයයි. නවතම දේශගුණ විද්‍යාව සමඟ සමපාත වන විමෝචන අඩු කිරීමේ ඉලක්ක සැකසීමට සමාගම් සඳහා ක්‍රමානුකූල සහ විද්‍යාව පදනම් කරගත් ප්‍රවේශයක් SBTi මුල පිරීම් සපයයි.

2024 වර්ෂයේ පාරිසරික උපදේශන සේවාවන් ලෙස නෙස්ලේ කිරි ගොවිපල දත්ත රැස් කිරීමේ වැඩසටහන අදියර 3 හා 4 යටතේ ගොවිපල 69 ක් සහ එක්සත් ජාතීන්ගේ රාමුගත සංධානයේ- BTR- ව්‍යාපෘති අදියර 1 සහ 2 යටතේ පාරිසරික උපදේශන සේවාවන් පවත්වන ලදී.

**ශ්‍රී ලංකා දේශගුණ අරමුදලේ-2024 වර්ෂයේ මූල්‍ය ප්‍රගතියේ සාරාංශය**

| ක්‍රියාකාරකම් | වාර්ෂික ඉලක්ක (රු:මි.) | මූල්‍ය ප්‍රගතිය (රු:මි.) |
|---|---|---|
| හරිතාගාර වායු සත්‍යාපනය | 28.90 | 19.98 |
| වලංගුකරණය සහ සත්‍යාපනය ලියාපදිංචි කිරීම<br>SLCCS යටතේ ව්‍යාපෘති | 3.80 | 3.70 |
| ජල පියසටහන සත්‍යාපනය | 0.80 | 0.30 |
| ශුද්ධ ශුන්‍ය අපද්‍රව්‍ය /බලශක්ති සහතිකකරණය,<br>දේශගුණික ධනාත්මක සහතිකකරණය, වනාන්තර කාබන් සඳහා අනුකූලතා අවශ්‍යතා සහ ක්‍රමවේදයන් සංවර්ධනය කිරීම සහ<br>සැපයීම සහතික කිරීමේ යෝජනා ක්‍රම සහ ව්‍යාපෘති සහ අරමුදල්<br>කළමනාකරණය | 6.60 | 19.21 |
| **මුළු ආදායම (රු:මිලියන)** | **40.10** | **43.19** |

## හරිතාගාර වායු සත්‍යාපන ව්‍යාපෘති

| අනු අංකය | ආයතනයේ නම |
|---|---|
| 1 | ඇමේසන් ට්‍රේඩින් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| 2 | ට්‍රිශේල් ෆැබ්රික් |
| 3 | හෙයලීයස් ඇග්රිකල්ච |
| 4 | හැටන් නැෂනල් බැංකුව |
| 5 | DFCC බැංකුව |
| 6 | නැෂනල් ඩිවෙලොප්මන්ට් බැංකුව |
| 7 | අලයන්ස් ෆිනෑන්ස් පි එල් සි |
| 8 | සොෆ්ට්ලොජික් ලයිෆ් ඉන්ෂුවරන්ස් |
| 9 | සෙලින්කෝ ලයිෆ් ඉන්ෂුවරන්ස් |
| 10 | එම්ජේ ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ් , පෙන්ගුයින් ස්පෝර්ට්ස් වේය(ප්‍රයිවට්) ලිමිටඩ් |
| 11 | නොරිටාකේ පෝසිලෙන් |
| 12 | ඇතිමලේ ප්ලන්ටෂන් |
| 13 | ස්ට්‍රැච් ලයින් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| 14 | හේලීස් එකෝ සොලුටිඕන්ස් සේක්ට |
| 15 | ටෙක්ස්ට්‍රිප් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| 16 | G P ගර්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| 17 | හෙලිස් පියුරිෆිකේෂන් |
| 18 | හේලීස් ෆැබ්රික් සමාගම |
| 19 | බියිරහ ෆාම්ස් පි එල් සි |
| 20 | ෆෝබ්ස් සහ වෝකරස් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| 21 | ෆෝබ්ස් සහ වෝකරස් (ප්‍රයිවට්) ලිමිටඩ්( ගබඩා) |

| අනු අංකය | ආයතනයේ නම |
|---|---|
| 22 | තලවකැලේ තේ වතු සමාගම |
| 23 | හේලිස් පි එල් සි: Consumer and Retail Sector |
| 24 | හොරණ වතු සමාගම |
| 25 | කැලනිවැලි වතු සමාගම |
| 26 | හේලිස් පි එල් සි - අනෙකුත් |
| 27 | හේලිස් වතු සමාගම -මැබ්රොක් |
| 28 | හේලිස් පි එල් සි: Industry Inputs, Power & Energy Sector |
| 29 | ඇලුමෙක්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| 30 | හේලිස් පි එල් සි: Leisure Sector |
| 31 | හේලිස් Advantis |
| 32 | ඩිප් ප්‍රඩක්ට්ස් |
| 33 | ලංකා බැංකුව |
| 34 | සී.ඩී.බී බැංකුව (Citizens Development Business Finance PLC) |
| 35 | මැලිබන් සමාගම |
| 36 | ඇමේසන් ට්‍රේඩින් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| 37 | Personal Care Division, E.B. Creasy සමාගම |
| 38 | LOLC Finance PLC |
| 39 | කාගිල්ස් Food & Beverage Limited |
| 40 | මාස් කැපිටල් (ප්‍රයිවට්) ලිටිමඩ් |
| 41 | ඇරින්මා හෝල්ඩින්ස් පී එල් සී |
| 42 | Atire (ප්‍රයිවට්) ලිමිටඩ් |
| 43 | Walters Bay Teas (ප්‍රයිවට්) ලිමිටඩ් |
| 44 | හේලිස් Fentons Limited |
| 45 | කාගිල්ස් Confectionaries (ප්‍රයිවට්) ලිමිටඩ් |
| 46 | ඩීසල් සහ මෝටර් ඉංජිනේරු(ප්‍රයිවට්) ලිටිමඩ් (DIMO) |
| 47 | ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් |
| 48 | රිසය්ප්ලස් ලිමිටඩ් RECYplas Limited |
| 49 | KSPA පැකේජින් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| 50 | KSPA Accessories (ප්‍රයිවට්) ලිමිටඩ් |
| 51 | Agromet Asia (ප්‍රයිවට්) ලිමිටඩ් |
| 52 | BoardPAC (ප්‍රයිවට්) ලිමිටඩ් |
| 53 | කාගිල්ස් Convenient Foods |
| 54 | ඇතිමලේ ප්ලාන්ටේෂන් පී එල් සී |
| 55 | ට්‍රිශේල් ෆැබ්රික් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| 56 | හයිඩර්මනි ඇඟලුම් (Hirdaramani Apparel) සමාගම |

**ජල පියසටහන සත්‍යාපන ව්‍යාපෘති**

| අනු අංකය | ආයතනයේ නම |
|---|---|
| 1 | හේලිස් ෆැබ්රික් පී එල් සී |
| 2 | South Asia Textiles Limited |

**ශුද්ධ ශුන්‍ය බලශක්ති සහතිකකරණ ව්‍යාපෘති**

| අනු අංකය | ආයතනයේ නම |
|---|---|
| 1 | බොගවන්තලාව ප්ලාන්ටේෂන් පී එල් සී |

**SLCCS යටතේ ව්‍යාපෘති**

| අනු අංකය | ආයතනයේ නම |
|---|---|
| 1 | බොගවන්තලාව ප්ලාන්ටේෂන් පී එල් සී (Solar – 3rd Verification) |
| 2 | Agraoya ජල විදුලි ව්‍යාපෘති (Hydro- 5th Verification) |
| 3 | Global Sea Food (Pvt) Ltd – Solar-(Validation) |
| 4 | Global Sea Food (Pvt) Ltd – Solar-(Verification) |

**දේශගුණික ධනාත්මක සහතිකකරණ ව්‍යාපෘති**

| අනු අංකය | ආයතනයේ නම |
|---|---|
| 1 | බොගවන්තලාව ප්ලාන්ටේෂන් පී එල් සී |

## 2.3.5 මූල්‍ය ප්‍රගතිය - පරිසර අමාත්‍යාංශය

| | විස්තරය | 2024 සංශෝධිත ප්‍රතිපාදන (රු.මි) | 2024.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | වියදම (රු.මි) | අතැති බිල්පත් | මූල්‍ය % |
| **මධ්‍යම පරිසර අධිකාරිය** | | | | | |
| 1 | ප්‍රාග්ධන වියදම් | 60.00 | 59.99 | - | 100% |
| 2 | පරිසර ප්‍රවර්ධන හා දැනුවත් කිරීමේ වැඩසටහන (පරිසර ප්‍රවර්ධන, දැනුවත් කිරීම් හා හරිත සම්මාන ) | 30.00 | 28.61 | - | 95% |
| | **අනු එකතුව** | **90.00** | **88.60** | - | **98%** |
| **අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති** | | | | | |
| 1 | එක්සත් ජාතීන්ගේ කාන්තාරිකරණය පිටු දැකීමේ සම්මුතියේ වාර්තාකරන ව්‍යාපෘතිය Umbrella iv | 9.40 | 6.31 | - | 67% |
| 2 | ශ්‍රී ලංකා තුල මොන්ට්‍රියල් සන්ධානයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම . | 66.00 | 64.86 | - | 98% |
| 3 | ප්‍රජා පාදක පරිසර පද්ධති ප්‍රවේශය තුලින් වන , කෘෂිකර්ම හා සංචාරක ක්ෂේත්‍ර ඒකාබද්ධව කළමනාකරණය කිරීමේ ව්‍යාපෘතිය . | 90.00 | 45.41 | - | 50% |
| 4 | කෘෂිකර්මාන්ත, වනාන්තර හා වෙනත් ඉඩම් පරිහරණ ක්ෂේත්‍ර සඳහා විනිවිදභාවය වැඩිදියුණු කල රාමුවක් සකස් කිරීමේ ව්‍යාපෘතිය | 138.50 | 33.19 | - | 24% |
| 5 | රසදිය අඩංගු හා රසදිය මිශ්‍ර වූ අපද්‍රව්‍ය අවම කිරීම සඳහා ජාතික ධාරිතා වර්ධන වැඩසටහන. | 15.50 | 15.49 | - | 100% |
| 6 | සමුද්‍රීය අපද්‍රව්‍ය සහ ක්ෂුද්‍ර ප්ලාස්ටික් : ප්ලාස්ටික් අපද්‍රව්‍ය පරිසර හිතකාමී කළමනාකරණය කිරීම ප්‍රවර්ධනය කිරීම සහ ප්ලාස්ටික් අපද්‍රව්‍ය ජනනය වැළැක්වීම සහ අවම කිරීම . | 1.66 | 1.66 | - | 100% |
| 7 | පාරිසරික හා සමාජීය වශයෙන් සංවේදී කෘෂි පාරිසරික පද්ධති ස්ථාපිත කිරීම තුලින් භූමි හායනය අවම කිරීම හා ආහාර සුරක්ෂිතතාවය ඇති කරමින් සෞඛ්‍ය සම්පන්න ගොවිජනතාවක් හා සමෘද්ධිමත්භාවය තහවුරු කිරීම සඳහා වූ ව්‍යාපෘතිය . | 42.60 | 41.54 | - | 98% |
| 8 | හවුල්කාරීත්ව හා නව මූල්‍යකරණ ක්‍රමවේද තුලින් ශ්‍රී ලංකාවේ තෙත් කලාපයේ ජෛවවිවිධත්වය සංරක්ෂණය සහ තිරසර ඉඩම් කළමණාකරණය පිළිබඳවූ ව්‍යාපෘතිය | 1.00 | 0.75 | - | 75% |
| 9 | ශ්‍රී ලංකාවේ පළමු හා දෙවන ද්විවාර්ෂික විනිවිදභාවය පිළිබඳ වාර්තා හා හතරවන ජාතික සන්නිවේදන වාර්තාව දේශගුණික විපර්යාස පිළිබඳ එක්සත් ජාතීන්ගේ රාමුගත සම්මුතියට සකස් කිරීම | 12.84 | 2.59 | - | 20% |
| | **අනු එකතුව** | **377.50** | **211.80** | - | **56%** |
| **අමාත්‍යාංශයේ පවතින වාර්ෂික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම** | | | | | |
| 1 | අමාත්‍යාංශයේ වාර්ෂික ක්‍රියාකාරකම් ක්‍රියාවට නැංවීම (අංශ මඟින්) | 33.50 | 30.82 | - | 92% |
| 2 | පරිසර සංරක්ෂණ ජාතික වැඩසටහන | 20.00 | 14.87 | - | 74% |
| | **අනු එකතුව** | **53.50** | **45.69** | - | 85% |
| | මුළු එකතුව | 521.00 | 346.08 | - | 66% |

**ආදායම් උත්පාදන ප්‍රගතිය -2024**

| | විස්තරය | වාර්ෂික ආදායම් ඉලක්කය 2024 (රු.මි) | 2024.12.31 දිනට ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | ආදායම (රු.මි) | වාර්ෂික % | ආයෝජන (රු.මි) |
| **අමාත්‍යාංශය යටතේ පවතින ආයතන** | | | | | |
| 1 | මධ්‍යම පරිසර අධිකාරිය | 623.22 | 598.80 | 96% | - |
| 2 | භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කැනීම් කාර්යාංශය | 4,308.24 | 3937.11 | 91% | - |
| 3 | GSMB තාක්ෂණික සේවා පුද්ගලික සමාගම | 1,262.04 | 1115.22 | 88% | - |
| 4 | ශ්‍රී ලංකා දේශගුණික අරමුදල පුද්ගලික සමාගම | 40.10 | 43.19 | 108% | - |
| | **එකතුව** | **6,233.60** | **5694.32** | **91%** | - |

## 2.4 නාගරික සංවර්ධන සහ නිවාස අමාත්‍යංශය යටතේ ක්‍රියාත්මක වූ ආයතන වල ප්‍රගතිය

### 2.4.1 වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව

### 2.4.2 සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය

## 2.4.1 වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව

වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව 2024.09.27 දිනැති අංක 2403/53 දරණ අති විශේෂ ගැසට් නිවේදනය මගින් පරිසර, වනජීවී, වනසම්පත්, ජල සම්පාදන, වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය යටතට ගනු ලැබූ අතර 2024.11.25 දිනැති අංක 2412/08 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනය මගින් පරිසර අමාත්‍යාංශයට අයත් ආයතනයක් ලෙස පවතී.

**2024.12.31 දක්වා ප්‍රගතිය - සාරාංශය**

| | ව්‍යාපෘතියේ නම | ව්‍යාපෘති කාලය | TEC (රු.මි.) | 2024 ප්‍රතිපාදන වෙන් කිරීම (රු.මි.) | 2024.12.31 සමුච්චිත මූල්‍ය ප්‍රගතිය | |
|---|---|---|---|---|---|---|
| | | | | | රු.මි. | % |
| 1 | ප්‍රාග්ධන වියදම් (වෙරළ සංවර්ධන, වෙරළ සම්පත් කළමනාකරණ, වෙරළබඩ ඉංජිනේරුමය විමර්ෂණ, පර්යේෂණ හා නිර්මාණ) | 2024 ජනවාරි - දෙසැ. | 305.17 | 300.0 | 246.10 | 80 |
| **එකතුව** | | | **305.17** | **300.0** | **246.10** | **80** |

**ප්‍රගතිය - විස්තරාත්මකව**

| | ව්‍යාපෘතියේ නම/ උප සංරචක/ උප ක්‍රියාකාරකම් | ව්‍යාපෘති කාලය | TEC (රු.මි.) | 2024 ප්‍රතිපාදන වෙන් කිරීම (රු.මි.) | 2024.12.31 සමුච්චිත මූල්‍ය | | භෞතික ප්‍රගතිය % |
|---|---|---|---|---|---|---|---|
| | | | | | රු.මි. | % | |
| 1 | මීටර් 400 රිවට්මන්ට් බැම්ම ඉදිකිරීම - කළුතර කැලිඩෝ (කළුතර) 2021 සිට ක්‍රියාත්මක | 2023.02.01-2024.01.31 | 55.85 | 1.40 | 1.31 | 94 | 100 |
| 2 | මීටර් 500 රිවට්මන්ට් බැම්ම අළුත්වැඩියා කිරීම - ලුනාව , මොරටුව (කොළඹ ) 2021 සිට ක්‍රියාත්මක | 2023.02.01-2024.04.15 | 63.62 | 3.60 | 3.58 | 99 | 100 |
| 3 | මීටර් 200 දිග රිවට්මන්ට් බැම්ම ඉදිකිරීම - උතුරු උඩප්පුව (පුත්තලම) | 2024.09.01-2024.12.15 | 27.50 | 27.50 | 3.26 | 11.9 | 15 |
| 4 | ග්‍රොයින ශ්‍රේණිය ඉදිකිරීම - නින්දවූර් (අම්පාර ) (ග්‍රොයින 07) | 2023.12.01-2024.09.30 | 22.00 | 22.00 | 16.11 | 73 | 80 |
| 5 | ග්‍රොයින ශ්‍රේණිය ඉදිකිරීම - සයින්දමරුදූ සිට මාලිගායිකාඩු දක්වා (අම්පාර) | 2023.11.01-2024.08.30 | 54.17 | 44.00 | 43.31 | 94 | 100 |
| 6 | මීටර් 100 ගේබියන් බැම්ම ඉදිකිරීම - මුතූර් (ත්‍රිකුණාමලය) | 2024.05.01-2024.07.15 | 3.00 | 3.00 | 3.03 | 100 | 100 |
| 7 | වෙරළ ආරක්ෂක ව්‍යුහය ඉදිකිරීම - මැඩිහ (මාතර) | 2024.08.25-2024.10.25 | 8.00 | 8.00 | 0.26 | 3 | |
| 8 | මීටර් 250 රිවට්මන්ට් බැම්ම ප්‍රතිසංස්කරණය කිරීම මුදුකටුව (පුත්තලම) | 2024.07.15-2024.10.31 | 18.5 | 18.5 | 19.66 | 106 | 100 |
| 9 | රිවට්මන්ට් බැම්ම අළුත්වැඩියා කිරීම - කහව (ගාල්ල) | 2024.03.15-2024.09.15 | 36.5 | 36.5 | 33.96 | 91 | 100 |
| 10 | ඉරණවිල ග්‍රොයින 07 ක්ප්‍රතිසංස්කරණය (පුත්තලම) | 2024.02.15-2024.06.15 | 22.5 | 22.5 | 22.36 | 99 | 100 |

| | ව්‍යාපෘතියේ නම/ උප සංරචක/ උප ක්‍රියාකාරකම් | ව්‍යාපෘති කාලය | TEC (රු.මි) | 2024 ප්‍රතිපාදන වෙන් කිරීම (රු.මි.) | 2024.12.31 සමුච්චිත මූල්‍ය | | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|---|---|---|
| | | | | | රු.මි. | % | |
| 11 | මීටර් 120 ඇවිදින මංතීරුව ඉදිකාරිම - මිරිස්ස, බණ්ඩාරමුල්ල (මාතර) 2021 සිට ක්‍රියාත්මක | 2024.08.15 - 2024.10.15 | 7.0 | 7.0 | | 0 | |
| 12 | හදිසි වෙරළ ආරක්ෂක කටයුතු | 2024.01.01 - 2024.12.31 | 51.50 | 51.50 | 62.28 | 121 | 100 |
| 13 | වෙරළ ඉංජිනේරුමය නිර්මාණ | 2024.01.01 - 2024.12.31 | 0.5 | 0.5 | 0.02 | 4 | 100 |
| 14 | වෙරළ ඉංජිනේරු විමර්ශන සහ අධ්‍යයනයන් | 2024.01.01 - 2024.12.31 | 8.0 | 8.0 | 5.91 | 74 | 100 |
| 15 | වෙරළබඩ ජල තත්ව පරික්ෂාව | 2024.01.01 - 2024.12.31 | 3.0 | 3.0 | 1.66 | 70 | 100 |
| 16 | ජාතිකව නිර්නය කල දායකත්ව (NDC) අනුව මුහුදු මට්ටම ඉහළ යාම පුරෝකථනය කිරීම. | 2024.01.01 – 2024.12.31 | 3.0 | 3.0 | | 0 | 100 |
| 17 | ස්ථිර තුරුලතා තීරය සලකුණු කිරිම | 2024.01.01 - 2024.12.31 | 1.5 | 1.5 | | 0 | |
| 18 | විද්‍යුත් බලපත්‍ර ක්‍රියාවලිය | 2024.01.01 - 2024.12.31 | 4.0 | 4.0 | 3.58 | 89 | 100 |
| 19 | අනවසර ඉදිකිරිම් කඩා ඉවත් කිරිම, අනවසර වැලි ඉවත් කිරිම,අධීක්‍ෂණය | 2024.01.01 - 2024.12.31 | 1.0 | 1.0 | 0.3 | 30 | 100 |
| 20 | විශේෂ ප්‍රදේශ /බලපෑමට ලක්වන ප්‍රදේශ හඳුනා ගැනීම සහ කළමනාකරණය. - උල්ල වැලිවැටිය (අම්පාර) | 2024.01.01 - 2024.12.31 | | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ගැසට් කිරීම සිදු කරනු ලබන අතර GPS ලකුණු සහ නාම පුවරු සමඟ සීමා මායිම් CC&CRMD මගින් සිදු කරනු ලැබේ. | | | |
| 21 | වෙරළබඩ දූෂණය අවම කිරිම/වෙරල පිරිසිදු කිරීම් | 2024.01.01 - 2024.12.31 | 0.5 | 0.5 | 0.51 | 100 | 100 |
| 22 | පුත්තලම, අම්පාර සහ වෙඩිතලතිව් කඩොලාන නැවත වගා කිරීම සඳහා තාක්ෂණික සහාය සහ අධීක්ෂණය | 2024.01.01 - 2024.12.31 | | මෙම ව්‍යාපෘතිය 2023 දී කැස්බෑ සංරක්ෂණ ව්‍යාපෘතිය මගින් සිදු කරන ලද අතර 2024 සඳහා දීර්ඝ කිරීමක් නොමැත. | | | |
| 23 | අධ්‍යාපන/දැනුවත් කිරිමේ වැඩසටහන් | 2024.01.01 - 202.12.31 | 1.0 | 1.0 | 0.79 | 79 | 100 |
| 24 | වෙරළ සංරක්‍ෂණ සහ වෙරළ කලාප කළමනාකරණ සැලැස්ම සංශෝධනය | 2024.01.01 - 2024.12.31 | 2.00 | 2.00 | 1.09 | 54.5 | 100 |
| 25 | නිලාවේලි පරෙවි දූපත, කල්පිටිය බාධක පරය සහ මඩකලපුව කායන්කර්නි වෙරළ තීරයේ කොරල්පර ප්‍රතිසංස්කරණය සඳහා තාක්ෂණික සහාය සහ අධීක්ෂණය | 2024.01.01 - 2024.12.31 | | මෙම ව්‍යාපෘතිය IUCN මගින් සිදු කරනු ඇත | | | |
| 26 | විභව සංචාරක ස්ථාන සංවර්ධනය වෙරළ තීරය | 2024.01.01- 2024.12.31 | | CC&CRMD මගින් සංචාරක ස්ථාන හඳුනා ගැනීම සහ ව්‍යාපෘති සංකල්ප, සැලසුම් සහ EOI ඇමතුම් UDA විසින් සිදු කරනු ලැබේ. | | | |
| 27 | වෙරළ දර්ශන තීර / වෙරළ උද්‍යාන ඉදිකිරීම | 2024.01.01 - 2024.12.31 | | සමහර වෙරළ දර්ශන තීර හඳුනාගෙන ඇති අතර ඒවා විභව සංචාරක ස්ථාන ක්‍රියාත්මක කිරීමේ සැලැස්මට ඇතුළත් කර ඇත. | | | |

| | ව්‍යාපෘතියේ නම/ උප සංරචක/ උප ක්‍රියාකාරකම් | ව්‍යාපෘති කාලය | TEC (රු.මි.) | 2024 ප්‍රතිපාදන වෙන් කිරීම (රු.මි.) | 2024.12.31 සමුච්චිත මූල්‍ය රු.මි. | 2024.12.31 සමුච්චිත මූල්‍ය % | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|---|---|---|
| 28 | වෙරළ ප්‍රවේශ සැලැස්ම හඳුනා ගැනීම සහ සිතියම්ගත කිරීම, වෙරළ ප්‍රවේශ මාර්ග සංවර්ධනය කිරීම | 2024.01.01-2024.12.31 | 24.0 | 24.0 | 23.87 | 99 | 100 |
| 29 | අභ්‍යන්තර විගණන සැලැස්ම | 2024.01.01-2024.12.31 | | | | | |
| 30 | මීටර් 30ක ග්‍රොයින ව්‍යුහය ඉදිකිරීම ෆාමන්ට් ඇළ - අහංගම, හාතපැලැන - ගාල්ල | 2024.08.15-2024.10.15 | 6.0 | 6.0 | 0.11 | 1 | 10 |
| 31 | කඩොලාන තිර ප්‍රතිෂ්ඨාපනය | 2024.01.01-2024.12.31 | | | | | 100 |
| 32 | රිවට්මන්ට් බැම්ම ඉදිකිරීම, විදුලිබල මණ්ඩලයේ 33kW අධි වෝල්ටීයතා කුළුණ - උප්පාරු, කින්නියා (ත්‍රිකුණාමලය) – 2023 වර්ෂයේ සිට ක්‍රියාත්මක | 2023.11.01-2024.01.31 | 18.56 (ප්‍රතිපාදන -ලංකා විදුලිබල මණ්ඩල) | 18.56 (ප්‍රතිපාදන - ලංකා විදුලිබල මණ්ඩලය) | 18.56 | 100 | 100 |
| 33 | ධීවර තොටුපලේ දියකඩන බැම් ප්‍රතිසංස්කරණය - තල්දියවත්ත (ගම්පහ) | 2024.08.01-2024.12.31 | 44.94 (ප්‍රතිපාදන -ධීවර දෙපාර්ත මේන්තුව) | 44.94 (ප්‍රතිපාදන - ධීවර දෙපාර්තමේ න්තුව) | 12.24 | 27 | 40 |
| 34 | හු සළු ග්‍රොයින ව්‍යුහය ඉදිකිරීම - Whisky point, පොතුවිල් (අම්පාර) | 2024.10.01-2024.11.30 | 19.02 (ප්‍රතිපාදන -සංචාරක සංවර්ධන අධිකාරිය) | 19.02 (ප්‍රතිපාදන - සංචාරක සංවර්ධන අධිකාරිය) | 0.24 | 1 | 5 |
| 35 | ග්‍රොයින ශ්‍රේණිය ඉදිකිරීම - කල්මුණෛ (අම්පාර) | 2024.08.01-2024.12.31 | 60.26 (ප්‍රතිපාදන ජනාධිපති ලේකම් කාර්යාල ය) | 60.26 (ප්‍රතිපාදන - ජනාධිපති ලේකම් කාර්යාලය) | 16.17 | 10 | 40 |
| | එකතුව | | **305.17** | **300.00** | **246.10** | **82** | **80** |

**මාර්ගගත බලපත්‍ර ක්‍රියාවලිය**

| 2024.12.31 දිනට ලැබුණු අයදුම්පත් ප්‍රමාණය | සකස් වෙමින් පවතින | නිකුත් කළ ප්‍රමාණය | ප්‍රතික්ෂේපිත / අවලංගු | IEE/EIA |
|---|---|---|---|---|
| 1764 | 157 | 1312 | 295 | EIA - 01<br>IEE - 10 |

**ආදායම් උත්පාදන ප්‍රගතිය -2024**

| වාර්ෂික ආදායම් ඉලක්කය 2024 (රු.මි) | 2024.12.31 දිනට ප්‍රගතිය | |
|---|---|---|
| | ආදායම (රු.මි) | වාර්ෂික % |
| 46.80 | 82.40 | 176% |

# 2.4.2 සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය

**සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ කොළඹ වරාය කාර්යාලය පුළුල්කොට ප්‍රතිසංස්කරණය කිරීම**

කොළඹ වරායේ අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහණ සේවාව ක්‍රියාත්මක කිරීම සඳහා ආරම්භ කරන ලද සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ කොළඹ වරාය කාර්යාලය කන්ටේනර් බහාලුම් දෙකකින් සමන්විත කාර්යාලයක් විය. එය වැඩි ඉඩකඩක් සහ ඉහළ පහසුකම් සහිත කාර්යාලයක් බවට පත් කිරීම සඳහා කන්ටේනර් බහාලුම් හතරකින් සමන්විත කාර්යාලයක් බවට පුළුල්කොට නව උපකරණ සහිතව වැඩිදියුණු කර විවෘත කරන ලදී.

අලුතින් ඉදිකරන ලද වරාය කාර්යාලය පහත විශේෂාංග/ පහසුකම් වලින් සමන්විත වේ

- අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහණ සේවාව හෝ බංකර් සේවාව ලබා ගන්නා නැව් සඳහා බලපත්‍ර නිකුත් කිරීම සඳහා වන කාර්යාල පරිශ්‍රය.
- අධිකාරිය විසින් සිදු කරනු ලබන නැව් පරීක්ෂා කිරීමේ කටයුතු සඳහා අවශ්‍ය කාර්යාල පහසුකම්.
- කසළ විශ්ලේෂණය සඳහා රසායනාගාරයක් පවත්වාගෙන යාම සඳහා පහසුකම්.
- පැය 24 x දින 7 පුරාවට රාජකාරී මුරවලට සම්බන්ධ කාර්යාල කාර්ය මණ්ඩලය සඳහා නවාතැන් සහ සනීපාරක්ෂක පහසුකම්.

**CLS ව්‍යාපෘතිය - චන්ද්‍රිකා තාක්ෂණය ඔස්සේ තත්‍ය කාලීන තෙල් කාන්දු අධීක්ෂණ වැඩසටහන**

ප්‍රංශ රජයේ අනුග්‍රාහකත්වයෙන් ප්‍රංශයේ CLS ආයතනයේ දායකත්වයෙන් චන්ද්‍රිකා තාක්ෂණය මත පදනම් වූ තත්‍ය කාලීන සමුද්‍රීය දූෂණ සිද්ධි අධීක්ෂණය සඳහා වසරක නියමු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක




කෙරුණු අතර මේ ඔස්සේ නෞකා මගින් තෙල් කාන්දුවීම නිසා සිදුවූ සමුද්‍ර දූෂණ අවස්ථා කීපයක් නිරීක්ෂණය කර එම නෞකා වලට අදාලව මීලග ගමනාන්ත වරායන් වෙත එම සිද්ධීන් පිළිබඳව අන්තර්ජාතික වශයෙන් දැනුවත් කිරීම් සිදුකරන ලදී.



නව කොළඹ වරාය කාර්යාලය

**ප්‍රධාන කාර්යාලයේ මෙහෙයුම් මැදිරියක් පිහිටුවීම**

2024 වර්ෂය තුලදී සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ මෙහෙයුම් මැදිරියක් පිහිටුවීමට කටයුතු කරන ලදී. මෙහි 24 X 7 පුරාවට රාජකාරී කටයුතු ක්‍රියාත්මක කෙරේ. මෙහි නවීන තාක්ෂණික ඉලෙක්ට්‍රොනික උපකරණ සමන්විත වන අතර අදාල පාර්ශවකාර ආයතන සම්බන්ධ කර ගනිමින් හදිසි සමුද්‍ර දූෂණ අවස්ථාවකදී කඩිනම් ප්‍රතිචාර දැක්වීමට අවශ්‍ය අනෙකුත් පහසුකම් ද සහිතව ක්‍රියාත්මක වේ. මේ හරහා;

- හදිසි තෙල් හා රසායනික කාන්දුවීම් පිළිබඳ තොරතුරු දැනුම් දීම.
- සමුද්‍ර පරිසරයට සිදුවන දූෂණ කටයුතු පිළිබඳ තොරතුරු රැස් කිරීම.

- සියලුම පාර්ශවකාර නියෝජිතායතනවල ක්‍රියාකාරී දායකත්වය සමඟ හදිසි තෙල්/ රසායනික කාන්දුවීම් අවස්ථා කාර්යක්ෂමව කළමනාකරණය කිරීම ආදිය මූලික වශයෙන් අපේක්ෂා කෙරේ.

**නිල් ධජ වෙරළ ස්ථාපිත කිරීම හා සබැඳි ජාතික මට්ටමේ වැඩසටහන**

නිල්ධජ වෙරළක් යනු, පාරිසරික අධ්‍යාපනය සඳහා වූ ජාත්‍යන්තර සම්මේලනය (FEO) මඟින් මෙහෙයවනු ලබන නිල්ධජ වැඩසටහන යටතේ, පාරිසරික අධ්‍යාපනය සඳහා වන පදනම FEE මගින් පිරිනමනු ලබන, නිල්ධජ සම්මානය හිමි වෙරළ තීරයකි. මෙම සහතිකය ලබා ගැනීම සඳහා ප්‍රධාන නිර්ණායක 33 ක් ඔස්සේ වෙරළ තීරයන්හි ගුණාත්මක තත්වය වැඩි දියුණු කල යුතු අතර ප්‍රධාන වශයෙන් සමුද්‍රීය නාන තොටුපළවල් තක්සේරුකරණය සඳහා, මෙම සංකල්පය වැදගත් වනු ඇත.

ඒ අනුව ශ්‍රී ලංකවේ වෙරළ තීරයන්ට වඩා වැඩි සංචාරක වටිනාකමක් ලබා දීම සඳහා සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය විසින් ක්‍රියාත්මක කල අතර ඒ සඳහා කැබිනට් අනුමැතිය ලැබී ඇති අතර 2024 සැප්තැම්බර් 13 වෙනිදා, නිල් ධජ වෙරළ ජාතික මට්ටමේ වැඩසටහන දියත් කරන ලදී. මෙම අවස්ථාවෙහිදී, FEE ආයතනය විසින් සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය වෙත අනුබද්ධ සාමාජිකත්වය ලබා දෙන ලදී.



FEE ආයතන නියෝජිතයෙකු විසින් සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය වෙත අනුබද්ධ සාමාජිකත්වය ලබා දීමේ අවස්ථාව

සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ අනුග්‍රහය ඇතිව පාසිකුඩා හා ආරුගම්බේ වෙරළ තීරයන් ද, අනෙකුත් ආයතන වල දායකත්වයෙන් දකුණු පළාතේ ඉහල සංචාරක ආකර්ශනයක් සහිත උණවටුන, මිරිස්ස හා බෙන්තර වෙරළ තීරයන් ඇතුළුව ශ්‍රී ලංකාවේ වෙරළ තීර පහක් මෙම වැඩසටහන යටතේ සංවර්ධනය කර නිල් ධජ තත්ත්වය ලබා ගැනීම මෙම ව්‍යාපෘතියේ පළමු අදියරය යටතේ සිදු කෙරේ.

**පිවිතුරු සයුරක් පවත්වා ගැනීම සඳහා වෙරළ රැකබලාගන්නන් යෙදවීමේ වැඩසටහන**

සමුද්‍ර දූෂණය වැලැක්වීම සඳහා ප්‍රජා සහභාගීත්වය ලබා ගනිමින්, ලංකාව වටා පිරිසිදු වෙරළක් සහතික කිරීම උදෙසා, සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය විසින් පිරිසිදු වෙරළ නගර වැඩසටහන රාජ්‍ය පුද්ගලික හවුල්කාරීත්වය යටතේ ආරම්භ කර ඇත. වෙරළ තීරයන්හි තිරසාර කළමනාකරණය සඳහා වෙරළ රැකබලා ගන්නන් ක්‍රියාවේ යෙදවීම, සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ ආයතනික සමාජ වගකීමක් ලෙස ඒකාබද්ධ වෙරළ හා සමුද්‍රීය ජල තත්ත්ව අධීක්ෂණය තුළින් සමුද්‍රීය දූෂණ කළමනාකරණය ඉහළ නැංවීම ක්‍රියාත්මක වේ.

තවද මෙම වැඩසටහන අඛණ්ඩව සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව සමග එක්ව දිවයිනේ සියලුම වෙරළබඩ දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි ක්‍රියාත්මක වේ.

**2024 වසර තුළ වෙරළ රැකබලා ගන්නන් වැඩසටහන සඳහා අනුග්‍රහය දක්වන සමාගම්;**

1. ලංකා IOC සමාගම වෙරළ රැකබලා ගන්නන් 17 දෙනෙක් සඳහා අනුග්‍රහය දැක්විය.

2. හේමාස් කෝපොරේට් සර්විසස් සමාගම වෙරළ රැකබලා ගන්නන් 4 දෙනෙක් සඳහා අනුග්‍රහය දැක්විය.

3. ඊට අමතරව කිලින් ඕෂන් ෆෝස් හා ශ්‍රී ලංකා ජෛව විවිධත්ව යන ආයතන ද අනුග්‍රහය දැක්විය.

**වැඩසටහන් ප්‍රගතිය**

ශ්‍රී ලංකාවේ වෙරළ ආශ්‍රිතව වෙරළ රැකබලාගන්නන් 44 ක් යොදවා ඇති අතර ඔවුන් කි.මී.28.5 ක් දිග වෙරළ තීරයක් දිනපතා පිරිසිදු කරනු ලබයි.

**2024 දෙසැම්බර් 31 වන විට වැඩසටහනේ ප්‍රගතිය**

| අංක | දිස්ත්‍රික්කය | වෙරළ රැකබලා ගන්නන් සංඛ්‍යාව | පිරිසිදු කරන ලද වෙරළ තීරයේ දිග (කි.මී) |
|---|---|---|---|
| 1 | කොළඹ | 14 | 11.5 |
| 2 | ගම්පහ | 3 | 3 |
| 3 | කළුතර | 7 | 5 |
| 4 | ගාල්ල | 4 | 4 |
| 5 | යාපනය | 16 | 5 |

2024 වර්ෂය තුළ අපද්‍රව්‍ය එකතු කිරීමේ මුළු ප්‍රමාණය කිලෝග්‍රෑම 135,000කි. ඒවායින් බොහොමයක් PET බෝතල් සහ අනෙකුත් ප්ලාස්ටික් විය. එකතු කරන ලද මුළු PET බෝතල් ප්‍රමාණය 25,000 ක් පමණ විය.

**ඒකාබද්ධ වෙරළ හා සමුද්‍රීය ජල තත්ත්ව අධීක්ෂණය තුළින් සමුද්‍රීය දූෂණ කළමනාකරණය ඉහළ නැංවීම**

වෙරළබඩ හා සමුද්‍ර ප්‍රදේශවල ජලයේ ගුණාත්මකභාවය අධීක්ෂණය කිරීම සඳහා ජාතික මූලපිරීමේ අරමුණු සහ රාමුව සකස් කිරීම සඳහා මූලික රැස්වීමක් පවත්වන ලදී. මීට අමතරව සමුද්‍රීය පරිසර තත්ව වාර්තාව (State of Marine Environment Report-SOMER) සකස් කිරීම සඳහා වැඩමුළුවක් පවත්වන ලද අතර, වාර්තාවේ ව්‍යුහය සහ ප්‍රධාන අන්තර්ගතයන් සාකච්ඡා කිරීම සඳහා විශේෂඥයින් සහ පාර්ශවකරුවන් ඒකරාශී කරන ලදී. මෙම ක්‍රියාවලිය පාර්ශවකරුවන් සමඟ පැවති අවසන් උපදේශන රැස්වීමකින් අවසන් වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකාවේ සමුද්‍රීය පරිසර කළමනාකරණය සඳහා තවත් සාර්ථක පියවරක් සනිටුහන් කරන ලදී.

**සමුද්‍ර අපද්‍රව්‍ය පිළිබඳ OSPAR සමීක්ෂණය**

OSPAR (Oslo and Paris Convention for the Protection of Marine Environment) කෙටුම්පත යටතේ ශ්‍රී ලංකාවේ වෙරළබඩ දිස්ත්‍රික්ක වල සිදු කරන ලද පුළුල් ක්ෂේත්‍ර සමීක්ෂණ මගින් වෙරළබඩ හා සමුද්‍ර පරිසර ආශ්‍රිත අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා අධිකාරිය ප්‍රයත්නයක් දරන ලදී. මෙම සමීක්ෂණ වෙරළබඩ දිස්ත්‍රික්ක 13 ක් පුරා සිදු කරන ලදී.

**හදිසි තෙල් හා රසායන ද්‍රව්‍යය විසිරී යාමකදී ක්‍රියාත්මක ජාතික සැළැස්ම යාවත්කාලීන කිරීම**

යාවත්කාලීන කරන ලද හදිසි තෙල් හා රසායන ද්‍රව්‍යය විසිරී යාමක දී ක්‍රියාත්මක ජාතික සැළැස්මෙහි සංශෝධන පිළිබඳ වැඩමුළුවක් 2024 මාර්තු 26 වන දින සියලුම හදිසි සිදුවීම් කළමනාකරණ කණ්ඩායමෙහි පාර්ශවකාර ආයතනයන්ගේ සහභාගිත්වයෙන් පැවැත්විය.

**Ocean Country Partnership Program පුහුණු වැඩසටහන**

එක්සත් රාජධානියේ Ocean Country Partnership Program (OCPP) හි අනුග්‍රහයෙන් සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියෙහි මූලිකත්වයෙන් හදිසි තෙල් විසිරීමකදී ප්‍රතිචාර දැක්වීම පිළිබඳව සිද්ධාන්ත හා ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇතුළත්ව 2024 පෙබරවාරි මස 26 වන දින සිට 2024 මාර්තු 08 වන දින දක්වා සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියෙහි ප්‍රධාන කාර්යාලයේදී පැවැත්විය.

**Remote Sensing හා GIS පුහුණු වැඩසටහන**

Ocean Country Partnership Program යටතේ එක්සත් රාජධානියේ Centre for Environment, Fisheries and Aquaculture Science (Cefas) සහ Joint Nature Conservation Committee (JNCC) ආයතනයන්හි මූල්‍යමය හා සම්පත් දායකත්වයෙන් යුතුව සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියෙහි සම්බන්ධීකරණයෙන් 2024 අප්‍රේල් 29 වනදා සිට 2024 මැයි 3 වනදා දක්වාත් නැවත මැයි 6 හා 7 යන දිනයන්හිදී Cinnamon Grand හෝටල් පරිශ්‍රයේ දී නේවාසික පුහුණු සැසියක් ලෙසින් පැවැත්විය.



Remote Sensing හා GIS පුහුණු වැඩසටහන

මේ සඳහා සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියෙහි පාර්ශවකාරි ආයතන සහ ක්ෂේත්‍රයේ GIS සහ Remote Sensing යෙදවීම් සම්බන්ධයෙන් ක්‍රියාකරන හඳුනාගත් ආයතන වල විශේෂඥයන් සහ නිලධාරීන් සම්බන්ධ විය.

**දකුණු ආසියානු සහයෝගිතා පරිසර වැඩසටහන (South Asia Co-Operative Environment Program (SACEP) අනුකූල සමුද්‍ර දූෂණ සඳහා ප්‍රතිචාර දැක්වීම පිළිබඳ සම්මන්ත්‍රණය**

දකුණු ආසියානු සහයෝගිතා පරිසර වැඩසටහන (South Asia Co-Operative Environment Program (SACEP)) හා අනුබද්ධව Ocean Country Partnership හි මූල්‍යමය හා සම්පත් දායකත්වයෙන් යුතුව හදිසි තෙල් විසිරයාමකදී ක්‍රියාත්මක කලාපීය සැලැස්ම පිළිබඳව සහ ඒ සඳහා ප්‍රතිචාර දැක්වීම පිළිබඳව පුහුණු සැසියක් 2024 නොවැම්බර් 18 වනදා සිට 22 වනදා දක්වා Cinnamon Grand හෝටලයේදී පැවැත්විය. මේ සඳහා SACEP සාමාජික රටවල් වන ඇෆ්ගනිස්ථානය, බංගලාදේශය, භූතානය, ඉන්දියාව, මාලදිවයින, නේපාලය, පාකිස්ථානය, සහ ශ්‍රී ලංකාව නියෝජනය කරමින් ක්ෂේත්‍රයේ විශේෂඥයන් සහ නිලධාරීන් සහභාගී විය. පුහුණුවට අදාල තෙල් විසිරීමකදී එයට ප්‍රතිචාර දැක්වීමට යොදාගන්නා උපකරණ ප්‍රදර්ශනයක් සහ ප්‍රායෝගික පුහුණුවක් දික්ඕවිට ධීවර වරාය පරිශ්‍රයේදී පැවැත්විය.

**Mv X-press පර්ල් සිද්ධිය- වෙරළ පිරිසිදු කිරීමේ මෙහෙයුම්**

නෞකා අනතුර හේතුවෙන් පාරිසරික හානියට පත් වෙරළ පිරිසිදු කිරීමේ මෙහෙයුම 27/5/2021 සිට ආරම්භ විය.

වෙරළ කලාපයන් පිරිසිදු කිරීමේ කටයුතු 2024 වර්ෂයේදීත් ක්‍රියාත්මක කළ අතර, එහිදී 2024 වර්ෂය සඳහා වෙරළ පිරිසිදු කිරීමේ මෙහෙයුම් කටයුතු වලට අදාල සංක්ෂිප්ත වාර්තාව පහත පරිදි වේ. පුත්තලම, ගම්පහ සහ කොළඹ දිස්ත්‍රික්කයේ ස්ථාන කිහිපයක දැනට පිරිසිදු කිරීමේ මෙහෙයුම් සිදු කෙරේ.

**2024.01.02 සිට 2024.12.31 දක්වා වෙරළ පිරිසිදු කිරීමේ කටයුතු වල සාරාංශය**

පිරිසිදු කිරීම් කරනු ලැබූ මුළු වෙරළ කළාපයන් ගණන- 1,414

මිනිස්බලය - 33,499

එකතු කරන ලද මුළු මළු ප්‍රමාණය - 3074

එකතු කරන ලද මුළු අපද්‍රව්‍ය ප්‍රමාණය (ආසන්නව) 12,266 kg

පිරිසිදු කළ වෙරළ කළාපයන්හි දිග ප්‍රමාණය - 62,096 m

**කඩොලාන ප්‍රතිස්ථාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම**

**කළුතර**

කළුතර දිස්ත්‍රික්කය තුල කඩොලාන වගා කිරීමේ පිරිසිදු කිරීමේ වැඩසටහන් කිහිපයක් පවත්වා ඇත. කළුතර පාලම අසල දූපත් ප්‍රදේශයේ 2024 අප්‍රේල් 19 දින් වෙරළබඩ ශාක 100 ක් හා 2024 ජුනි 02 දින වෙරළබඩ ශාක 170 ක් සිටුවන ලදී. මෙම ව්‍යාපෘති විශ්වවිද්‍යාල, පාසල් හා වැනි සංවිධාන වල සහභාගීත්වයෙන් සිදුවිය.

කළුතර දිස්ත්‍රික්කය තුල කඩොලාන වගා කිරීමේ පිරිසිදු කිරීමේ වැඩසටහන් කිහිපයක් පවත්වා ඇත. කළුතර පාලම අසල දූපත් ප්‍රදේශයේ 2024 අප්‍රේල් 19 දින් වෙරළබඩ ශාක 100 ක් හා 2024 ජුනි 02 දින වෙරළබඩ ශාක 170 ක් සිටුවන ලදී. මෙම ව්‍යාපෘති විශ්වවිද්‍යාල, පාසල් හා වැනි සංවිධාන වල සහභාගීත්වයෙන් සිදුවිය.

2024 අගෝස්තු 19 දින කලුතර දකුණ කලපු ප්‍රදේශයේ වෙරළබඩ ශාක 150 ක් හා 2024 සැප්තැම්බර් 27 දින එම ප්‍රදේශයේම වෙරළබඩ ශාක 150 ක් සිටුවන ලදී.

දෙසැම්බර් 14 දින වෙරළබඩ ශාක 100ක් කලුතර පාලම අසල දූපත් ප්‍රදේශයේ සහ කලපු ප්‍රදේශයේ සිටවූ අතර තවද කලුතර මහනගර සභාව මගින් මෙම ප්‍රදේශය පිරිසිදු කරන ලදී. මෙම ප්‍රදේශයේම දෙසැම්බර් 29 දින ද වෙරළබඩ ශාක 100 ක් සිටුවන ලදී.

මෙම සියලු වැඩසටහන් සඳහා පැල ලබා දෙන ලද්දේ කලුතර දිස්ත්‍රික් කාර්යාලය අයත් තවාන් මගිනි.




කඩොලන රෝපණය කිරීමේ වැඩසටහන්

**පුත්තලම**

පුත්තලම දිස්ත්‍රික්කය තුල කඩොලාන නැවත වගාකිරීමේ වැඩසටහන් කිහිපයක් පවත්වා ඇත.ඒ අනුව පෙබරවාරි මස තුල පැල 200ක් , මාර්තු මස තුල පල 100 ක්, ජූලි මස තුල ලෝක කඩොලාන දිනය නිමිති කොට ගෙන, ආනවිලුන්දාව ප්‍රදේශයේ බීජ පැල 2500 ක් ඔක්තොම්බර් මස තුලදී පැල 200 ක් අනවිලුන්දව ප්‍රදේශයේම නැවත ප්‍රතිස්ථාපනය කරන ලදී. 2024 සැප්තෙම්බර් මසයේදී ශ්‍රී ලංකා නාවික හමුදාව, කුඩා ධීවර සමාගම් වල සහභාගීත්වයෙන් කඩොලාන තවාන් ප්‍රතිස්ථාපනය කිරීම පිළිබඳව සාකච්ඡාවක් පවත්වන ලදී. තවද, කල්පිටිය ප්‍රදේශයේයේ,කඩොලාන ප්‍රතිසංස්කරණ කටයුතු මෙම මස තුල පවත්වා ඇත.

තවද, කල්පිටිය ඉච්චන්කඩුව ප්‍රදේශයේ තවාන් වල කඩොලාන බීජ පැල 500ක් ශ්‍රී ලංකා නාවික හමුදාව මඟින් නඩත්තු කෙරේ. ආනවිලුන්දාව ප්‍රදේශයට අමතරව මුන්දාල් ප්‍රදේශයේද කඩොලාන රෝපණය කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.

**ජගත් සාගර දිනය**

**මන්නාරම**

2024 ජගත් සාගර දිනය වෙනුවෙන් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සමඟ එක්ව 2024 ජුනි 5 වන දින රුක් රෝපණ වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී. එහි දී ශාක 20ක් පමණ සිටුවන ලදී.

**මාතර**

ජගත් සාගර දිනයට සමගාමීව රුක් රූපණ වැඩසටහනක් පොල්අතුමෝදර වෙරළ තීරයේ දී පැවැත්විණි.

ජගත් සාගර දිනය සෑම වසරකම ජුනි 08 වන දිනට යෙදී ඇති අතර මෙවර එය සැමරීම සඳහා අධිකාරිය විසින් මට්ටක්කුලිය කාක දූපත වෙරළ තීරය පිරිසිදු කිරීමේ වැඩසටහනක් පැවැත්වූ අතර ඒ සඳහා රාජ්‍යය හා පෞද්ගලික ආයතන මෙන්ම ප්‍රජා සහභාගීත්වය සහිතව සාර්ථකව සිදුකළේය.

ඒ අනුව ප්‍රාදේශීය ප්‍රදේශීය කාර්යාල ලෝක සාගර දිනයට සමගාමීව වෙරළ පිරිසිදු කිරීමේ සහ දිය යට පිරිසිදු කිරීමේ වැඩසටහන් කිහිපයක් සංවිධානය කළේය.

**ජාත්‍යන්තර වෙරළ පිරිසිදු කිරීමේ දිනය සහ ජාතික සමුද්‍ර සම්පත් සුරකිමේ සතිය**

ජාත්‍යන්තර වෙරළ පිරිසිදු කිරීමේ දිනය සැප්තැම්බර් 21 වන දිනට යෙදී තිබූ අතර සමුද්‍ර දූෂණය අවම කිරීම සහ වෙරළබඩ පරිසර පද්ධති ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර වෙරළ පිරිසිදු කිරීමේ දිනය සහ සමුද්‍රිය සම්පත් සුරකිමේ සතිය මෙම වසරෙහි සැප්තැම්බර් 14 සිට 21 දක්වා ශ්‍රී ලංකාව වටා වූ වෙරළබඩ දිස්ත්‍රික්ක 13ක වෙරළ පිරිසිදු කිරීම් සංවිධානය කරන ලදී. වෙරළ අපද්‍රව්‍යය තක්සේරු කිරීම, ජනතාව දැනුවත් කිරීම, සංරක්ෂණ ප්‍රයත්නයන් ප්‍රවර්ධනය කිරීම සහ සංචාරක හා ධීවර කර්මාන්තයේ තිරසාරභාවයට සහාය වීම මෙම වැඩසටහනේ අරමුණයි. මේ සඳහා රාජ්‍ය හා පෞද්ගලික ආයතන මෙන්ම ප්‍රජා සහභාගීත්වයද ඇතුළත්ව සාර්ථකව නිම කරන ලදී.

**සමුද්‍ර දූෂණ සිදුවීම්**

| සිද්ධිය | ස්ථානය | ගනු ලැබූ ක්‍රියාමාර්ග |
|---|---|---|
| ග්ලෝබල් ක්‍රෙස්ට්ඉ (Globel Crest) නෞකාවෙන් සාගරයට තෙල් මුදා හැරීම | පානදුර අවට සාගර ප්‍රදේශයේ | මෙම සිදු වීම CLS චන්ද්‍රිකා තොරතුරු මත හදුනා ගත් අතර නෞකාව වරදකරු ලෙස ඔප්පු වීම හේතුවෙන් මිලියන 15 ක දඩ නියම කිරීම. |
| එම්.ටී ආර්ක් ප්‍රෙස්ටිජ් (ARK Prestige) නෞකාවෙන් සාගරයට තෙල් මුදා හැරීම | කොළඹ නාවික තටාකාංගනය | නෞකාව වරදකරු ලෙස ඔප්පු වීම හේතුවෙන් මිලියන 15 ක දඩ නියම කිරීම. |
| CPC ආයතනයට අයත් තෙල් නළයක් පුපුරා යාමෙන් තෙල් කාන්දුවක් සිදුවීම | කොළඹ වරාය පරිශ්‍රය | නීතිමය කටයුතු සිදු වෙමින් පවතී |
| එම් වි ලුසොන් (MV Luzon) නෞකාවෙන් සාගරයට තෙල් මුදා හැරීම | හම්බන්තොට වරාය | නෞකාව වරදකරු ලෙස ඔප්පු වීම හේතුවෙන් මිලියන 15 ක දඩ නියම කිරීම සහ මෙහෙයුම් වියදම් සඳහා මිලියන 2.56 ක මුදලක් නියම කිරීම |
| එම්.වී. එස්.එම්ග කාවේරි නෞකාවට කන්ටේනරයක් පැටවීමේදී අනතුරට ලක්වීමෙන් සාගරට කපු ලෙලි තෙල් දියර සාගරයට එක් වීම | SAGT පරියන්තය | SAGT පරියන්තය වරදකරු ලෙස ඔප්පු වීම හේතුවෙන් මිලියන 15 ක දඩ නියම කිරීම |

**ආදායම් උත්පාදන ප්‍රගතිය -2024**

| වාර්ෂික ආදායම් ඉලක්කය 2024 (රු.මි) | 2024.12.31 දිනට ප්‍රගතිය | |
|---|---|---|
| | ආදායම (රු.මි) | වාර්ෂික % |
| 101.26 | 306.36 | 303% |

**සාගර ඔත් ජීවින් (Biofouling) කළමනාකරණය - Glo-Fouling හවුල්කාරීත්ව ව්‍යාපෘතිය යටතේ 2024 දී පවත්වන ලද වැඩසටහන්**

2024 වර්ෂයේ දී සාගර ඔත් ජීවී දූෂණ ගැටළුව කළමනාකරණය කිරීම සඳහා පියවර කිහිපයක් සනිටුහන් කරන ලදී.

1. ධීවර, ජලජීවී වගා සහ ශිල්පීය ක්ෂේත්‍ර සඳහා ජාතික සාගර ඔත් ජීවී කළමනාකරණ ප්‍රතිපත්තිය, උපාය මාර්ග සහ ක්‍රියාකාරී සැලැස්ම සංවර්ධනය කිරීම ආරම්භ කිරීම සඳහා ඉතා වැදගත් පාර්ශවකරුවන්ගේ රැස්වීමක් 2024 ජනවාරි 16 වන දින සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේදී පැවැත්විණි.

ශ්‍රී ලංකාව සඳහා සාගර ඔත් ජීවී කලමනාකරණය පිළිබඳ උපායමාර්ගික හා ක්‍රියාකාරී රාමුවක් සකස් කිරීමට සමගාමීව ක්ෂේත්‍ර විශේෂිත ප්‍රමුඛතා පිළිබඳව මෙහිදී සාකච්ඡා කෙරිණි.

2. සාගර ඔත් ජීවී කළමනාකරණ සැලසුම් සහ වාර්තා පොත් පිළිබඳ පුහුණු වැඩසටහන- ශ්‍රී ලංකා පදනම් ආයතනය, කොළඹ 07

ඊට අනුකූලව 2024 ජනවාරි 17-18 දිනවල කොළඹ 07 ශ්‍රී ලංකා පදනම් ආයතනයේ දී පුහුණු වැඩසටහනක් ලබා දෙන ලදී. මෙම වැඩසටහන මගින් සාගර ඔත් ජීවී කළමනාකරණ සැලසුම් සහ වාර්තා පොත් කෙරෙහි අවධානය යොමු කරන ලද අතර කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සියලු තාක්ෂණික දැනුම සහිත මාර්ගෝපදේශයන් ලබා දෙන ලදී.

3. **IMO** සහ **GloFouling** ව් යාපෘතිය සමඟ එක්ව කොළඹ ඩොක්යාර්ඩ් පීඑල්සී හි දී සිදු කරනු ලබන සාගර ඔත් ජීවී දූෂණ බලපෑම්, වැළැක්වීම සහ වියළි තටාක මෙහෙයුම් පිළිබඳ පුහුණුව 2024 ඔක්තෝබර් 03-04 දිනවල දී පවත්වන ලදී.ක්ෂේත්‍ර චාරිකාවක් ඇතුළු දෙදින වැඩමුළුව 2024 ඔක්තෝබර් මස 3 සහ 4 යන දෙදින කොළඹ ඩොක්යාර්ඩ් පීඑල්සී පරිශ්‍රයේදී පැවැත්විණි.

## 2.5 සංචාරක අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වූ ආයතනවල ප්‍රගතිය

### 2.5.1 ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව

# 2.5.1. ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව

### හැඳින්වීම

ශ්‍රී ලංකාව තුළ ශාක විවිධත්වය විතැන් සංරක්ෂණය කිරීම සඳහා ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව විශාල දායකත්වයක් සපයන අතර උද්‍යාන අලංකරණය හා මල් වගාව ශ්‍රී ලංකාව තුළ ප්‍රවර්ධනය කිරීම සඳහා පර්යේෂණ හා තාක්ෂණික වැඩසටහන් ද එමඟින් ක්‍රියාත්මක කරයි. වෘත්තිකයන් සහ උද්‍යෝගයක් දක්වන තැනැත්තන්ගේ සිට පාසල් සිසුන් දක්වා සියලු ආකාරයේ කණ්ඩායම් සඳහා නිර්මාණය කර ඇති ක්‍රියාකාරකම් හරහා දැනුම ප්‍රවර්ධනය කරමින්, උද්භිද විද්‍යාව හා ස්වභාවධර්මය පිළිබඳ තොරතුරු මූලාශ්‍රයක් වශයෙන් ද මෙම දෙපාර්තමේන්තුව ක්‍රියා කරයි. මෙමගින් මහජනතාව දැනුම්වත් කිරීම ප්‍රවර්ධනය කෙරෙන අතර ස්වභාවධර්මය කෙරෙහි ඇති උනන්දුව ද වර්ධනය කරයි. විවේකය, විනෝදාස්වාදය, විනෝද ක්‍රීඩා, අධ්‍යාපනය සහ උද්භිද විද්‍යාව යනාදිය සඳහා ශ්‍රී ලංකාවේ උද්භිද උද්‍යානවලට සෑම වසරකම මිලියන 2.5 කට ආසන්න නරඹන්නන් පිරිසක් පැමිණේ.

### ආදායම

ඇතුළත් වීමේ ගාස්තු, පැළ අළෙවිය සහ කුලී ආදියෙන් 2024 වර්ෂයේදී උපයාගෙන ඇති මුළු ආදායම රු. මිලියන 1,366.416කි. එය පසුගිය වසරේ ආදායමට (රු. මිලියන 901.099) සාපේක්ෂව 52%ක වර්ධනයකි.




2017 සිට 2024 දක්වා මුලු වාර්ෂික ආදායම

### උද්භිද උද්‍යානයට පැමිණි නරඹන්නන් සංඛ්‍යාව




2018 සිට 2024 දක්වා පැමිණි නරඹන්නන් සංඛ්‍යාව




2024 වසරේදී පැමිණි නරඹන්නන් සංඛ්‍යාව

### වියදම

| මූලාශ්‍රය | ප්‍රතිපාදන (රු.මිලියන) | වියදම (රු.මිලියන) | % |
|---|---|---|---|
| ශ්‍රී ලංකා රජය | 118.0 | 69.555 | 59 |
| උද්භිද උද්‍යාන අරමුදල් | 38.5 | 38.323 | 100 |
| **මුළු ප්‍රාග්ධනය** | **156.5** | **107.878** | **69** |
| පුනරාවර්තන | 752.05 | 689.781 | 91 |
| **මුළු එකතුව** | **908.55** | **797.659** | **88** |

**උද්භිද උද්‍යානයන්හි ප්‍රධාන සංවර්ධන කටයුතු**

- **පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානය (රා.උ.උ.)**

රාජකීය උද්භිද උද්‍යානයේ වසර 200ක් සපිරීම නිමිත්තෙන් ස්ථාපිත කරන ලද කෞතුකාගාරය 2025 ජනවාරි මාසයේදී මහජනතාව සඳහා විවෘත කිරීමට සැලසුම් කර ඇත.

දරුවන් සඳහා අධ්‍යාපන කේන්ද්‍රයක් ස්ථාපනය කර, පාසල් දරුවන් වෙනුවෙන් විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

ඉලෙක්ට්‍රොනික ප්‍රවේශපත් ක්‍රමවේදය හඳුන්වා දෙමින් ප්‍රවේශපත්‍ර ලබාදීමේ ක්‍රමවේදය වැඩිදියුණු කරන ලදී.

- **හක්ගල උද්භිද උද්‍යානය (හ.උ.උ)**

සංචාරකයින් සඳහා උද්‍යානවල පහසුකම් වැඩිදියුණු කිරීමක් වශයෙන්, විදේශීය සංචාරකයින් සඳහා වැසිකිළි සංකීර්ණයක් ඉදිකර අවසන් කරන ලදී.

- **හෙනරත්ගොඩ උද්භිද උද්‍යානය, ගම්පහ (හෙ.උ.උ)**

ප්‍රධාන ජල ගබඩා ටැංකිය (ලීටර් 14,000ක ධාරිතාව) වැඩි දියුණු කිරීම, නව පිවිසුම අසල වැසිකිළිය සහ ආරක්ෂක කාමරය නවීකරණය කිරීම සහ පත්‍රික ශාක ප්‍රදර්ශනාගාරයේ වහලය අලුත්වැඩියා කිරීම අවසන් කරන ලදී.

- **ගනේවත්ත වන ඖෂධ උද්‍යානය (ව.ඖ.උ)**

මායිම් චේන්ලින්ක් වැට (දිග මීටර්) සහ ශාක සංරක්ෂණාගාරයේ වහලය අලුත්වැඩියා කරන ලදී.

- **මිරිජ්ජවිල වියළි කලාපීය උද්භිද උද්‍යානය (මි.වි.උ.උ.)**

උද්‍යානයේ ත්‍රිකෝණාකාර කොටස වටා (මීටර් 15 ක දිගින් යුතු) මායිම් වැටක් ඉදි කර අවසන් කරන ලදී.

- **සීතාවක තෙත් කලාපීය උද්භිද උද්‍යානය (සී.තෙ.උ.උ)**

උද්‍යානයේ කුඹුක් කොටසේ අඩිපාර වැඩි දියුණු කරන ලද අතර ශාක පිළිබඳ කරුණු ප්‍රදර්ශනය කරන තොරතුරු පුවරු ප්‍රතිසංස්කරණය කරන ලදී.

- **මීගලෑව_"හරිත පියස" පුහුණු මධ්‍යස්ථානය**

(ලීටර් 12000 ක ධාරිතාවකින් යුතු) වගා ළිඳ ඉදිකර අවසන් කරන ලදී.



හෙනරත්ගොඩ උ.උ අළුත්වැඩියා කරන ලද



ගනේවත්ත උද්‍යානයේ අළුත්වැඩියා කරන ලද වැට



මීගලෑව හරිත පියසේ ඉදි කළ වගා ළිඳ



සීතාවක උ.උද්‍යානයේ ස්ථාපිත කළ

**උද්භිද උද්‍යානයේ පර්යේෂණ කටයුතු, විද්‍යාත්මක අධ්‍යයන සහ අධ්‍යාපන හා පුහුණු වැඩසටහන්**
**පර්යේෂණ හා විද්‍යාත්මක අධ්‍යයන**

- **ශාක පිළිබඳ පර්යේෂණ හා අධ්‍යයනයන්**

මෙම වසර තුළදී පවත්වන ලද ජාතික උද්භිද විද්‍යා සමීක්ෂණය සඳහා එක්දින ක්ෂේත්‍ර චාරිකා දහතුනක් පවත්වන ලදී. මෙම ගවේෂණවල ප්‍රතිඵලයක් ලෙස හක්ගල දැඩි ස්වාභාවික රක්ෂිතයෙන් *Coleus hakgalensis* නැමැති නව විශේෂයක් හඳුනා ගන්නා ලදී.

රැස් කරන ලද ශාක නිදර්ශකවලින් සපුෂ්පික ශාක විශේෂ 110 ක් හඳුනාගෙන ඇති අතර 2020 රතු දත්ත පොතට අනුව විශේෂ 05 ක් වඳවීමේ තර්ජනයට ලක්ව ඇත.

පර්යේෂණ සහ අධ්‍යාපනය, ඖෂධ පැළෑටි කර්මාන්තය, අධිකරණ සේවා මෙන්ම ජාතික ශාක එකතුව වර්ධනය කිරීම සඳහා ජාතික ශාකාගාරය විසින් විවිධ ආයතන සඳහා ශාක නිදර්ශක 996ක් හඳුනා ගන්නා ලදී.

මීට අමතරව, අනෙකුත් උද්‍යාන මගින් සංරක්ෂණය සහ ශාක ක්‍රමවේද පිළිබඳ පර්යේෂණ වැඩසටහන් 14ක් සිදු කරමින් පවතියි.

එමෙන්ම, ශාක නිදර්ශක ඩිජිටල්කරණය කිරීම හා දැව ව්‍යුහ විද්‍යාත්මක දත්ත ගබඩාව වැඩිදියුණු කිරීම මගින් ශාකාගාර දත්ත පද්ධති යාවත්කාලීන කිරීම සිදු කරන ලදී.

**මල්වගා පර්යේෂණ සහ අධ්‍යයනය**

විවිධ මල්වගා බෝගවල වගා පිළිවෙත්, ක්ෂුද්‍ර ප්‍රචාරණය පිළිබඳ විශේෂ අවධානයක් යොමු කරමින් ශාක ප්‍රචාරණ ක්‍රමවේද, පළිබෝධ සහ රෝග කළමනාකරණය, පසු-අස්වනු තාක්ෂණය සහ අගය එකතු කිරීම යනාදිය පිළිබඳව පර්යේෂණ වැඩසටහන් 19 ක් සිදුකරන ලදී.

**අධ්‍යාපනික සහ පුහුණු වැඩසටහන්**

| | වැඩසටහන | කාලය | අංශය | සහභාගී වන සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1. | මල්වගා හා උද්‍යාන අලංකරණ තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව - NVQ 5 | අවුරුදු 1 මාස 06 | මල්වගා සහ උද්‍යාන අලංකරණ පුහුණු පාසල (ම.උ.අ.පු.පා) | 24 |
| 2. | භූදර්ශන තාක්ෂණික ශිල්පී සහතිකපත්‍ර පාඨමාලාව - NVQ 4 | මාස 10 | (ම.උ.අ.පු.පා) | 28 |
| 3. | මල්වගා හා උද්‍යාන අලංකරණ පාඨමාලාව | මාස 04 | (ම.උ.අ.පු.පා) | 94 |
| 4. | NVQ 4,5 සහ 6 මට්ටමේ සිසුන් සඳහා රැකියාස්ථ පුහුණුව | මාස 06 | (ම.උ.අ.පු.පා) | 151 |
| 5. | උපාධි අපේක්ෂකයන් සඳහා සීමාවාසික පුහුණු වැඩසටහන - ජෛව පද්ධති තාක්ෂණය | මාස 06 | (ම.උ.අ.පු.පා) | 04 |
| 6. | භූ අලංකරණ වාස්තු විද්‍යා ගෞරව උපාධිය හදාරන සිසුන් සඳහා මොඩියුල තාක්ෂණය (Modules Technology) සම්බන්ධයෙන් වෘත්තීය පුහුණුව– මොරටුව විශ්වවිද්‍යාලය | මාස 06 | (ම.උ.අ.පු.පා) | 17 |
| 7. | උද්‍යාන හා ගෙවතු අලංකරණය | එක්දින | (ම.උ.අ.පු.පා) | 706 |
| 8. | ඕකිඩ් වගාව | එක්දින | (ම.උ.අ.පු.පා) | 138 |
| 9. | ඇන්තූරියම් වගාව | එක්දින | (ම.උ.අ.පු.පා) | 135 |
| 10. | තවාන් කළමනාකරණය | එක්දින | (ම.උ.අ.පු.පා) | 155 |
| 11. | විසිතුරු පත්‍රික ශාක වගාව | එක්දින | (ම.උ.අ.පු.පා) | 49 |
| 12. | ජර්බරා වගාව | එක්දින | (ම.උ.අ.පු.පා) | 14 |
| 13. | රෝස වගාව | එක්දින | (ම.උ.අ.පු.පා) | 44 |
| 14. | ගෘහස්ථ ගෙවතු වගාව | එක්දින | (ම.උ.අ.පු.පා) | 06 |
| 15. | ජලජ ශාක සහ බොන්සායි වගාව | එක්දින | (ම.උ.අ.පු.පා) | 60 |
| 16. | ඇන්තූරියම්, ඕකිඩ්, පත්‍රික ශාක, රෝස වගාව, භූමි අලංකරණය සහ තවාන් කළමනාකරණය පිළිබඳ පාසල් සිසුන්, කෘෂිකාර්මික පාසල් සිසුන්, තාක්ෂණික ආයතන සිසුන් සහ විශ්ව විද්‍යාල සිසුන් සඳහා ප්‍රායෝගික සැසි පැවැත්වීම | එක්දින | (ම.උ.අ.පු.පා) | 1076 |
| 17. | මල් වගාව සහ භූමි අලංකරණ ගෙවතු වගාව | මාස 01 | (ම.උ.අ.පු.පා) | 264 |

| | වැඩසටහන | කාලය | අංශය | සහභාගී වන සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 18. | තනි පුද්ගල ඉල්ලීම් සඳහා ප්‍රායෝගික සැසි (ඇන්තූරියම්, ඕකිඩ්, පත්‍රික, රෝස වගාව සහ තවාන් කළමනාකරණය) | එක්දින | (ම.උ.අ.පු. පා) | 22 |
| 19. | පාසල් සහ විශ්වවිද්‍යාල සිසුන් සහ අනෙකුත් අදාළ පාර්ශ්ව සඳහා ජෛව විවිධත්වය සහ එහි සංරක්ෂණය, ශාක වර්ගීකරණය(systematics,), ශාකාගාර තාක්ෂණික ශිල්පීය ක්‍රම, ශාක විවිධත්වය සහ හඳුනාගැනීම | එක්දින / පැය 3 | ජාතික ශාකාගාරය | 740 |
| 20. | පාසල් සහ විශ්වවිද්‍යාල සිසුන් සහ අනෙකුත් අදාළ පාර්ශ්ව සඳහා ශාක විද්‍යාව සහ සංරක්ෂණය, උද්භිද උද්‍යාන විද්‍යාව, ශාක විතැන් සංරක්ෂණය, මල් වගා බෝග වගාව | එක්දින/ පැය 3 - 4 | රා.උ.උ | 1096 |
| | | | හ.උ.උ | 560 |
| | | | හෙ.උ.උ | 1309 |
| . | | | මි.වි.උ.උ. | 456 |
| | | | සී.තෙ.උ.උ | 255 |
| 21. | පාසල් සහ විශ්වවිද්‍යාල සිසුන් සහ අනෙකුත් අදාළ පාර්ශ්ව සඳහා ඖෂධීය ශාක කළමනාකරණය කිරීම හා වගා කිරීම | එක්දින/ පැය 3 - 4 | ව.ඖ.උ | 544 |
| | එකතුව | | | **7,947** |

**ශාක නිෂ්පාදනය**

සියලුම උද්‍යානවල පැළ නිෂ්පාදන කටයුතු සිදු කරන ලද අතර අලෙවිය සහ උද්‍යාන භාවිතය සඳහා පැළ 446,430ක් නිෂ්පාදනය කරන ලදී.

**මල්වගා කර්මාන්තයේ වර්ධනය**

දේශීය මල්වගා කර්මාන්තය නංවාලීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවෙහි මල්වගා පර්යේෂණ හා සංවර්ධන අංශය මගින් 'සුවහස් මල්' ජාතික මල්වගා සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. මෙම වසර පුරාවට අඛණ්ඩ වැඩසටහන් මාලාවක් සිදු කරන ලදී;

- මල් වගාවේ නිරත ගොවීන් සුවහස් මල් සමිති වෙත බඳවා ගත් අතර නව සමිති 03ක් ඇති කරන ලදී.
- මාසික රැස්වීම් සහ තවාන් නිරීක්ෂණ චාරිකා මගින් සංවිධානාත්මක මල් වගාකරුවන්ට අවශ්‍ය තාක්ෂණික දැනුම ලබා දෙන ලද අතර දිස්ත්‍රික්ක 24ක් ආවරණය වන පරිදි තවාන් නිරීක්ෂණ චාරිකා 819ක් සහ මාසික රැස්වීම් 544ක් පවත්වන ලදී .
- මල් වගා කරන්නන් සඳහා වෙළඳපොළ සම්බන්ධතා ඇති කර ගැනීම සඳහා පහසුකම් සපයන ලද අතර පැළ අලෙවිය සඳහා දිස්ත්‍රික් මට්ටමින් විශාල ප්‍රදර්ශන 16ක් සහ කුඩා ප්‍රදර්ශන 141ක් සංවිධානය කරන ලදී.
- මල් වගා පර්යේෂණ හා සංවර්ධන ඒකකය විසින් ක්ෂේත්‍රයේ නියැලී සිටින සහ ක්ෂේත්‍රයට උනන්දුවක් දක්වන තැනැත්තන් 9,106 දෙනෙකු සඳහා ඇන්තූරියම්, ඕකිඩ්, රෝස, විසිතුරු ශාක, ජර්බරා, තවාන් කළමනාකරණය සහ පටක රෝපණය පිළිබඳ කෙටි පුහුණු සැසි පවත්වන ලදී.
- "අපනයනය ඉලක්ක කරගත් මල්වගාව සඳහා සඵලදායී අනාගතයක් ළඟා කර ගැනීම හා තිරසාර නවෝත්පාදනයන් බිහි කිරීම" යන තේමාව පාදක කර ගනිමින් මල් වගාව පිළිබඳ ජාතික සම්මන්ත්‍රණය (NaSFlor) දෙසැම්බර් 06 වැනි දින පවත්වන ලදී. එය ඵලදායී සැසියක් බවට පත් කරමින් පර්යේෂණ පත්‍රිකා 17ක් ප්‍රකාශයට පත් කරන ලද අතර මල්වගා කර්මාන්තයේ නියැලී සිටින පෞද්ගලික අංශයේ පර්යේෂකයන් සහ ගනුදෙනුකරුවන් ඒකරාශී කරගනිමින් සාරවත් කතිකාවතක් පැවැත්වීමටත් හැකි විය.

**2025 වර්ෂය සඳහා සැලසුම් කර ඇති ක්‍රියාකාරකම් පිළිබඳ කෙටි විස්තරයක්**

**ශාක සංරක්ෂණය**

- දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ශාක ගවේෂණ වැඩසටහනක් වශයෙන් (මාතලේ දිස්ත්‍රික්කයේ) ඇඹොක්ක සහ (මහනුවර දිස්ත්‍රික්කයේ) දුනුමණ්ඩලාව රක්ෂිත වනාන්තරවල තර්ජනයට ලක්ව ඇති ශාක විශේෂ ගවේෂණය කිරීම සහ එකතු කිරීම පිළිබඳ උද්භිද සමීක්ෂණ කටයුතු මෙ වසරේ ද අඛණ්ඩව සිදු කිරීමට අපේක්ෂිතය.

මෙමගින් ජෛවවිවිධත්ව සංරක්ෂණ ක්‍රමවේද හා විතැන් සංරක්ෂණ ක්‍රමවේද ක්‍රියාවට නැංවීමට සහ විවිධ කර්මාන්තවල ආර්ථික වශයෙන් තිරසර ශාක විශේෂ හඳුනා ගැනීමට අවස්ථාව සළසනු ඇත.

විකුණුම් සහ ගෙවතු භාවිතය සඳහා සියලුම උද්‍යානවල පැළ 500,000ක් නිෂ්පාදනය කිරීමට අපේක්ෂිතය.

•පර්යේෂණ සහ අධ්‍යාපනය

2025 වසරේදී මල්වගා සහ මල්වගා පර්යේෂණ ක්‍රියාකාරකම් අඛණ්ඩව සිදු කෙරෙන අතර විවිධ මල්වගා බෝගවල වගා පිළිවෙත්, ක්ෂුද්‍ර ප්‍රචාරණය පිළිබඳ විශේෂ අවධානයක් යොමු කරමින් ශාක ප්‍රචාරණ ක්‍රම, පළිබෝධ සහ රෝග කළමනාකරණය, පසු-අස්වනු තාක්ෂණය සහ අගය එකතු කිරීම යනාදිය කේන්ද්‍ර කර ගනිමින් පර්යේෂණ වැඩසටහන් 30ක් පැවැත්වීමට නියමිතය.

මල් වගාව සහ ශාක ආශ්‍රිත ක්ෂේත්‍ර පිළිබඳව පුද්ගලයින් 25,000ක් පුහුණු කර දැනුම්වත් කරනු ඇති අතර, භූ අලංකරණ ගෙවතු වගාව සහ මල්වගාව පිළිබඳ NVQ මට්ටමේ පාඨමාලා යටතේ පුද්ගලයින් 60 දෙනෙකු පුහුණු කිරීමට අපේක්ෂිතය.

•මල්වගා සංවර්ධනය

දැනටමත් ක්ෂේත්‍රයේ නියැලී සිටින පහළ සහ මධ්‍යම මට්ටමේ වගාකරුවන් සවිබලගැන්වීම සඳහා පුහුණුවීම් සහ වැඩමුළු පැවැත්වීමෙන් ඔවුන්ට අවශ්‍ය තාක්ෂණික දැනුම ලබාදීමට, ක්ෂේත්‍රයේදී ඇති වන ගැටලු විසඳා ගැනීමට ක්ෂේත්‍රය තුළදීම උපදෙස් ලබා දීමට, ක්ෂේත්‍රයේ වඩාත් හොඳ කාර්ය සාධනයක් සඳහා අවශ්‍ය ද්‍රව්‍ය, උපකරණ ලබා ගැනීමට හා යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට ආධාර සැපයීමට, සහ වගාකරුවන්ගේ අධ්‍යාපනය සඳහා මල්වගාව ආශ්‍රිත තොරතුරු ඇතුළත් ප්‍රකාශන ලබා දීමට අපේක්ෂිතය.

- සංචාරක සංවර්ධන

උද්‍යානය වටා සංචාරය කිරීමේදී උද්‍යානයට පැමිණෙන නරඹන්නන්ට පහසුකම් සැලසීම සඳහා පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානය, හක්ගල උද්භිද උද්‍යානය, සීතාවක තෙත් කලාපීය උද්භිද උද්‍යානය සහ මිරිජ්ජවිල වියළි කලාපීය උද්භිද උද්‍යානය සඳහා බැටරි බලයෙන් ක්‍රියාත්මක වන නවතම රථ 08ක් මිලදී ගැනීමට නියමිත අතර, උද්‍යාන නරඹන්නන්ට ප්‍රශස්ථ අත්දැකීමක් ලබාදීම සඳහා හෙනරත්ගොඩ උද්භිද උද්‍යානයට සහ සීතාවක තෙත් කලාපීය උද්භිද උද්‍යානයට පැඩල් බෝට්ටු 04ක් මිලදී ගැනීමට නියමිතය.

2025 වසරේදී අක්මීමන කඩොලාන උද්භිද උද්‍යානයේ සංවර්ධන කටයුතු අඛණ්ඩව සිදු කිරීමට අපේක්ෂිතය.

විසිතුරු පැළවල විවිධත්වය පිළිබඳව නරඹන්නන් අතර දැනුවත්භාවය ඇති කිරීම සඳහා ශාක ප්‍රදර්ශනාගාරයක් සීතාවක තෙත් කලාපීය උද්භිද උද්‍යානයේ ස්ථාපිත කිරීම් කටයුතු සැලසුම් අපේක්ෂිතය.

**ආදායම් උත්පාදන ප්‍රගතිය -2024**

| වාර්ෂික ආදායම් ඉලක්කය 2024 (රු.මි) | **2024.12.31** දිනට ප්‍රගතිය | |
|---|---|---|
| | ආදායම (රු.මි) | වාර්ෂික % |
| 1,150.00 | 1,366.42 | 119% |

## 2.6 ජල සම්පාදන අමාත්‍යංශය යටතේ ක්‍රියාත්මක වූ ආයතනවල ප්‍රගතිය

### 2.6.1 ජල සම්පත් මණ්ඩලය

# 2.6.1 ජල සම්පත් මණ්ඩලය

ජල සම්පත් මණ්ඩලය මේ වන විට අප රටේ භූගත ජල සම්පත පිළිබඳව වගකීම දරණ ප්‍රධාන ආයතනය වන අතර 1964 අංක 29 දරන ජල සම්පත් මණ්ඩල පනතට හා 1999 අංක 42 දරන සංශෝධිත පනතට අනුව අනාගත පරපුර වෙනුවෙන් භූ ජල සම්පත ආරක්ෂා කර ගැනීම, වැඩි දියුණු කර ගැනීම හා තිරසර කළමනාකරනයකින් යුක්තව භාවිතා කර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීමේ බලය මෙම මණ්ඩලයට ලබා දී ඇත. එමෙන්ම 2017 මාර්තු 16 වන දින ප්‍රකාශයට පත්කරන ලද 2010/23 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් භූ ගත ජලය අවභාවිතා කිරීම වලක්වාලීම හා භූගත ජලය සංරක්ෂණය කිරීමෙහිලා එය නියාමනය කිරීම සඳහා ජල සම්පත් මණ්ඩලය වෙත බලය ලබා දී ඇත. දැනට ඒ අනුව රට තුල පවතින භූගත ජල මූලාශ්‍ර නියාමනය කරගැනීම පිණිස අවශ්‍ය කටයුතු සිදු කරගෙන යනු ලබයි.

ශ්‍රී ලංකාව තුල සිදු කරගෙන යනු ලබන කළුගල්, පස්/බොරළු, වැලි සහ මැණික් ඇතුළු අනෙකුත් ඛනිජ ද්‍රව්‍යයන් කැණීමේ ව්‍යාපෘති සඳහා අදාළ ප්‍රදේශ වල පවතින භූගත ජලයට සිදු විය හැකි බලපෑම පිළිබඳ පරීක්ෂණ සිදු කිරීම සහ එම බලපෑම් අවම කර ගැනීම සඳහා අවශ්‍ය නිර්දේශ ලබා දීම ජල සම්පත් මණ්ඩලය මගින් සිදු කරනු ලබයි. මෙම කටයුතු, භූවිද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය, මධ්‍යම පරිසර අධිකාරිය සහ අදාළ අනෙකුත් ආයතන සමග ඒකාබද්ධව සිදු කරනු ලැබේ. 2024 වර්ෂය තුල මෙම ඒකාබද්ධ ක්ෂේත්‍ර පරීක්ෂණ 216ක් සඳහා ජලසම්පත් මණ්ඩලය සහභාගී වී ඇති අතර එම වැඩසටහන් වලදී භූගත ජලය සංරක්ෂණයෙහි ලා අවශ්‍ය නිර්දේශ ලබා දෙන ලදී.

ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශ වල පවතින භූගත ජල ධරයන් ආශ්‍රිතව භූගත ජලයෙහි ප්‍රමාණාත්මක හා ගුණාත්මක භාවයෙහි විචලනයන්මෙන්ම එම ප්‍රදේශ වල භූ ජල විද්‍යාත්මක තත්වයන් අධ්‍යයනය කිරීම සහ සිතියම් ගත කිරීම සඳහා ව්‍යාපෘති කිහිපයක් භාණ්ඩාගාර ප්‍රතිපාදන, ලෝක බැංකු ආධාර සහ UNICEF ආධාර යටතේ සිදු කරගෙන යනු ලැබේ. මෙම පර්යේෂණ හා නිමාන ව්‍යාපෘති හරහා ලබා ගනු ලබන දත්ත සහ තොරතුරු පදනම්ව රටෙහි භූගත ජල සම්පත් නියාමනය, කළමනාකරණය, සංවර්ධනය සහ අනෙකුත් උපාය මාර්ගික ක්‍රියාදාමයන් සැලසුම්කොට සිදු කරගෙන යනු ලබයි.

දැනට ශ්‍රී ලංකාවේ භූ ගත ජලයේ ගුණාත්මක භාවයන් සහ ජල මට්ටම් වල විචලනයන් අධ්‍යයනය කිරීම සඳහා ශ්‍රී ලංකා භූමියෙන් 40% පමණ ප්‍රමාණයක් ආවරණය වන පරිදි නිමාන ස්ථාන 952 කින් යුතු දීර්ඝ කාලීන නිමාන පද්ධතියක් ස්ථාපනය කර ඇත. මෙම දීර්ඝ කාලීන නිමාන පද්ධතීන් මගින් භූගත ජල සම්පතෙහි ගුණාත්මක භාවය සහ භූගත ජල මට්ටම් විචලනය පිළිබඳ තොරතුරු වසරකට දෙවතාවක් (Biannual) අවශ්‍ය ක්ෂේත්‍ර ක්‍රියාකාරකම් සමග රසායනාගාර විශ්ලේෂණ මගින් ලබා ගැනේ.




දීර්ඝ කාලීන භූගත ජල නිමානන ජාලය

2024 වර්ෂයේ දීද අවස්ථා දෙකකදී ජල සාම්පල 1200 විශ්ලේෂණය සිදු කරනු ලැබූ අතර භූගත ජල මට්ටම් විචලනය ඇතුළු ප්‍රදේශයේ භූ ජල විද්‍යාත්මක තත්වයන් පරීක්ෂා කරන ලදී.

මෙම නිමානන පද්ධතිය 2025 අවසන් වන විට 50% ප්‍රමාණය දක්වා පුළුල් කිරීමට කටයුතු සිදු කරන අතර එමගින් භූගත ජල සම්පත් හි හැසිරීම සහ ප්‍රවනතාවයන් අධ්‍යයනය කොට අවශ්‍ය ක්‍රියාමාර්ග වෙත යොමු වීම ආයතනයෙහි ප්‍රධාන දැක්ම ලෙස භූගත ජල සම්පත් නිසි කලමනකරණය සහ නියාමනයෙහි කාර්යක්ෂමතාවය සහ සඵලතාවය වැඩි කර ගැනීමට යොදා ගනු ලබයි.

එසේම අනාගතයේදී රට තුල සිදු කිරීමට අපේක්ෂිත සංවර්ධන ව්‍යාපෘති වලදී වැදගත්ම සාධකය වන ජල අවශ්‍යතාවයන් සඳහා භූගත ජල සම්පත් ආරක්ෂා කර ගැනීම උදෙසා ප්‍රාදේශීය වශයෙන් භූගත ජලයේ පවතින තත්වයන් පදනම්ව කළමනාකරණ නිර්දේශයන් වහා ක්‍රියාත්මක වීම සිදු කෙරේ. (ඇස්තමේන්තුගත වියදම රු.මිලියන 6.0)




බටහිර වෙරල තීරයේ වැලි සහිත ජල ධරය ආශ්‍රිතව භූගත ජල මට්ටම් විචලනය

ශ්‍රී ලංකාවේ පවතින ගංගා ද්‍රෝණි 03ක් සහ භූගත ජලය සඳහා සංවේදී කලාප 02ක් (මල්වතුඔය, මාදුරුඔය, කුඹුක්කන් ඔය, යාපනය සහ පුත්තලම) සඳහා ස්ථාන 190කින් සමන්විත තත්කාලීන දත්ත රැස් කිරීමේ (Real-time data) නිමාන ජාලයන් පිහිටුවා ඇති අතර භූගත ජල මට්ටම, ජලයේ සන්නායකතාවය සහ වර්ෂාපතන (High resolution data) එක් රැස් කරමින් පවතී. මෙමගින් භූගත ජලය අධික ලෙස උකහා ගැනීම් හේතුවෙන් ගුණාත්මක භාවයේ සහ ජල මට්ටම් වල සිදු වන වෙනස් කම් අධ්‍යනය සිදු කරනු ලබයි. එමගින් අදාළ ප්‍රදේශ වල භූගත ජල කළමනාකරණය සහ නියාමනය යන කටයුතු සඳහා අවශ්‍ය තොරතුරු ලබා ගැනීම මූලිකව සිදු කරන අතර රටෙහි භූගත ජල සම්පත් සඳහා අවශ්‍ය ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීමට අවශ්‍ය මූලික තොරතුරු මෙමගින් ලබා දේ.

දැනට ශ්‍රී ලංකාවේ භූ ගත ජලයේ ගුණාත්මක භාවයන් සහ ජල මට්ටම් වල විචලනයන් අධ්‍යයනය කිරීම සඳහා ශ්‍රී ලංකා භූමියෙන් 40% පමණ ප්‍රමාණයක් ආවරණය වන පරිදි නිමාන ස්ථාන 952 කින් යුතු දීර්ඝ කාලින නිමාන පද්ධතියක් ස්ථාපනය කර ඇත. මෙම දීර්ඝ කාලින නිමාන පද්ධතීන් මගින් භූගත ජල

සම්පතෙහි ගුණාත්මක භාවය සහ භූගත ජල මට්ටම් විචලනය පිලිබඳ තොරතුරු වසරකට දෙවතාවක් (Biannual) අවශ්‍ය ක්ෂේත්‍ර ක්‍රියාකාරකම් සමග රසායනාගාර විශ්ලේෂණ මගින් ලබා ගැනේ.




භූගත ජල මට්ටම, විද්‍යුත් සන්නායකතාවය සහ වර්ෂාපතන විචලනය

වර්තමානයේ බහුල වශයෙන් කතා බහට ලක් වී ඇති දේශගුණ සහ කාලගුණ විපර්යාස වල බලපෑම හේතුවෙන් ශ්‍රී ලංකා වෙරල තීරයේ පවතින අධි සංවේදී භූගත ජල ධරයන් වල සිදු වන වෙනස්කම්, තිරසාර ලෙස භූගත ජලය උකහා ගැනීම් හා භූගත ජලය දූෂණය වීම වලක්වා ගනිමින් එම කලාපයේ භූගත ජලය සංරක්ෂණය කිරීම සඳහා වන නිර්දේශ හා කළමනාකරණ ක්‍රියාවලියන්ට අදාළ පර්යේෂණ අධ්‍යයනයන් ශ්‍රී ලංකාවේ මුහුදු තීරය ආවරණය වන පරිදි සිදු කරනු ලබයි. (මෙය තව දුරටත් 2025 වර්ෂය තුලද සිදු කිරීමට නියමිත අතර 2025 වසර සඳහා ඇස්තමේන්තුගත වියදම රු. මිලියන 2.00 වේ.)

භූගත ජල මූලාශ්‍ර මගින් ක්‍රියාත්මක වන අවදානම් මූලාශ්‍ර ලෙස හඳුනාගත් ජල සම්පාදන යෝජනා ක්‍රම තුළ භූගත ජලධරයේ ගුණාත්මකව සහ ප්‍රමාණාත්මකව වැඩිදියුණු කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා නිසි යාන්ත්‍රණයක් සහ කළමනාකරණ සැලැස්මක් හඳුනා ගැනීමේ අරමුණින් 2024 වර්ෂය තුල ව්‍යාපෘතියක් දියත් කරන ලද අතර මූලික අදියරහිදී එය අනුරාධපුර, පුත්තලම සහ මොණරාගල ප්‍රදේශ තුල ක්‍රියාත්මක කරන ලදී. (2025 වර්ෂය තුල තව දුරටත් ක්‍රියාත්මක කිරීමට නියමිත අතර ඒ සඳහා ඇස්තමේන්තුගත මුදල රු.මි. 1.00 වේ.)

භූ ගත ජලය නිසි කළමනාකරණයකින් යුතුව භාවිතා කිරීම සහ සිතියම් ගත කිරීම සඳහා පවත්නා භූ ජල සම්පත් පිළිබඳව සංඛ්‍යාත දත්ත තිබීම ඉතාම වැදගත් වේ. ප්‍රාදේශීය වශයෙන් එම දත්ත ලබා ගැනීම සඳහා වැඩසටහනක් දියත් කරන ලද අතර බහුල ලෙස වාණිජ්‍යමය කටයුතු සඳහා භූගත ජලය උකහා ගන්නා ප්‍රදේශ වන බස්නාහිර සහ වයඹ පළාත් තුල මෙය ක්‍රියාත්මක කරන ලදී. (2025 වර්ෂය තුලද මෙය තවදුරටත් ක්‍රියාත්මක කිරීමට නියමිත අතර ඒ සඳහා ඇස්තමේන්තුගත් මුදල රු.මි. 8.4 වේ.)

**2024** වර්ෂයේදී ජල අංශයට අදාල හදිසි ආපදා තත්ත්ව සඳහා (නියඟ, ගංවතුර, භූ ගත ජලය දූෂණය වීම ආදී,) ක්‍රියාත්මක වීම වශයෙන්, හඳුනාගත් විපතට පත් ප්‍රදේශවල ප්‍රජාවගේ අවශ්‍යතා අනුව භූගත ජල ගවේෂණය, නළ ළිං ඉදිකිරීම සහ ජල ධාරිතා පරීක්ෂණ පැවැත්වීම සිදු කරන ලදී. 2024 දී මෙම ව්‍යාපෘතිය යටතේ පානීය ජලය පිළිබඳව ගැටළු පවතින ස්ථාන 13ක් සඳහා විසඳුම් ලබා දී ඇත. තවද මෙම ව්‍යාපෘතියේ ජලයේ ගුණාත්මකභාවයන් අධ්‍යනය කර සංවේදී මූලාශ්‍රයන් හඳුනාගැනීම සඳහා අදියර වශයෙන් අධ්‍යන ව්‍යාපෘතියක් ලෙස තව දුරටත්2025 වර්ෂය තුල සිදුකිරීමට සැලසුම් කර ඇති අතර එමගින් ප්‍රාදේශීය ජනතාවගේ හා සංවර්ධන ක්‍රියාවලියේදී අවශ්‍යතාවය පරිදි සංවේදී මූලාශ්‍රයන් හඳුනාගැනීම සිදුකල හැකි අතර එමගින් අදාල ප්‍රදේශයන් සඳහා කළමනාකරණ සැලැස්මක් මගින් සංරක්ෂණ කිරීම සිදුකල හැකි වේ.(2025 සඳහා ඇස්තමේන්තුගත වියදම රු මිලියන 4.00)

රටෙහි පාරිසරික සහ සමාජීය ජල අවශ්‍යතා තුලය සඳහා ඉතාමත් වැදගත් මෙහෙවරක් සිදු වන ජල උල්පත් පිළිබඳව ප්‍රමාණවත් අධ්‍යයනයක් මේ වන තෙක් සිදු වී නොමැති අතර ඒවා ක්‍රමානුකූලව සිතියම්ගත කිරීමක්ද සිදු වී නොමැත. එම නිසා 2025 වර්ෂය තුල ශ්‍රී ලංකාවේ ස්වභාවික ජල

උල්පත් සිතියම්ගත කිරීම සඳහා රු. මි. 1.4 ක් වෙන් කර ඇති අතර එමගින් එම භූගත ජල මූලාශ්‍ර සංරක්ෂණය හා ආරක්ෂා කිරීම දිගු කාලීනව සැලසුම් කෙරේ.

ශ්‍රී ලංකාවේ සියළුම ජල මූලාශ්‍ර අධ්‍යනය කිරීම යටතේ රටේ පවතින මතුපිට ජල මූලාශ්‍රවල (Surface Water body) ජලයේ ගුණාත්මකභාවයන් අධ්‍යනය කර සංවේදී මූලාශ්‍රයන් හඳුනාගැනීම සඳහා අදියර වශයෙන් අධ්‍යයන ව්‍යාපෘතියක් සිදුකිරීමට සැලසුම් කර ඇති අතර එමගින් ප්‍රාදේශීය ජනතාවගේ හා සංවර්ධන ක්‍රියාවලියේදී අවශ්‍යතාවය පරිදි අදාල ප්‍රදේශයන් සඳහා නිසි කළමනාකරණ සැලැස්මක් මගින් සංරක්ෂණ කිරීම සිදුකල හැකි සේම හදිසි තත්වයකදී ජල මූලශ්‍රයන්ට සිදුවන ගැටලුකාරී තත්වයකදී නිසි විසඳුම් සහ ක්‍රමෝපායන් සැලසුම් කරගැනීම වැදගත් වේ. (2025 සඳහා ඇස්තමේන්තුගත වියදම රු.මිලියන 4.00).

භූගත ජල නියාමන කටයුතු හා කළමනාකරණය සඳහා අවශ්‍ය තොරතුරු සම්පාදනය කරගැනීම මෙන්ම දිවයිනේ පානීය, කෘෂිකාර්මික, කාර්මික සහ සියලුම ජල අවශ්‍යතා සහ ජල හිඟයන් නිසා ඇති වන ආපදා අවස්ථාවන්ට අවශ්‍ය භූගත ජල ප්‍රභව හඳුන්වාදීම, ස්වභාවික උල්පත් පිළිබඳව තසේරුවක් සිදුකිරීම හා සිතියම්ගත කිරීම, භූගත ජලය උකහාගන්නා ස්ථාන ප්‍රතිආරෝපනය කිරීම (Groundwater Recharge), කැනීම් හා වෙනත් භූ ගත ජලයට බලපෑමක් ඇතිවිය හැකි ව්‍යාපෘති සඳහා නිර්දේශ ලබාදීම හා භූගත ජල සම්පත් කළමනාකරණ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා පර්යේෂණ අධ්‍යනයන් සිදු කිරීම මගින් භූගත ජල සම්පත් උකහා ගැනීම නියාමනය, පාලනය සහ කළමනාකරණය කිරීම රටේ පරිසර සමතුලිතතාවය රැකගනිමින් භූගත ජලයේ තිරසාර සංවර්ධනය සඳහා අවශ්‍ය සැලසුම් සකස් කිරීම සඳහා 2025 වර්ෂය සඳහා ලෝක බැංකු අරමුදල් යටතේ ප්‍රතිපාදන රු.මිලියන 170 ක් (ක්ෂේත්‍ර ක්‍රියාකාරකම්, භූ විද්‍යාත්මක උපකරණ සහ ආයතනික යටිතල පහසුකම් ඉහළ නැංවීම සඳහා) වෙන් කර ඇත.

මීට අමතරව 2024 වර්ෂය තුලදී භූගත ජල නියාමන කටයුතු සහ ඒ සඳහා අවශ්‍ය සේවාවන් ලෙස භූ ජල විද්‍යා සමීක්ෂණ සිදු කිරීම, භූගත ජලයට ඇති විය හැකි බලපෑම් පිළිබඳ අධ්‍යයන වාර්තා ලබා දීම, ජල ධාරිතා පරීක්ෂණ සහ නළ ළිං ඉදි කිරීම ආදී කටයුතු සිදු කරන ලද අතර එමගින් රු.මි. 90 ක පමණ අදායමක් ලබා ගන්නා ලදී. 2025 වර්ෂයේදී මෙම කටයුතු මගින් උපයා ගැනීමට ඇස්තමේන්තු කර ඇති මුදල රු.මි. 90 පමණ වේ.

2024 වර්ෂය සඳහා භාණ්ඩාගාර අරමුදල්වලින් පර්යේෂණ අධ්‍යයන සඳහා වෙන්වූ අයවැය මූලා ප්‍රතිපාදනය මිලියන 15 ක් වූ අතර, එයින් මිලියන 12.97 ක් අපේක්ෂිත ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලදී. තෝරාගත් ගංගා ද්‍රෝණිවල භූගත ජල කළමනාකරණය සඳහා භූගත ජල සම්පත් නැවත ආරෝපණය කිරීමේ නියමු අධ්‍යයනය සහ සවිබල ගැන්වීමේ ක්‍රියාකාරකම් සඳහා යුනිසෙෆ් (ජල සම්පාදන අමාත්‍යාංශය හරහා) සහ ලෝක බැංකුව විසින් 2024 වර්ෂය සඳහා පිළිවෙලින් මිලියන 2.5 සහ මිලියන 60.21 ක අරමුදල් සපයන ලද අතර එහිදී මූල්‍යමය වශයෙන් 100% සහ 22.6%ක ප්‍රගතියක් ලහා කර ගන්නා ලදී. භූගත ජල කළමනාකරණය ට අදාළ රෙගුලාසි සහ රෙගුලාසි ආශ්‍රිත සේවා ක්‍රියාකාරකම් මගින් ජනනය කරන ලද වාර්ෂික ආදායම මිලියන 93.22 ක් වූ අතර එය 2024 වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ඉලක්කය වූ මිලියන 109.28 න් 85% ක ප්‍රගතියක් වේ.

**ආදායම් උත්පාදන ප්‍රගතිය -2024**

| වාර්ෂික ආදායම් ඉලක්කය 2024 (රු.මි) | **2024.12.31** දිනට ප්‍රගතිය | |
|---|---|---|
| | ආදායම (රු.මි) | වාර්ෂික % |
| 117.80 | 93.20 | 79% |

## 2.7 වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වූ ආයතන වල ප්‍රගතිය

### 2.7. 1 වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අංශය

### 2.7.2 වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව

### 2.7.3 වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

### 2.7.4 ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව

### 2.7.5 රාජ්‍ය දැව සංස්ථාව

## 2.7.1 වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අංශය

### 1.1. හැඳින්වීම

2024.09.27 දිනැති අංක 2403/53 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් එවකට වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය යටතේ පැවති වනජීවී සංරක්ෂණ, වන සංරක්ෂණ, ජාතික සත්වෝද්‍යාන යන දෙපාර්තමේන්තු ද රාජ්‍ය දැව සංස්ථාව ද පරිසර, වනජීවී, වන සම්පත්, ජල සම්පාදන, වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය යටතට ඇතුලත් කරන ලදී.

ඉන්පසු 2024.11.25 දිනැති අංක 2412/08 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් විෂයයන් බෙදා වෙන් කිරීමේ දී වනජීවී සංරක්ෂණ, වන සංරක්ෂණ, ජාතික සත්වෝද්‍යාන යන දෙපාර්තමේන්තු ද රාජ්‍ය දැව සංස්ථාව ද පරිසර අමාත්‍යාංශය යටතට ඇතුලත් කරන ලදී. එවකට පැවති වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය මගින් වනජීවී ආරක්ෂණ හා වන සංරක්ෂණය සඳහා අදාළ ප්‍රතිපත්ති, අණපනත් වලට අනුකූලව මිහිතලයට වඩාත් සංවේදී වන ගහකොළ සතා සිව්පාවා ආරක්ෂා කිරීමේ වගකීම ද ජෛව විවිධත්වය හා වන සම්පත රැක ගැනීමට අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මග පෙන්වීම ලබාදීම ද සිදුකරනු ලැබිණ. එසේම, රාජ්‍ය දැව සංස්ථාව මගින් ජාතියේ විශ්වසනීයත්වය දිනූ අනර්ඝතම දැව හා දැවමය භාණ්ඩ සැපයුම්කරු බවට පත්වීමට අවශ්‍ය නායකත්වය සැපයීමද සිදු කෙරිණි.

### 1.2 එක් එක් අංශ වල කාර්යභාරය හා ප්‍රගතිය

### 1.2.1 පාලන අංශය

| | විෂයය | ප්‍රගතිය |
|---|---|---|
| 01 | පෞද්ගලික ලිපි ගොනු | • නිලධාරීන් 79 ක් සඳහා වැටුප් වර්ධක ගෙවීම<br>• නිලධාරීන් 06 ක් විශ්‍රාම ගැන්වීම |
| 02 | නිවාඩු | • ස්ථානමාරු වී ගිය නිලධාරීන් 17 කුගේ පෞද්ගලික ලිපිගොනු හා නිවාඩු වාර්තා අදාළ දෙපාර්තමේන්තු වෙත යැවීම හා නිවාඩු ලේඛනය යාවත්කාලීන කිරීම |
| 03 | දුම්රිය වාර ප්‍රවේශ පත්‍ර, නිවාඩු දුම්රිය බලපත්‍ර | • නිලධාරීන් 07 ක් සඳහා ත්‍රෛමාසිකවද නිලධාරීන් 04 ක් සඳහා මාසිකව ද දුම්රිය වාර ප්‍රවේශපත්‍ර යවා ඇත.<br>• නිවාඩු දුම්රිය බලපත්‍ර කට්ටල 48 ක් නිකුත් කිරීම |
| 04 | ප්‍රවාහන කටයුතු | • වාහන 24 කට ඉදිරි වර්ෂය සඳහා රක්ෂණ ආවරණ ලබාගැනීම.<br>• වාහන 25 කට අදාලව සේවා 33 ක් සිදු කිරීම,වාහන 27 කට අලුත්වැඩියාවන් 57 ක් සිදු කිරීම |
| 05 | වැටුප් රහිත දේශීය/විදේශ නිවාඩු | • නිලධාරීන් 02 ක් සඳහා දේශීය නිවාඩු ද නිලධාරීන් 05 ක් සඳහා විදේශීය නිවාඩු ද අනුමත කර ඇත. |
| 06 | පාර්ලිමේන්තු ප්‍රශ්න හා අමාත්‍ය මණ්ඩල සංදේශ | • පාර්ලිමේන්තු ප්‍රශ්න 05 ක් සඳහා පිළිතුරු ලබා දීම හා අමාත්‍ය මණ්ඩල සංදේශ 16 ක් අමාත්‍ය මණ්ඩල කාර්යාලයට යොමු කිරීම |
| 07 | විගණන විමසුම් සඳහා පිළිතුරු ලබා දීම | • විගණන විමසුම් 04 ක් සඳහා පිළිතුරු ලබා දීම |
| 08 | තොරතුරු දැනගැනීමේ පනත | • ඉල්ලීම් 25 කට පිළිතුරු ලබා දී ඇත. |
| 09 | කාර්ය මණ්ඩල තොරතුරු හා බඳවා ගැනීම් | • රාජ්‍ය හා අර්ධ රාජ්‍ය සේවයේ සංගණන තොරතුරු අදාළ ආයතන වෙත යොමු කිරීම<br>• කාර්ය මණ්ඩල තොරතුරු යාවත්කාලීන කිරීම<br>• බදුකාර්ය සංවර්ධන සහායකයින් අමාත්‍යාංශයේ රියදුරු සහයකයින් ලෙස බඳවා ගැනීම |
| 10 | දේශීය විදේශීය පුහුණු | •නිලධාරීන් 114 ක් සඳහා දේශීය, අභ්‍යන්තර හා බැහැරගත පුහුණු වැඩසටහන් පැවැත්වීම<br>•අමාත්‍යාංශයේ නිලධාරීන් 08 ක් සඳහා විදේශ පුහුණු ලබා දිම. |

| | විෂයය | ප්‍රගතිය |
|---|---|---|
| 11 | මහජන පැමිණිලි | ●මහජනතාව, ජනාධිපති ලේකම් කාර්යාලය හා අග්‍රාමාත්‍ය ලේකම් කාර්යාලය වෙතින් අමාත්‍යාංශයට ලැබී ඇති පැමිණිලි දෙපාර්තමේන්තු වලට යොමු කිරීම.<br>●අමාත්‍ය කාර්යාලය, රා.සේ.කො., මානව හිමිකම් කොමිෂන් සභාව හා අල්ලස් දූෂණ චෝදනා කොමිෂන් සභාව හරහා ලැබී ඇති පැමිණිලි දෙපාර්තමේන්තු වලට යොමු කිරීම. |
